## 01.සභාපතිතුමා විසින් කෙරෙන විශේෂ නිවේදන.

සභාපතිතුමා:- සුභ උදෑසනක්. ගරු ප්‍රධාන අමාත්‍යතුමා ඇතුළු අමාත්‍යතුමන්ලා, ගරු මන්ත්‍රීතුමන්ලා සියළු දෙනාම ඉතාමත් ගෞරවයෙන් යුක්තව මේ අවස්ථාවේදී පිළිගනු ලබනවා. විශේෂ නිවේදන නැහැ. මීළඟට නිවාඩු යෝජනා.

## 02.මන්ත්‍රීවරුන්ගේ නිවාඩු යෝජනා.

අජිත් රාජපක්ෂ මහතා(ආණ්ඩු පක්ෂ සංවිධායක):- ගරු සභාපතිතුමනි, සිංහ සමන් කුමාර මන්ත්‍රීතුමාට නිවාඩු යෝජනා කරනවා.

සභාපතිතුමා:- ආරියතිලක ඇමතිතුමා නිවාඩු ඉල්ලලා දුරකතන ඇමතිතුමක් දුන්නා.

අශෝක ධනවංශ ද සිල්වා මහතා(විපක්ෂ සංවිධායක):- ගරු සභාපතිතුමනි, විපක්ෂනායක, තෙන්නකෝන් නිලමේ මැතිතුමාට නිවාඩු අනුමත කරන ලෙස යෝජනා කරනවා.

අජිත් රාජපක්ෂ මහතා(ආණ්ඩු පක්ෂ සංවිධායක):- ගරු සභාපතිතුමනි, ඒ වගේම විදේශ ගතවීමට මන්ත්‍රීවරු කීප දෙනෙක් අත්සන් කරලා ලැබෙන්න ඇති කියලා හිතනවා. විදේශ ගතවීමට නිවාඩු ඉල්ලා ලියුමක් තියෙනවා.

සභාපතිතුමා:- නම් ටික කියවන්න.

අජිත් රාජපක්ෂ මහතා(ආණ්ඩු පක්ෂ සංවිධායක):- මම නම් ටික කියවන්නම්. ගරු අමාත්‍ය, මනෝජ් සිරිසේන මැතිතුමා, ඒ වගේම සභාපති කේ.ඒ. සෝමවංශ මැතිතුමා, ගරු උප සභාපති, සම්පත් අතුකෝරල මැතිතුමා, අජිත් රාජපක්ෂ ගරු මන්ත්‍රීතුමා, වීරසුමන වීරසිංහ ගරු මන්ත්‍රීතුමා, එච්.ඒ. පියසේන ගරු මන්ත්‍රීතුමා, සිංහ සමන් කුමාර ගරු මන්ත්‍රීතුමා, ක්‍රිෂාන්ත පුෂ්පකුමාර ගරු මන්ත්‍රීතුමා, එම්.කේ. කසුන් ගරු මන්ත්‍රීතුමා, ඉසුරු දොඩංගොඩ ගරු මන්ත්‍රීතුමා,චන්දන ප්‍රියන්ත ගරු මන්ත්‍රීතුමා, චතුර ගලප්පත්ති ගරු මන්ත්‍රීතුමා, ජයසිරි නානායක්කාර ගරු මන්ත්‍රීතුමා, ටී.වී.කේ.ගාමිණී ගරු මන්ත්‍රීතුමන්ලාට නිවාඩු යෝජනා කරනවා, විදේශ ගතවීම සඳහා. 23 දින සිට 01 වෙනිදා වෙනකම්.

සභාපතිතුමා:- ස්ථිර කරන්න, ගරු සභානායකතුමා.

චමිලි විතානාච්චි මහතා(සභානායක):- ගරු සභාපතිතුමනි, එම නිවාඩු යෝජනා ස්ථිර කරනු ලබනවා.

සභාපතිතුමා:- මහජන පෙත්සම් කාරක සභාව සඳහා ඉදිරිපත් කරන ලිපි. ගරු විපක්ෂයේ ප්‍රධාන සංවිධායක අශෝක ධනවංශ ද සිල්වා මැතිතුමා.

## 03.මහජන පෙත්සම් කාරක සභාව සඳහා ඉදිරිපත් කරන ලිපි.

අශෝක ධනවංශ ද සිල්වා මහතා(විපක්ෂ සංවිධායක):- ගරු සභාපතිතුමනි, අම්බලන්ගොඩ, මහ අම්බලන්ගොඩ, අංක:109/2 හි පදිංචි, ආර්.එම්. නලින්ද මහත්මා විසින් එතුමාගේ නිවසට ප්‍රවේශ වෙන මාගර්ය අවහිර කිරීම සම්බන්ධයෙන් වූ පෙත්සම පෙත්සම් කාරක සභාව වෙත පිළිගන්වනවා.

සභාපතිතුමා:- ගරු චන්දන ප්‍රියන්ත මන්ත්‍රීතුමා.

අශෝක ධනවංශ ද සිල්වා මහතා(විපක්ෂ සංවිධායක):- ගරු සභාපතිතුමනි, චන්දන ප්‍රියන්ත මන්ත්‍රීතුමා වෙනුවෙන් මම මේ පෙත්සම පෙත්සම් කාරක සභාවට ඉදිරිපත් කරනවා. යටියන, අක්කර 50, "උදය" නිවසේ පදිංචි, ඇම්.ජී. පියසේන මහත්මා විසින් අක්කර 20 නමැති ඉඩමේ පදිංචිවීමේ අයිතිය ඉල්ලමින් ඉදිරිපත් කරන පෙත්සම පෙත්සම් කාරක සභාවට ඉදිරිපත් කරනවා.

සභාපතිතුමා:- ගරු නලින් හේවගේ මන්ත්‍රීතුමා.

නලින් හේවගේ මහතා:- ගරු සභාපතිතුමනි, මිලිද්දුව, හේලි පාර, 2/4 ඒ, හි පදිංචි, අනුර වික්‍රම ධමර්වධර්න මහතා විසින් ඉදිරිපත් කරන ලද පෙත්සම පෙත්සම් කාරක සභාව සඳහා ඉදිරිපත් කරනවා.

සභාපතිතුමා:- ඉදිරිපත් කරන ලද පෙත්සම් අදාළ අමාත්‍යාංශවලට ඉදිරිපත් කරලා ඒවා පිළිතුරු ලැබුණයින් පස්සෙ ඒවා පෙත්සම් කාරක සභාවේ විමෂර්ණය සඳහා ඉදිරිපත් කරනවා. මීළඟට ලිපි සහ වාතර්ා ඉදිරිපත් කිරීම.

සිසිර කුමාර වාහලතන්ත්‍රි මහතා:- ගරු සභාපතිතුමනි, අම්බලන්තොට, මාමඩල, කේ.වී. රජීව රත්නප්‍රිය විසින් ඉදිරිපත් කර ඇති ඉඩම් සම්බන්ධව ඇතිවී ඇති ගැටළුවකට පෙත්සම් කාරක සභාව සඳහා මෙය යොමු කරනවා.

ලාල් ප්‍රේමනාත් මහතා:- ගරු සභාපතිතුමනි, ගරු අධ්‍යාපන ඇමතිතුමාගේ අවධානය පිණිස, දෙයියන්දර, කැටියපේ, ගුරුවල,පල්ලෙහා වත්ත, පී.එල්.එස්. ප්‍රියංගනී මහත්මිය විසින් ඉදිරිපත් කරන ලිපියක් අකුරැස්ස, මලිදූව, රිදීගල විද්‍යාලය ඉදිරිපත් කරන ලිපියත්, එළමල්දෙණිය කනිටු විදුහලේ දෙමව්පියන් විසින් ඉදිරිපත් කරන ලිපියක් සභාගත කරනවා. බොහොම ස්තුතියි.

විජය එස්. වීරසිංහ මහතා:- ගරු සභාපතිතුමනි, සී/ස ගෝදාව, සමිතිය විසින් ඉදිරිපත් කරන ලද මිලදී ගත් ඉඩම සහ පවතින ගොඩනැගිල්ලේ භුක්තිය ලබාගැනීම කියන ලිපිය මම සභාගත කරනවා ගරු සමුපකාර ඇමතිතුමාගේ අවධානයට. ඒ සඳහා කඩිනමින් අවසර ලබාදෙන්න කියන ගෞරවනීය ඉල්ලීමත් කර සිටිනවා.

ටී.වී.කේ. ගාමිණී මහතා:- ගරු සභාපතිතුමනි, බුද්ධදාස අන්දරවීර, තුනේ කණුව, මාමඩල, අම්බලන්තොට. මාමඩල පාසැලේ හරස් මාගර්යේ විදුලිය නොමැති කමින් යන සදාචාරාත්මක වැඩ සිදුවෙනවා කියලා ගම්වාසීන් ඉදිරිපත් කරලා තියෙනවා. එක් කණුවක් ලබාදීලා ලයිට් එකක් ලබාදෙන්න කියලා ඒක සභාගත කරනවා සභාපතිතුමනි. ඒ වගේම අම්බලන්තොට ප්‍රාදේශීය බල ප්‍රදේශය තුළ දැන්වීම් පුවරු සඳහා ගාස්තු අය කිරීමක් සූදානම් වෙලා තියෙනවා, අම්බලන්තොට ප්‍රාදේශීය සභාව විසින්. අම්බලන්තොට ප්‍රාදේශීය බල ප්‍රදේශය අධර් නාගරික ප්‍රදේශයක්. ඒ නිසා මේ සම්බන්ධයෙන් වෙළඳ සංගමයේ ලිපියක් ඉදිරිපත් කරලා තියෙනවා ගරු ප්‍රධාන අමාත්‍යතුමා වෙතට. ඒක ඉදිරිපත් කරනවා. සභාගත කරනවා. විශාල මගී ජනතාවක් භාවිතා කරන අම්බලන්තොට ගොඩ කොග්ගල්ල මහඇල කණ්ඩිය දක්වා බස්රථයක් ලබාගැනීම සඳහා ඉල්ලීමක් ගම්වාසීන් ඉදිරිපත් කරලා තියෙනවා. ප්‍රධාන අමාත්‍යතුමා වෙත ඉදිරිපත් කරනවා. තංගල්ල, කදුරුපොකුණ, ප්‍රාථමික විද්‍යාලයේ අඩුපාඩු කීපයක් සඳහන් කරලා තියෙනවා. ගරු අධ්‍යාපන අමාත්‍යතුමා වෙත ලිපියක් ඉදිරිපත් කරනවා. ඒ වගේම අම්බලන්තොට මහ විදුහලේ ප්‍රධාන ශාලාවේ පවත්නා අඩුපාඩු සම්බන්ධව ඉල්ලීමක් තියෙනවා පාසලේ දෙමව්පියන්ගෙන්. සභාගත කරනවා අධ්‍යාපන ඇමතිතුමාගේ අවධානය පිණිස. ඒ වගේම අබලන්ව පවතින 19/1 ඩී.01 කණුව, ප්‍රධාන මාගර්යේ ඉදිරි කොටස ප්‍රතිසංස්කරණය කරන ලබාදෙන ලෙස ගරු අධ්‍යාපන ඇමතිතුමාට යොමු කරනවා ලිපියක්. බොහොම ස්තුතියි.

ජයන්ත පතිරණ මහතා:-ගරු සභාපතිතුමනි, යටියන, කටුවැනිගොඩ විහාරාධිපති, චන්ද්‍රානන්ද හිමියන් විසින් ධමර් ශාලාව ඉදිකර ගැනීම සඳහා ඉදිරිපත් කර ඇති ලිපියක් ගරු සංස්කෘතික ඇමතිතුමාගේ අවධානය සඳහා යොමු කරනවා.

පී.එච්.එන්. ලාල්චන්ද්‍ර මහතා:- ගරු සභාපතිතුමනි, ගරු අධ්‍යාපන ඇමතිතුමාගේ අවධානයට දෙමව්පියන් විසින් ඉදිරිපත් කර ඇති තිස්ස, ලුණුගම්වෙහෙර, කොට්ඨාශ දෙකේම පාසැල් කීපයකම ගුරුවරු හිඟතාවය නිසා සමහර පන්ති කරගෙන යාමට නොහැකි තත්ත්වයක් තියෙනවා. ගරු ඇමතිතුමාගෙනුත් දැන ගන්න කැමතියි උත්තරයක් දෙන්න ළඟදීම ඒ ප්‍රශ්නය විසඳෙනවද කියලා.

චන්දිමා රාසපුත්‍ර මහතා(අමාත්‍ය):- මේ වනකොටත් තාවකාලිකව විසඳිලා තියෙන්න ඕන. සමහර විෂයන් කීපයකට ප්‍රශ්නයක් වෙන්න පුළුවන්. උපාධිධාරීන් බඳවා ගැනීම ප්‍රමාද වුණා. ප්‍රමාද වුණේ මැතිවරණය ප්‍රකාශ කිරීමත් එක්ක අපි දැන්වීම නැවැත්වූවා.මාසයක් විතර පරක්කු වුණා. ඊට පස්සෙ විභාග තියන්න විභාග දෙපාතර්මේන්තුවට පොරොන්දු වෙච්ච ආකාරයට කරන්න බැරුව දැන් නැවත වරක් විභාගය වෙනත් ආකාරයකට තියන්න කටයුතු කරගෙන යනවා. හැබැයි මේ වෙනකොට ප්‍රාථමික, හම්බන්තොට කලාපයේ විශේෂයෙන්ම ප්‍රාථමික සිංහල කියන ගැටළුව තාවකාලිකව විසඳිලා තියෙන්නෙ. උපාධිධාරීන්ම ඒ වගේම පළවෙනි පන්තියේ සමාථර්යන්, දෙවැනි පන්තියේ සමාථර්යන් තියෙන අය ඒක ආවරණය කරනවා. ඒ වගේම විද්‍යා විෂය, ගණිත විෂය තාම යොමුකරලා නැතුව ඇති. එහෙම තියෙනවා නම්. හැබැයි විශාල ප්‍රශ්න බවට පත්වෙන එකක් නැහැ. මොකද විෂය යම්කිසි ආකාරයකට ආවරණය කරගන්න බැරිවුණා නම් සුමාන කීපයක් ඒක ආවරණය කරන්න අවශ්‍ය විධිවිධාන යොදයි. ගරු මන්ත්‍රීතුමා, කොහොමත් තව සති කීපයක් යනකොට සාමාන්‍ය අතට හැරෙයි. විෂයයන් එකක් හැරුනම අනිත් විෂයයන් සාමාන්‍ය මට්ටමට හැරෙයි.

නලින් හේවගේ මහතා:- ගරු සභාපතිතුමනි, ගාල්ල, වක්වැල්ල පාර, නො:289/2, ඒ.කේ. චන්ද්‍රසිරි මහතා විසින් ඉදිරිපත් කරන ලද ගාල්ල මහ නගර

සභාවෙන් සිදුවූ අකටයුත්තක් සම්බන්ධයෙන් අදාළ ලිපිය ගරු ප්‍රධාන අමාත්‍යතුමාගේ අවධානය සඳහා සභාගත කරනවා.

සභාපතිතුමා:- ලිපියක් ඉදිරිපත් කරලා තියෙනවා මේ අධ්‍යාපන කලාප කායර්ාලයේ තංගල්ල කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ මිත්‍රපාල මහතාගේ සේවා දිගුවක් ලබාදීම ගරු ඇමතිතුමාට පුළුවන්ද? සේවා දිගුවක්. විශ්‍රාම යනවා මේ 27. ලිපියක් ඉදිරිපත් කරලා තියෙනවා. මිත්‍රපාල කලාප අධ්‍යක්ෂ.

චන්දිමා රාසපුත්‍ර මහතා(අමාත්‍ය):- සභාවට ඉදිරිපත් කරන්න බැහැනේ. සාමාන්‍යයෙන් ඉදිරිපත් කරන්නෙ නැහැ.

සභාපතිතුමා:- ලිපියක් එවලා තියෙන්නෙ.

චන්දිමා රාසපුත්‍ර මහතා(අමාත්‍ය):- ගරු සභාපතිතුමනි, අපට යොමු කරන්න. හැබැයි දික් කරන එක කලාතුරකින් තමයි සිදුවෙන්නෙ. පහුගිය කාලෙ කරන්න බැරිවුණා. ඉදිරිපත් කරන්න, ගැටළුවක් නැහැ. ඔබතුමාට කියපු පළවෙනි අවස්ථාව තමයි. සභාපතිතුමාට ඉදිරිපත් කරලා තියෙනවා. ඒකයි.

සභාපතිතුමා:- එවලා තියෙන්නෙ මට.

චන්දිමා රාසපුත්‍ර මහතා(අමාත්‍ය):- සාමාන්‍යයෙන් එහෙම වෙලා නැහැ.

සභාපතිතුමා:- එයා නෙවෙයි එවලා තියෙන්නෙ. විදුහල්පතිවරුන්ගේ අත්සන් තියෙනවා ගොඩක්. 94 ක් තියෙනවා අත්සන්. මීළඟට අමාත්‍යවරුන්ගේ ප්‍රකාශයන්. අපේ ක්‍රීඩා අමාත්‍යතුමා ඉල්ලීමක් කළා.

## <u>04.අමාත්‍යවරුන්ගේ ප්‍රකාශයන්.</u>

මනෝජ් සිරිසේන මහතා(අමාත්‍ය):- ගරු සභාපතිතුමනි බොහොම ස්තුතියි. අද දවසේ ජාතික පුවත්පතක අතිරේකයක ප්‍රධාන වාතර්ාවක් ලෙස පලවෙනවා.ගුණාත්මක බවින් අඩු භාණ්ඩ වැඩි මිලට ගෙන දකුණු පළාත් සංස්කෘතික හා කලා කටයුතු අමාත්‍යාංශය රුපියල් 147,000/- ක් කාලා කියලා. විගණන වාතර්ාවකින් හෙළිවෙයි කියලා මේකෙ කියන්නෙ. මේ වාතර්ාවේ කියන ආකාරයට ගරු සභාපතිතුමනි, මේ සිදුවීම සිදුවෙලා තියෙන්නෙ 2017 පෙබරවාරි මාසෙ තමයි මෙම භාණ්ඩ මිලදීගෙන තියෙනවා කියන කාරණාව වාතර්ා වෙලා තියෙන්නෙ. මෙතනත් යම්කිසි වැරැද්දක් තියෙනවා. මා අපේ අමාත්‍යාංශයේ ලේකම්තුමා ප්‍රමුඛ නිලධාරීන් සමඟ සාකච්ඡා කළාම මේ සිදුවීම සිදුවෙලා තියෙන්නෙ 2016 වසරේ තමයි මිලදී ගැනීම වෙලා තියෙන්නෙ. මිලදී ගැනීම සිදුකරලා මේක බෙදාදීමේ යම්කිසි ප්‍රමාදයක් වෙලා තියෙනවා.මේ වකවානුවේ මම අමාත්‍යවරයා නෙවෙයි. වතර්මාන ලේකම්තුමා ලේකම්වරයාත් නෙවෙයි. මේක බැලුවම අපට මේකෙන් බරපතල ලෙස අමාත්‍යාංශයට අසාධාරණයක් වෙලා තියෙනවා කියලා මම විශ්වාස කරනවා. ඒ වගේම තමයි ගරු සභාපතිතුමනි, හිටපු ඇමතිතුමාත් වීරසුමන වීරසිංහ මැතිතුමා එවකට අමාත්‍යවරයා වශයෙන් හිටියා. එතුමා අපි විශ්වාස කරනවා ඉතාමත්ම වැදගත් වැඩසටහන් විශාල ප්‍රමාණයක් අමාත්‍යාංශය වෙනුවෙන් ක්‍රියාත්මක කරපු අමාත්‍යවරයෙක් විදියට මම හිතන්නෙ අපි කාගෙත් වගකීමක් තියෙනවා මේ සම්බන්ධයෙන් ගරු ප්‍රධාන අමාත්‍යතුමාගෙනුත් ඉල්ලීමක් කරනවා. ඒ වගේම මාධ්‍යවේදී මහත්වරුන්ගෙනුත් ඉල්ලීමක් කරනවා විශේෂයෙන්ම ඉතාමත් ගෞරවයෙන් ඉල්ලා සිටිනවා මේ කාරණාව අපට සාකච්ඡා කරන්න අවස්ථාවක් දෙන්න අද දවසේ, එතකොට මේක කොහොමද වුණේ, මොකක්ද වුණේ, වැරැද්දක් වෙලා තියෙනවා නම් ගරු සභාපතිතුමනි, අපි පෙනී සිටින්නෙත් අවංකභාවය, නිවැරදි දේ සහ දූෂණය සහ වංචාව නාස්තියට එරෙහි දේශපාලනයක් තමයි අපි බහුතරයක් අපි පළාත් සභාව තුළ ක්‍රියාත්මක කරන්න බලාපොරොත්තු වෙනවා. බහුතරයක් කියන්නෙ අති බහුතරයක්. ඒ නිසා ගරු සභාපතිතුමනි, මේ ආකාරයට. හැබැයි ගරු සභාපතිතුමනි, අපි පහුගිය වසරේ නම් හොඳ වැඩ කළා. අපි ලේඛකාධාර වැඩිකළා, ඒ වගේම කලායතනවලට දෙන භාන්ඩ සම්බන්ධයෙන් නම් අපි ගිය අවුරුද්දේ කළේ වෙනස් ක්‍රමවේදයක්. අපි මුදල් ලබාදුන්නා රුපියල් 30,000/- බැගින් දකුණු පළාතේ කලායතන 110 කට පමණ ප්‍රාදේශීය ලේකම් කායර්ාල හරහා භාණ්ඩ ලබාගන්න. මේ සමහරක් වෙලාවට අපි දන්නෙ නැහැ පුද්ගලයො මේ සම්බන්ධයෙන් ක්‍රියාත්මක වෙන පිරිස් ඉන්නවා. ඉන්න පුළුවන්. යම් යම් වැරදි වෙන්න පුළුවන්. මූල්‍ය අක්‍රමිකතා වෙන්න පුළුවන්. ප්‍රාදේශීය සභාවලට දුන්නත් අමාත්‍යාංශයෙන් බඩු අරගෙන අමාත්‍යාංශය මඟින් බෙදාදීම කළත් යම්කිසි වැරැද්දක් තියෙනවා නම් මම ඔබතුමාගෙන් ඉතාමත්ම ගෞරවයෙන් ඉල්ලා සිටිනවා මේක අදාළ අංශවලට යොමුකරලා ඒ අදාළ අංශවලිනුත් පරීක්ෂණයක් තියන්න. තියලා ඒ හිටපු අමාත්‍යවරු

ගෞරවනීය විදියට කරපු සේවයක් තියෙනවා. නිලධාරීන් පැහැදිලි ලෙස කරපු අවංක සේවයක් තියෙනවා. ඒ නිරවද්‍යාභාවය තහවුරු කරන්න වැරදි කරපු කෙනෙක් ඉන්නවා නම් වැරදි කරපු කෙනාට දඬුවම් දෙනවටත් මම ඇතුළුව අපේ කිසිදු ඒ සම්බන්ධයෙන් එරෙහිවීමක් නැහැ කියන කාරණාව විශේෂයෙන් මතක් කරන්න ඕන. මාධ්‍යයට මම ඉල්ලා සිටිනවා අද දවසේ පුළුවන් වෙලාවක් වෙන් කරන්න. මේ සම්බන්ධයෙන් අපි පැහැදිලි කරගැනීමක් කරමු. මේ වසර පුරා කරපු, දැන් අද දවසේ අතුල වෙළඳගොඩ මන්ත්‍රීතුමා ඉතාමත් හොඳ යෝජනාවක් කරනවා. මන්ත්‍රීවරුත් කතා කරන්න යම්කිසි බලාපොරොත්තුවක් තියෙනවා. හැබැයි ඒ යෝජනාව ඇත්තටම ක්‍රියාත්මක වෙනවා යම්කිසි කොටසක්. මේ යෝජනාව ඇත්තටම අපේ වෙළඳගොඩ ගරු මන්ත්‍රීතුමනි, ගේන්න ඕනකම තියෙන්නෙ ඇත්තටම කියනවා නම් පළාත් සභාවේ ධූරකාලය ආරම්භ වෙනවා නම්. දැන් අපි තව මාසෙකුත් දින 20ක් වාගේ තියෙන කාලසීමාවක් තියෙන්නෙ. ඒක ක්‍රියාත්මක කිරීම සඳහා ගැටළු තියෙන නිසා. ඉතාමත්ම හොඳ යෝජනාවක්. ඒක තමයි සිදුවෙන්න ඕන. මේ ගරා වැටෙන, කඩා වැටෙන සමාජය ගොඩ ගන්න නම්. ඒකනිසා ගරු සභාපතිතුමනි, ඔබතුමා මේ සම්බන්ධයෙන් මැදිහත්වෙලා නිවැරදිභාවය ඔප්පු කරන්නට අපිට අමාත්‍යාංශය වෙනුවෙන් විශේෂයෙන්ම මම ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා. බොහොම ස්තුතියි.

සභාපතිතුමා:- විගණනය පිළිබඳ ප්‍රශ්නයක්ද තියෙන්නෙ?

මනෝජ් සිරිසේන මහතා(අමාත්‍ය):- විගණන වාතර්ාවක් හෙළිවේ කියලා තියෙන්නෙ. අමාත්‍යාංශය රුපියල් 147,000/- ක් කාලා. මේක ඇත්තටම වෙලා තියෙන්නෙ සභාපතිතුමනි, සොයලා බැලුවා මම. මේක භාණ්ඩ අරගෙන නියමිත වෙලාවට බෙදීමේ යම්කිසි ප්‍රමාදයක් වෙලා තියෙනවා. ඒ තුළ බෙර වගයක් තමයි මේ ලබාදෙන්න කටයුතු කරලා තියෙන්නෙ. බෙර කීපයක් තිබුණු තැන තිබිලා මම හිතන්නෙ මීයො කාලා හරි අර සිව් ටික විනාශ වෙලා තියෙනවා. සිව් අලුතින් යථා තත්ත්වයට පත්කරලා මේ බෙර ටික බෙදන්නත් අමාත්‍යාංශය කටයුතු කරලා තියෙනවා.

සභාපතිතුමා:- විගණන වාතර්ා දුන්නට විගණන ඡේද පිළිබඳව තවම ගිණුම් කාරක සභාවේ සාකච්ඡා වෙලත් නැහැ. විගණන වාතර්ාවක් දුන්න පළියට ඒක විගණනයෙන් වරදක් කියලා කියන්න බැහැනේ. ඒ පත්තරේට ගියපු එක පිළිබඳව අපි දැන් විමසන්නම්. නමුත් විගණන ඡේදයක් ඉදිරිපත් කළා කියලා ඒක වංචාවක් සිදුවුණා කියලා එක සැරේටම පිළිගන්න බැහැ. ඔබතුමන්ලා අමාත්‍යාංශයෙන් නියම පිළිතුරු ලබාදෙන්න. එතකොට අපි ගිණුම් කාරක සභාවේදී ඒ පිළිබඳව විමසන්නම්. මීළඟට පෞද්ගලික කරුණු පැහැදිලි කිරීම් යටතේ ජයන්ත කේ.එස්. පතිරණ මැතිතුමා.

ඒ.ජී.සී. පියසිරි මහතා:- ගරු සභාපතිතුමනි, වරප්‍රසාද ප්‍රශ්නයක්. යොමු කරන්නට ගරු සභාපතිතුමාගෙන් අවසරය ඉල්ලා සිටිනවා. ගරු සභාපතිතුමනි, අභ්‍යන්තර කටයුතු පළාත් සභා හා පළාත්පාලන අමාත්‍යාංශය දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු සහ ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටු රැස්වීම් පැවැත්වීම සම්බන්ධයෙන් 2019.02.13 දින චක්‍රලේඛන අංක 4/2019 මෙන්න මේ චක්‍රලේඛනය සම්බන්ධයෙන් මේ සභාවේ අවධානය මා යොමු කරන්නට බලාපොරොත්තු වෙනවා. ගරු සභාපතිතුමනි, මෙන්න මේ චක්‍රලේඛනය දිහා බැලුවම එක්තරා විදියකට මේ පළාත් සභාව තුළත් ඉන් පිටත් මේ සම්බන්ධීකරණ කමිටු සක්‍රිය කරන්නට විවිධ අවස්ථාවල අපි කරුණු කාරණා පැහැදිලි කරන්නට යෙදුනා. මෙන්න මේ කරුණු කාරණා දිහා බැලුවම ගරු සභාපතිතුමනි, එක පැත්තකින් අපට සතුටු වෙන්නට පුළුවන්කමක් තියෙනවා, මේ චක්‍රලේඛනය දිහා බැලුවම. දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුවල සහ ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටුවල සභාපති සහ සම සභාපති සම්බන්ධයෙන් මේකෙ චක්‍රලේඛනය නිකුත් කරපු කාරණාව දිහා බැලුවම ගරු සභාපතිතුමනි, මහජන නියෝජිතයින් නොවන දේශපාලඥයින් සඳහා මේ ආයතනවල සභාපති සහ සම සභාපති ධූරය දැරීමට බැරිවන ආකාරයට මේ චක්‍රලේඛනය නිකුත් කරලා තියෙනවා. ඒක එක්තරා විදියකට මේ අවුරුදු හතරක විතර කාලපරිච්ඡේදයක් තුළ ගෙන ගියපු අරගලයක ජයග්‍රහණයක් හැටියට සඳහන් කරන්නට පුළුවන් කමක් තියෙනවා. නමුත් ගරු සභාපතිතුමනි, මෙන්න මේකෙ තවත් කාරණාවක් තියෙනවා. දැන් මේ චක්‍රලේඛනයෙ සඳහන් වෙනවා දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු දිස්ත්‍රික් මට්ටමේදීද ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටු ප්‍රාදේශීය මට්ටමේදී ද තම බල ප්‍රදේශය තුළ ඇති සියළු සම්බන්ධීකරණ ව්‍යාපෘති සම්බන්ධීකරණය සහ අධීක්ෂණය. මෙන්න මේ කාරණය සැළකිල්ලට ගත්තම ගරු සභාපතිතුමනි, මේ 13 වෙනි ආණ්ඩුක්‍රම

ව්‍යවස්ථාව තුළ අදාළ බල ප්‍රදේශයේ සංවර්ධන කටයුතු පිළිබඳ බලයලත් ආයතනය වෙන්නෙ පළාත් සභාව. ප්‍රදේශය පිළිබඳ සංවර්ධනය පිළිබඳව තීන්දු තීරණ ගන්න ආයතනය පළාත් සභාව. 13 වෙනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් පැවරිච්ච බලතල. මෙන්න මේ සම්බන්ධයෙන් අවධානය යොමු කරනකොට ගරු සභාපතිතුමනි, මෙන්න මේකෙ තියෙනවා දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුවේ සභාපති තනතුර පිළිබඳව. සඳහන් කරලා තියෙනවා නිනර්ායක දෙකක්. එකක් තමයි ඒ දිස්ත්‍රික්කයේ ඒ පවතින ආණ්ඩුවේ කැබිනට් අමාත්‍යවරයෙක්. අපි ඒක පිළිගන්නවා. ඒ වගේම නියෝජ්‍ය සභාපති හැටියට ආණ්ඩු පක්ෂය නියෝජනය කරන ජ්‍යෝෂ්ඨ පාලර්ීමේන්තු මන්ත්‍රීවරයෙක්. අපි ඒකත් පිළිගන්නවා. හැබැයි දිගින් දිගටම දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුවල සම සභාපතිත්වය දැරුවා ඒ දිස්ත්‍රික්කයට අදාළ පළාත් සභාවේ ප්‍රධාන අමාත්‍යවරයා,ප්‍රධාන අමාත්‍යවරයා. මේ චක්‍රලේඛනය දිහා බැලුවම ගරු සභාපතිතුමනි, ඒ දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුවේ සම සභාපතිත්වය ඒ අදාළ පළාත් සභාවේ ප්‍රධාන අමාත්‍යවරයා අයින් කරලා තියෙනවා. ඒ දිහා බැලුවම 13 වෙනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ අප වෙත පැවරිච්ච බලතල නිශේද කිරීමක් හැටියට මේ මොහොතේ සඳහන් කරන්නට ඕන. අනිත් දේ බැලුවම ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටුව ගත්තම ගරු සභාපතිතුමනි, ඒකෙ තියෙනවා ආණ්ඩු පක්ෂය නියෝජනය කරන පාලර්ීමේන්තු මන්ත්‍රීවරයෙක්. ඒ වගේම ආණ්ඩු පක්ෂය නියෝජනය කරන පළාත් සභා මන්ත්‍රීවරයෙක් නියෝජ්‍ය සභාපති හැටියට. දැන් මේ කාරණා සැළකිල්ලට ගත්තම එතකොට මේකෙදි එහෙම නම් පළාත් සභාව ගත්තම පළාත් සභාවේ ප්‍රධාන අමාත්‍යවරයා සභාපති වෙන්න ඕන සම්බන්ධීකරණ කමිටුවේ. පළාත් සභාව සැළකිල්ලට ගත්තම ඒ පළාත් සභාව නියෝජනය කරන ආණ්ඩු පක්ෂයේ පළාත් සභා මන්ත්‍රීවරයෙක් විය යුතුයි කියන තකර්ය ගොඩ නැඟෙනවා. මොකද ඒ විෂයන් දිහා බැලුවම අපට, පළාත් සභාවට පැවරිච්ච විෂයන් පිළිබඳව ඒ අදාළ දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුවල එහෙමත් නැත්නම් ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටුවල සාකච්ඡා කරනකොට පවතින ආණ්ඩුවේ පළාත් සභා මන්ත්‍රීවරයෙක් නියෝජ්‍ය සභාපති කිරීම පිළිබඳව තවදුරටත් පළාත් සභාව නොසලකා හැරලා තියෙනවා. ආණ්ඩුව එක පාශර්වයක තියෙන්න පුළුවන්. පළාත් සභාව තවත් පාශර්වයක තියෙනවා. පළාත් සභාව තමයි ඒ නියෝජනය කරන දේශපාලන පක්ෂය පළාත් සභාවේ ආණ්ඩු පක්ෂය වෙන්නේ. එහෙම නම් ඒ පළාත් සභාව නියෝජනය කරන ආණ්ඩු පක්ෂයේ පළාත් සභා මන්ත්‍රීවරයෙක් නියෝජ්‍ය සභාපති විය යුතුයි. එතකොට මේක පළාත් සභාවත් මධ්‍යම ආණ්ඩුවත් අතර ඒ සංවර්ධන කටයුතු පිළිබඳව නිසි සම්බන්ධීකරණයක් ඇති කරන්නට පුළුවන්කමක් ලැබෙනවා. ඒ නිසා ගරු සභාපතිතුමනි, මෙන්න මේ පිළිබඳව අවධානය යොමුකරලා මේ චක්‍රලේඛනයෙන් පළාත් සභාවේ මන්ත්‍රිවරු හැටියට විශේෂයෙන්ම පළාත් සභාවේ ප්‍රධාන අමාත්‍යවරයා සම්බන්ධීකරණ කමිටුවේ සම සභාපතිත්වයෙන් අයින් කිරීම පිළිබඳව පළාත් සභා මන්ත්‍රීවරු හැටියට මේ පිළිබඳව අවධානය යොමුකරලා කටයුතු කරන්න කියන ඉල්ලීම පිළිබඳව යොමු කරන්න කියන කාරණය ගරු සභාපතිතුමනි, අපි ඉල්ලීමක් කරනවා. ඒ පිළිබඳව අවධානය යොමු කරලා මෙන්න මේ ඉදිරිපත් කරපු කාරණා සැළකිල්ලට අරගෙන පළාත් සභාවේ අනන්‍යතාවය රැකෙන විදියට සම්බන්ධීකරණ කමිටුවේ ඉදිරි කාලපරිච්ඡේදය තුළ කටයුතු කරන්නට අවශ්‍ය චක්‍රලේඛනය සංශෝධනයකරලා එවන්න කියන කාරණය මේ සභාවේ අවධානය මා යොමු කරනවා. බොහොම ස්තූතියි.

සභාපතිතුමා:- ප්‍රධාන ඇමතිතුමා, මේ චක්‍රලේඛය ඇත්තද? ඒකට අපි විරෝධය ප්‍රකාශ කරන්න මොකක්ද අපේ ක්‍රමවේදය, අපි සභාවේ යෝජනාවක් සම්මත කරමුද?

ප්‍රධාන අමාත්‍යතුමා:- ගරු සභාපතිතුමනි, ඒ පිළිබඳව මම තවදුරටත් කරුණු අධ්‍යයනය කරලා ඊළඟ සභාවේදී අවශ්‍ය කටයුතු කරන්නම්. චක්‍රලේඛනය ලැබෙයි.

සභාපතිතුමා:- අපි අදම පුළුවන්නම් සභාවට යෝජනාවක් ගනිමු. අත්සන් කරලා.

ප්‍රධාන අමාත්‍යතුමා:- ඇත්තටම ගරු සභාපතිතුමනි, පළාත් සභා ක්‍රමය ආරම්භයේදී ඉඳලා දිස්ත්‍රික් සහ ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටු ඇත්තටම ඍජුවම පළාත් සභාවට අදාළ එකක්. ඔබතුමාට මම මතක් කරනවා විශේෂයෙන්ම පළාත් සභා ක්‍රමය ආරම්භයේදී ගාල්ල දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුවේ ප්‍රධානත්වය දැරුවේ එවකට හිටපු ඇමති එම්.එස්. අමරසිරි මැතිතුමා. පසුව එක් එක් පාලන තන්ත්‍ර තුළ ඒ දිස්ත්‍රික්කවල කැබිනට් අමාත්‍යවරුන්ගේ අවශ්‍යතා මත තමයි ඒ සම්ප්‍රදාය

වෙනස් වුණේ. ඒ නිසා ඇත්තටම මේ චක්‍රලේඛනය තුළින් පළාත් සභාවට ලැබිය යුතු තැන ඒ බලතල උදුරා ගැනීමක් සිදුවෙලා තියෙනවා. ඒ නිසා අපි ඒ පිළිබඳව විරුද්ධත්වය පළකිරීම පිළිබඳ කිසි ගැටළුවක් නැහැ. මොකද ඒ චක්‍රලේඛනය 13 වෙනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ ප්‍රාදේශීය පරිපාලනය පිළිබඳ බලතල තිබෙන්නේ පළාත් සභාවටයි. නමුත් මේ චක්‍රලේඛනය තුලින් උල්ලංඝණය වෙලා තියෙනවා. ඉතින් ඒ නිසා ඒ පිළිබඳව අපිට විරුද්ධත්වය පල කිරීමට සාධාරණ හේතුවක් තිබෙනවා, ගරු සභාපතිතුමනි.

සභාපතිතුමා:- ඒ වගේම මම හිතන්නෙ ප්‍රධාන අමාත්‍යතුමා සම සභාපතිත්වයෙන් අයින් කරනවා නම් පළාත් සභාවේ අමාත්‍යවරුත් ඒ වගේම නිලධාරී සහභාගිත්වයත් දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුවේ,

ප්‍රධාන අමාත්‍යතුමා:- ගරු සභාපතිතුමනි, මම ඔබතුමාට කියන්නෙ පළාත් සභාවේ නිලධාරීන් දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුවට හෝ ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටුවට සහභාගි නොවුණොත් ඒ කමිටු එකක්වත් පවත්වන්න පුළුවන්කමක් නැහැ. නිලධාරීන් අතිබහුතරයක් පළාත් සභාවට සම්බන්ධ අය.

සභාපතිතුමා:- මම හිතන්නෙ ප්‍රධාන අමාත්‍යතුමා ඒ වගේ තීන්දුවක් ගතයුතුව තියෙනවා.

ප්‍රධාන අමාත්‍යතුමා:- චක්‍රලේඛනය වෙනස් නොකලොත් නම් අනිවාර්යයෙන්ම එවැනි තැනකට යන්න සිදුවෙනවා. මොකද දිස්ත්‍රික් ලේකම්වරයා දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුවේ ලේකම් වුවත් ඔහු යටතේ ඉන්නේ ඉතාමත් සුළු නිලධාරීන් පිරිසක්. ඒ නිසා ඒ පිළිබඳව අපි පැහැදිලි තීන්දුවකට එමු. ඒකයි මම අර පැහැදිලිව කිව්වෙ හදිසියේම මේ පිළිබඳව අධ්‍යයනය කරලා, දැනට අපි මේ පිළිබඳව අපේ විරුද්ධත්වය පල කරන්න පුළුවන්. වහාම මේ පිළිබඳව පළාත් සභාවේ බලතල, වරප්‍රසාද අහිමි සහ උල්ලංඝණය නොවන ආකාරයෙන් මේ චක්‍රලේඛ නිකුත් කරන්න කියන එක. නොසලකා හැරීමක් සිදුකරලා තියෙන්නෙ. මම දන්නෙ නැහැ විශේෂයෙන්ම මම කණගාටු වෙන්නෙ ගරු සභාපතිතුමනි, පළාත් සභා ක්‍රමය මේ රටට හඳුන්වලා දුන්නෙ එක්සත් ජාතික පක්ෂය. එක්සත් ජාතික පක්ෂය හැම අවස්ථාවකම මේ පිළිබඳව ගෞරවය ගන්නවා. මොකද පාලන බලතල විමධ්‍යගත කිරීම පිළිබඳව සම්ප්‍රදාය සංකල්පය රටට හඳුන්වාදීම ගැන. කණගාටුව තිබෙන්නේ ඒ හඳුන්වාදීපු ආණ්ඩුවේම පක්ෂයක් තුළ විෂය භාර අමාත්‍යවරයෙක් තුළ අදාල අමාත්‍යාංශයේ මෙවැනි චක්‍රලේඛනයක් නිකුත්වීම තුළ. ඒ නිසා අපි හිතනවා යම් ප්‍රමාද දෝෂයකින් යම් වරදකින් හරි මෙය නිකුත් වුණත් මෙය ඉතාම ඉක්මණින් මෙය නිවැරදි කරයි කියන විශ්වාසය අප තුළ තියෙනවා. අපි ඉල්ලීමක් කරනවා වහාම නිවැරදි කරන්න කියලා. මොකද ඒ.ජී.සී. පියසිරි ගරු මන්ත්‍රීතුමා ඉදිරිපත්කල කාරණා සියල්ල එක්ක මමත් එකඟ වෙනවා.

අශෝක ධනවංශ ද සිල්වා මහතා(විපක්ෂ සංවිධායක):- ගරු සභාපතිතුමනි, විනාඩියක අවසරයක් දෙන්න.

ඒ.ජී.සී. පියසිරි මහතා:- ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටුවේ සභාපති හැටියට පාලර්මේන්තු මන්ත්‍රීවරයෙක් නම් කරලා තියෙන්නෙ ආණ්ඩු පක්ෂය නියෝජනය කරන. ආණ්ඩු පක්ෂය කියලා මේකෙ අර්ථ ගන්වන්නේ මධ්‍යම ආණ්ඩුව, රජය. පළාත් සභාව නෙවෙයි. ඒ නියෝජනය කරන දේශපාලන පක්ෂයක් නියෝජනය කරන පළාත් සභා මන්ත්‍රීවරයෙක් උප සභාපති. ඒක විය යුත්තේ එහෙම නම් සමහර විට පළාත් සභාව පාලර්මේන්තුව එක පක්ෂයක් නියෝජනය කරන්න පුළුවන්. ආණ්ඩු බලය ලබාගන්න පුළුවන්. මේ පළාත් සභාව වෙනත් පක්ෂයක් බලය ලබාගන්නට පුළුවන්කමක් තියෙනවා. එහෙම ගත්තම මම කියන්නෙ පළාත් සභාව නියෝජනය කරන ආණ්ඩු පක්ෂය, පළාත් සභාව නියෝජනය කරන බලය ලබාගත්ත දේශපාලන පක්ෂය නියෝජනය කරන පළාත් සභා මන්ත්‍රීවරයෙක් උප සභාපති විය යුතුයි. එතකොට මේකෙ සම්බන්ධීකරණයක් තියෙනවා.

සභාපතිතුමා:- හරි. අපි ඒක දැනුම් දෙන්නම් රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශයට.

අශෝක ධනවංශ ද සිල්වා මහතා(විපක්ෂ සංවිධායක):- ගරු සභාපතිතුමනි, අපේ පියසිරි ගරු මන්ත්‍රීතුමාත්, ගරු ප්‍රධාන අමාත්‍යතුමාත් කියපු කරුණු බොහොමයකට එකඟ වෙන්න සිද්ධ වෙනවා. පක්ෂයේ පළාත් සභා මන්ත්‍රී කියන එක අර්ථ කතනය කරන බව තියෙන බවක් අපි පිළිගන්නවා. ඒ නිසා අපි වජිර අබේවර්ධන මැතිතුමාගේ අමාත්‍යාංශය ස්වදේශ කටයුතු අමාත්‍යාංශය මේක නිකුත් කරලා තියෙන්නෙ. ඒ නිසා මේ තියෙන තත්ත්වය ඔබතුමා නිල වශයෙන්

දන්වලා යවන්න. අපිත් පෞද්ගලිකව මේ සම්බන්ධයෙන් අපේ දැනුවත් කිරීම කරන්නම්.

චමලි විතානාච්චි මහතා(සභානායක):- ගරු සභාපතිතුමනි, පොඩි ගැටළුවක් තියෙනවා. එතන ඒ චක්‍රලේඛනයේ සියළුම දේවල් අගමැතිතුමා ළඟින් නවතිනවා.එකම තැනක තමයි ජනාධිපති ලේකම්ට යොමු කරන්න කියලා තියෙන්නෙ ගැටළුවක් ආවොත් එහෙම. අනිත් සියළුම ඒවා අගමැතිතුමාගේ අමාත්‍යාංශය යටතේ පළාත් සභා අමාත්‍යාංශයේ ලේකම් හෝ අගමැතිතුමාගේ යටතේ තියෙන ඒ අමාත්‍යාංශයේ ලේකම්ගෙන් විමසීමකින් එතනින් එහාට යන්න විදියක් නැහැ. නමුත් රටේ විධායකය ජනාධිපතිනේ. ඒක තියෙන්නෙ එකම තැනක විතරයි ඒ චක්‍රලේඛනය.

නලින් හේවගේ මහතා:- ගරු සභාපතිතුමනි, මේ සම්බන්ධීකරණ කමිටු සම්බන්ධයෙන් විශේෂයෙන් පළාත් සභා මන්ත්‍රීවරුන්ගේ වරප්‍රසාද ආරක්ෂා කර ගනිමින් මේ වරප්‍රසාද රකින්න ඕන කියලා දීඝර් කාලයක් තිස්සේ මේ සාකච්ඡා කළා. ඇත්තටම මට මතක නම් රිචඩ් පතිරණ මැතිතුමා මේ සම්බන්ධීකරණ කමිටුවල සභාපතිත්වයේ ඉන්න කාලෙ විශාල වැඩ කොටසක් ගත්තා. මට හොඳ අත්දැකීමක් තියෙනවා විශේෂයෙන් එවකට සම්බන්ධීකරණ කමිටුවට පත්කළේ දිස්ත්‍රික්කයේ ඉන්න ජ්‍යෝෂ්ඨතම ඇමතිවරයා. සභාපතිවරයාට පත්කළේ. ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටුවටත් එහෙමයි. පාලරීමේන්තුවෙන් පිට කෙනෙකුට ඒවායේ සභාපතිකමක් ගන්න ඉඩක් තිබුණෙ නැහැ. ඉතාම හොඳ තත්ත්වයක්. පස්සෙ කොහොම කොහොම හරි මේක මැකිලා මැකිලා ගිහිල්ලා දැන් මහජන නියෝජිතයො නොවන කට්ටියත් ඇවිල්ලා. ගරු සභාපතිතුමනි, දැන් තමයි මේ චක්‍රලේඛය ගත්තෙ. ඒකෙ තියෙනවා මේ 25 යටතේ මාධ්‍යවේදීන්ට කරුණු සභාවේ වාතර්‍ා කිරීමට අවශ්‍ය නම් ඒ සඳහා දිස්ත්‍රික්/ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටු රැස්වීම අවසානයේ අදාළ කමිටුවේ සභාපති හා මහජන නියෝජිතයන් සමඟ වෙනම සාකච්ඡාවක් පැවැත්විය හැකිය. එතකොට ඒකෙන් මේ කියන්නෙ මාධ්‍යවේදීන්ට මේක විවෘත නැහැ. ඇත්තටම මෙතුවක් කල් තිබ්ච්ච දේ තමයි මාධ්‍යවේදීන් අනිවායෙර්න් සම්බන්ධීකරණ කමිටුවට සම්බන්ධ කර ගත්තා. ඒක හරහා ඇත්තටම මේ විශාල වැඩ කොටසක් හොඳ දේවල් ජනතාව අතරට ගියා.දැන් ඇත්තටම මේ වෙනකොට මේ තියෙන්නෙ මාධ්‍යවේදීන්ට දොර අහුරලා තියෙන්නෙ.ඒ කියන්නෙ වෙනම එළියට ගිහිල්ලා ඕන නම් වෙනම එකකින් ගන්න පුළුවන්. එතකොට සභාපතිගේ මතය තමයි මාධ්‍යවේදීන් ලියන්න ඕන. අර ඇත්ත දැකලා, සත්‍ය ඇහිලා ඒක නෙවෙයි ලියන්න වෙන්නෙ. ගරු සභාපතිතුමනි, මේ වෙනකොට සාකච්ඡා කරගෙන යනවා විශේෂයෙන් කෝප් කමිටුව ඒ වගේම රාජ්‍ය ගිණුම් කාරක සභාවට මාධ්‍යවේදීන් කැඳවන්න. එතකොට එතන එහෙම අරින්න හදනකොට මාධ්‍යවේදීන්ට මේ ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටුවල දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුවල දොර වැහීම ඒක බරපතල අපරාධයක්. ඇත්තටම මේවා කරන්න ඕන නැහැ. ඒ නිසා මේ චක්‍රලේඛය මම දැන් තමයි කියවගෙන යන්න. මේ දැන් ලබාගත්තෙ. මේකෙ අඩුපාඩු ගොඩක් තියෙනවා.ඒකනිසා ඇත්තටම අපිට මහජන නියෝජිතයන් හැටියට මේකට පක්ෂ වෙන්න බැහැ. මේක වහාම වෙනස් කරන්න කියලා සාකච්ඡාවට බඳුන් කරන්න කියලා අපි ඉල්ලීමක් කරනවා.

සභාපතිතුමා:- අපි දැනුම් දෙන්නම්. ඒ වගේම ඊළඟ සභාවට යෝජනාවක් ඉදිරිපත් කරලා කටයුතු කරමු. ඊළඟට පෞද්ගලික කරුණු පැහැදිලි කිරීම්. අපේ පතිරණ මන්ත්‍රීතුමා.

වන්න සාලිය මෙන්ඩිස් මහතා:- ගරු සභාපතිතුමනි, වරප්‍රසාද කරුණක් ඉදිරිපත් කරන්න තියෙනවා. මේක මගේ පෞද්ගලික කරුණක් නෙවෙයි.

සභාපතිතුමා:- ඔයාගේ පෞද්ගලික ඒවා විතරයි.

වන්න සාලිය මෙන්ඩිස් මහතා:- අපි මේ විමධ්‍යගත මුදල් වලදී මේ වෂර්යේදී මුදල් වෙන් කිරීමේදී පෙර පාසැල්වලට සහ අධ්‍යාපන ක්ෂේත්‍රයට මුදල් වෙන් කරන්නට අපිට නිනර්ායක ලැබිලා නැහැ ගරු සභාපතිතුමනි. නමුත් අවශ්‍යතා තියෙනවා පෙර පාසැල් සහ අධ්‍යාපන අංශයට යොමු කරන්න. එතකොට අපිට සංශෝධනයක් කරලා දෙන්න කියන ඉල්ලීම තමයි අපි කරන්නෙ, ගරු සභාපතිතුමනි.

සභාපතිතුමා:- ඒක ප්‍රධාන අමාත්‍යතුමාට යොමු කරන්නම්. මොකක්ද වෙන් කරන්න කියන්නෙ. අධ්‍යාපනයටයි, පෙර පාසැල් ක්ෂේත්‍රයට. මම ඒක කියන්නම්.

05. පෞද්ගලික කරුණු පැහැදිලි කිරීම්.

ජයන්ත පතිරණ මහතා:- ගරු සභාපතිතුමනි, පෞද්ගලික කරුණක් පැහැදිලි කිරීමට අවස්ථාව ලබාදීම සම්බන්ධයෙන් පළමුවෙන්ම ස්තුතිවන්ත වෙනවා.මගේ මේ ප්‍රකාශය ගරු අධ්‍යාපන ඇමතිතුමාගේ අවධානය පිණිස ඉදිරිපත් කරන්නෙ. කොටුවේගොඩ මුස්ලිම් දෙමව්පියන් පිරිසක් විසින් කරන ලද ඉල්ලීමක් සම්බන්ධයෙන්. ගරු සභාපතිතුමනි, කොටුවේගොඩ තියෙනවා ඉල්මා කියලා මුස්ලිම් විද්‍යාලයක්. මේ විද්‍යාලය මුස්ලිම් ප්‍රජාවගේ කලින් පරිත්‍යාග කරපු ඉඩමක මුලින්ම මුස්ලිම් විද්‍යාලයක් වශයෙන් පැවතුණු විද්‍යාලයක්. මේ විද්‍යාලය 1996 වෂර්යේදී ඉල්මා විද්‍යාලය වශයෙන් නම්කරලා මුස්ලිම් ළමයින්ට සිංහල මාධ්‍යයෙන් අධ්‍යාපනය ලැබීම සඳහා මාතර දිස්ත්‍රික්කයේ ළමයින්ට පහසුකම් ලබාදීලා තියෙනවා. ඒ අනුව පාසැලේ කටයුතු ඉතාම සාර්ථක අන්දමින් මේ දක්වා කිසි ගැටළුවකින් තොරව පවත්වාගෙන ගියත් මේ විද්‍යාලය ආරම්භයේදී මුල් කාලයේ ඉඳලා තියෙනවා මුස්ලිම් ගුරුවරු 22 ක්. අද වෙනවිට ඉන්නේ මුස්ලිම් ගුරුවරු හත් දෙනෙක් පමණයි. මෙහි සිංහල ළමයි දෙසිය ගණනක් ඉන්නවා, මුස්ලිම් ළමයි හයසිය ගණනක් ඉන්නවා. ඒ සියළු දෙනා අධ්‍යාපනය ලබාගන්නවා සියළු දෙනාම ආගම ඇදහීමේ සියළු පහසුකම් තියෙනවා. කිසිම ගැටළුවක් නොමැතිව පැවතුණා. එහි නිවාඩු කාලය ලබාදීමේ සීමාවන් ආදිය සිදුවෙන්නෙත් මුස්ලිම් වෙනත් පාසැල්වල නිවාඩු දෙන කාලවකවානුවකට අදාළව. දැන් මේ පාසැලේ ඉන්න මුස්ලිම් ගුරුවරු හත්දෙනාම අවුරුදු දහයට වැඩිය සේවා කාලයක් ගතකරලා තියෙනවා. මේ දෙමව්පියන් අතර පොඩි අසහනයක් ඇතිවෙලා තියෙනවා මේ මුස්ලිම් පාසැලේ මුස්ලිම් ගුරුවරු එන්න එන්න අඩුවෙලා මුස්ලිම් ගුරුවරු නැතිම වෙලා යයිද කියලා. ඒකනිසා ඔවුන්ගේ අනන්‍යතාවය රැක ගැනීමටත් කටයුතුවලටත් බාධාවක් කියලා ඔවුන් අතරේ අසහනයක් ඇතිවෙලා තියෙනවා. මේ සම්බන්ධයෙන් සාකච්ඡා කළ අවස්ථාවේදී මම කොහොමත් මේ සම්බන්ධයෙන් පළාත් සභාවේ අධ්‍යාපන ඇමතිවරයාගේ අවධානය යොමු කරන්නම් එවැනි තත්ත්වයක් ඇතිවෙන එකක් නැ කියලා කල්පනා කරනවා. ඒ නිසා ඔවුන් විසින් මට ලබාදුන්නා පාසැල් සංවධර්න සමිතිය නමින් ලිපියක් ලබාදීලා තියෙනවා. මේ සම්බන්ධයෙන් මම ගරු අධ්‍යාපන ඇමතිතුමාගේ අවධානය යොමු කරනවා මෙන්න මේ මුස්ලිම් ප්‍රජාවට අසහනයක් ඇතිනොවන ආකාරයෙන් මේ පාසැලට ගුරුවරුන් ලබාදීමට කටයුතු කරන්න කියලා.

සභාපතිතුමා:- ඊළඟට චමලි විතානාච්චි සභානායකතුමා.

චමලි විතානාච්චි මහතා(සභානායක):- ගරු සභාපතිතුමනි, පෞද්ගලික කරුණු පැහැදිලි කිරීම් යටතේ මට කරුණු කීපයක් ඉදිරිපත් කරන්න අවස්ථාව ලබාදීම පිළිබඳව ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා. මම යොමු කරන්න බලාපොරොත්තු වුණේ ගරු සභාපතිතුමනි, 2014.02.24 වෙනිදා ධමර්ාචායර් සමත් අයට ගුරු සහායක තනතුරු ලබාදුන්නා ඔබතුමා දන්නවා ඇති. ගරු සභාපතිතුමනි, මේ අයට අවශ්‍ය ගුරු පුහුණුවද ලබාදීලා 2017.07.28 වෙනිදා ඒ ගුරු පුහුණුව අවසන් කරලා තියෙනවා. සහතිකත් ලබාදීලා තියෙනවා ගරු සභාපතිතුමනි. ඒත් මේ වනවිට ඒ ගුරුවරුන් ස්ථිර කරන තත්ත්වයට පත්වෙලා නැහැ. තවම ඔවුන්ගේ වැටුප රුපියල් 10,000/- යි තියෙන්නෙ. මම ඔබතුමාගේ අවධානය යොමු කරනවා දැන් එක වැලිගම කලාපයේ ගුරුවරයෙකුත් ස්ථිර කරලා තියෙනවා. 2019.01.03 දින. මේ ගුරුවරු පළාත් සභා අධ්‍යාපන අමාත්‍යාංශයේ සහ රේඛීය අධ්‍යාපන අමාත්‍යාංශය යටතේ මේ ගුරුවරු සේවය කරනවා. හැබැයි මේ වනතෙක් මේ ගුරුවරුන්ට සේවය ස්ථිර කරගන්න බැරිවෙලා තියෙනවා ගරු සභාපතිතුමනි. ඒ නිසා විශාල ප්‍රමාණයක් මේ ධමර්ාචායර් සමත් සහායක ගුරුවරු සේවය කරනවා. මේක ලංකාවටම බලපානවා. මේ ගුරු මහත්ම මහත්මීන්ගේ සේවය ගුරු සේවයට එකතු කළා වගේම ස්ථිර කරලා මොවුන්ට අවශ්‍ය වැටුප් තලවල පිහිටුවීමට අවශ්‍ය කටයුතු කර දෙන්න කියන යෝජනාව තමයි ගරු සභාපතිතුමනි, පෞද්ගලික කාරණාවක් විදියට ඉදිරිපත් කරන්නෙ. බොහොම ස්තුතියි.

නලින් හේවගේ මහතා:- ගරු සභාපතිතුමනි, වරප්‍රසාද ප්‍රශ්නයක් ඉදිරිපත් කිරීමට ඔබතුමාගෙන් අවසර ඉල්ලා සිටිනවා. අපි දැන් දීඝර් කාලයක් තිස්සේ මේ පළාත් සභාවෙත් සාකච්ඡා කළා. මෙය වීරසුමන වීරසිංහ මන්ත්‍රීතුමා යෝජනාවක් හැටියට මේ පළාත් සභාවට ඉදිරිපත් කළා 18.08.28 වෙනිදා. විශේෂයෙන්ම මේ ගාල්ල, මාතර ප්‍රදේශවල අසීමාන්තිකව වගා කරන කටුපොල් සම්බන්ධයෙන්. මේ යෝජනාවක් දාලා සාකච්ඡා කරලා ලේකම්තුමා යෝජනාවේ පිටපත් යවලා තියෙනවා ප්‍රධාන ඇමතිතුමාට සහ අමාත්‍ය මණ්ඩලයට. 2018.09.10.

ගරු සභාපතිතුමනි, මේක සාකච්ඡා කලාට මේක දිගින් දිගටම සිදුවෙනවා. තියෙන රබර් ගස් ටික ගලවලා, පොල්ගස් ටික ගලවලා මේක අසීමාන්තිකව වගා කරගෙන යනවා. අපි දැන් මේක කලින් පෙන්නලා දුන්නා රාජ්‍ය ආයතනවල හතක වාතර්ාවක් තියෙනවා. ඒ ආයතන මහවැලි සංවධර්න අමාත්‍යාංශය, කෘෂිකමර් අමාත්‍යාංශයයි, කෘෂි විද්‍යා පීඨය පේරාදෙණිය, ශ්‍රී ලංකා රබර් පයෙර්ෂණායතනය, ශ්‍රී ලංකා පොල් පයෙර්ෂණායතනය, ශ්‍රී ලංකා කළමනාකරණ ආයතනය, මධ්‍යම පරිසර අධිකාරිය. එතකොට මේවයින් කියන්නෙ වහාම නතර කරන්න කියලා නිදෙර්ශ කරලා තියෙන්නෙ. ඒ විතරක් නෙවෙයි ගරු සභාපතිතුමනි, මේ ජනාධිපතිතුමාම වාඩිවෙච්ච 2018 දෙසැම්බර් මාසෙ 11 වෙනි දින පෙරවරු 11.30 ට පවත්වනු ලැබූ රැස්වීම් අංක:18 හි සඳහන් සහභාගිත්වය ජාතික ආථර්ික පාලක සභාවේ සාමාජිකයන් පැමිණි සාමාජිකයන් අතිගරු මෛත්‍රීපාල සිරිසේන මැතිතුමා මුදල් හා ජනමාධ්‍ය අමාත්‍ය මංගල සමරවීර කට්ටිය ඉඳලා තියෙනවා. එයාලා අරගෙන තියෙනවා ගරු සභාපතිතුමනි, තීන්දුවක්. ඒ තීන්දුවේ තියෙන්නෙ ගරු සභාපතිතුමනි, වහාම මේක නතර කරන්න කියන කාරණාව. ජනාධිපතිතුමා 10 වෙනි මාසේ 11 වෙනි දින වාඩිවෙච්ච කමිටුව. මධ්‍යම පරිසර අධිකාරිය විසින් ඉදිරිපත් කර ඇති වාතර්ාවේ කරුණු පාරිසරික හා සාමාජීය වශයෙන් ඉතාමත් පෞද්ගලික හා ඉතාමත් සංවේදී බැවින් එම වාතර්ාවේ නිදෙර්ශ ක්‍රියාත්මක කළ යුතුය. ඒ අනුව ශ්‍රී ලංකාව තුළ කටුපොල් වගාව ව්‍යාප්ත කිරීම සුදුසු නොවන බව තීරණය කළේය. එතකොට මාස දෙකකට කලින් සභාපතිතුමා ජනාධිපතිතුමා ගත්ත තීන්දුව. ප්‍රශ්නෙ තියෙන්නෙ මේක නෙවෙයි. ජනාධිපතිතුමා මේ තීන්දුව ගත්තට පස්සෙ මම දැන් වැව්ලි කමර්ාන්ත අමාත්‍යාංශයට කතා කළා.කතාකළාම ජනාධිපතිතුමා මේක ලිඛිතව එවන්නෙ නැහැ. ඒකයි කියන්නෙ. මේ වැව්ලි සමාගම් කියනවා පැල තවාන්වල පැල තියෙනවා ගොඩාක්. ඒක වගා කරන්න ඉඩ දෙන්න කියලා.දැන් ජනාධිපතිතුමා මහා පරිසරය සම්බන්ධයෙන් කතා කරන්නෙ. පරිසරය සම්බන්ධයෙන් කතා කරන්නෙ අපි දන්නවා මනම්පිටියෙ වැලි කැපුවෙ කව්ද කියලා. දැන් මේ කෑ ගැහුවට. දැන් පරිසර ඇමතිතුමාත් එයා. දැන් පරිසර ඇමතිතුමා හැටියට ජනාධිපතිතුමා ගත්ත තීන්දුව, දැන් ජනාධිපතිතුමා ඔච්චර කායර්ක්ෂම නම් දැන් කල්පනා කරලා බලන්න. 2018 සැප්තැම්බර් මාසෙ 11 වෙනිදා ජනාධිපතිතුමා ගන්නවා තීන්දුවක් එයා ඉන්න කමිටුවේ තීරණය වහාම නතර කරන්න කියලා. ඒක ලිඛිතව තවමත් වතු සමාගම්වලට වැව්ලි කමර්ාන්ත අමාත්‍යාංශයට, දිස්ත්‍රික් ලේකම් කායර්ාලයට යවන්න ගරු ජනාධිපතිතුමා සමත් වෙලා නැහැ. ඒ කියන්නෙ මොකක්ද? ඒ කියන්නෙ ජනාධිපතිතුමා හොර පාරෙන් වගා කරන්න දීලා තියෙන්නෙ ජනාධිපතිතුමා. අපි ඇහුවා ජනාධිපති ලේකම් කායර්ාලයෙන්. වැව්ලි කමර්ාන්ත අමාත්‍යාංශයේ ලේකම්තුමාගෙන් ඇහුවා. ඇහුවට පස්සෙ ජනාධිපතිතුමා ගත්ත තීන්දුව තමයි, තීන්දුව ලිඛිතව එවන්නෙ නැහැ.එවන්නෙ නැති තත්ත්වයක් ඇතුලේ අර ඔක්කොම වවනවා. දැන් උද්ඝෝෂණ ගරු සභාපතිතුමනි, රට හැමතැනම. මාස දෙකක් ඇතුලත යටලමත්තේ උද්ඝෝෂණයක් කළා. කොක්මාදුව උද්ඝෝෂණයක් කළා, පිටබැද්දර උද්ඝෝෂණයක් කළා. වීරසුමන මන්ත්‍රීතුමාත් ආවා. ඊටපස්සෙ ඇල්පිටියේ ඕමත්තේ උද්ඝෝෂණයක් කළා. මේ මාසෙ 27 තියාගෙන තියනවා තල්ගස්වල උද්ඝෝෂණයක්. ඉතින් හැමදාම මෙහෙම පාරට බහින්න ඕන නැහැ. ජනාධිපතිතුමා වාඩිවෙච්ච තීන්දුව ඕන නම්, ඒ නිසා මේ ජනාධිපතිතුමාම තමයි මේ පරිසරය විනාශ කරන්න ඉඩ දෙන්නෙ කියලා තමයි මේ සභාවේදී කියන්නෙ. ජනාධිපතිතුමා වාඩිවෙලා තීන්දුවක් ගත්තා නම් මාස දෙකකට කලින් සභාවේ. එතුමත් වාඩිවෙලා. ඒක ඊට පස්සෙන්දා එවන්න ඕනනේ තීන්දුව ක්‍රියාත්මක කරන්න කියලා දිස්ත්‍රික් ලේකම් එකට වැව්ලි කමර්ාන්ත අමාත්‍යාංශයට. ගරු සභාපතිතුමනි, එවන්නෙ නැහැ. ඒ නිසා මේක දැනුවත්භාවයෙන් ගහන ගේමක්. මොකද මේ කම්පැණි කාරයින්ගේ සල්ලි තියෙනවා. මේක වවන්නෙ විනිමා කියන කම්පැණිය ලෝකෙ බලගතුම සංවිධානයක්. එයාට තමයි වටවල ප්ලාන්ටේෂන් ගෙයක් තියෙන්නෙ. එයාලාගේ සල්ලිවලට යටවෙච්ච ජනාධිපතිතුමා ප්‍රමුඛ නිලධාරී මණ්ඩලය මේක වවනවා කියලා තමයි අපට කියන්න තියෙන්නෙ. උසාවි දාන්න ගියා ඇල්පිටියේදී. ඇයි අපි උසාවි දාගන්නෙ. ඕන නැහැ. මේ කරුණු කාරණා ඔක්කොම තියෙනවා.ඒ නිසා මේ තීන්දුව වහාම ජනාධිපතිතුමාටත් බල කරන්න, ඔබතුමා වාඩිවෙලා ගත්ත තීන්දුව ලිඛිතව එවන්න. එහෙම නැත්නම් අපි එනවා උද්ඝෝෂණයක් කරන්න. ඔබතුමා මේ බොරු වැඩක් කරන්නෙ. වාඩිවෙලා තීන්දු ගත්තට ඒවා එවන්නෙ නැහැ. වැව්ලි සමාගම්වලට ඔබතුමා තමයි ඉඩදීලා තියෙන්නෙ මේ වවන්න දීලා තියෙන්නෙ කියලා අපි

එනවා ජනාධිපති ලේකම් කායර්ාලයට. ඊට කලින් අපි ඉල්ලීමක් කරනවා වහාම මේක එවන්න කියලා.

සභාපතිතුමා:- අපි දැනුම් දෙන්නම්. මේ හැමතැනම තියෙනවා දැන් මම දැක්කා හයිවේ යනකොට ගොඩක් තවාන් තියෙනවා. මීළඟට අපේ වතුර ගලප්පත්ති මන්ත්‍රීතුමා, ඔබතුමා මේ එදත් කතා කළා. ඇමතිතුමාත් නැහැ. ඔබතුමා මේකට ප්‍රශ්නයක් විදියට දාන්න. එතකොට අවශ්‍ය තොරතුරු ටික දෙන්නම්. ලේකම් අපිට ලියුමක් එවලා තියෙනවා එදා කරපු ප්‍රකාශයට මම හිතන්නෙ ඔබතුමාට පිටපතක් දෙන්න ඇති.

වතුර ගලප්පත්ති මහතා:- ගරු සභාපතිතුමනි, ඒක මගේ අතට ලැබුණෙ නැහැ තවම. සභාලේකම්තුමාත් ඇවිල්ලා කාරණාව කිව්වා. නමුත් මන්ත්‍රී වරප්‍රසාද යටතේ මේ කාරණය සඳහන් කරන්න ඕන. ඔබතුමා දන්නවා ගිය සභාවේදී විශේෂයෙන් දකුණු පළාත් සමුපකාර සංවධර්න කොමසාරිස්තුමා අපිට එවපු 2019.01.17 දින අපිට එවපු ඒ ලියුම නිසා. විශේෂයෙන් එතුමා දැන හෝ නොදැන ආයතන ප්‍රධානියා විදියට දකුණු පළාත් සමුපකාර ව්‍යාපාරය තුළ දැඩි අවධානම් තත්ත්වයක් උදාවෙලා තියෙනවා. දැනට මම මේ කාරණාව කියන්න කලින් එක දෙයක් කියන්න ඕන. ඒ තමයි දකුණු පළාත් සමුපකාර ප්‍රඥප්තිය මේ වෙනකොට සකස් වෙමින් පවතිනවා. කෙනෙක් හිතන්න පුළුවන්. මොකද මම මේක ගිය සතියේ මේ කාරණාව සාකච්ඡා කලායින් පස්සෙ අපේ මන්ත්‍රීවරු වගේම අපේ ඇතැම් නිලධාරීන් පවා සමහර විට හිතන්න පුළුවන් මේ ප්‍රඥප්තිය කියන එක අරමුණු කරගෙන මේ කතා කරනවා කියලා කෙනෙකුට හිතෙන්න පුළුවන්.නමුත් එදාත් මම මගේ කතාවේදී සඳහන් කළා ඒ ප්‍රඥප්තිය පිළිබඳ කිසි ගැටළුවක් නැහැ. ප්‍රඥප්තිය අපි සාකච්ඡා කරන වෙලාවට අපි අදහස් කරුණු කාරණා, මොකද අපි බලාපොරොත්තු වෙනවා මේ සමුපකාර ක්ෂේත්‍රයේ යම් නියාමනයක් විය යුතුයි. ඒක ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අනුකූලව. එහෙම ප්‍රඥප්තියකට අපි නීත්‍යානුකූලව එකඟතාවය පල කරනවා. ඉතින් කාරණාව තියෙන්නෙ, මොකද මේක ගැන අදහස් දක්වපු අය ඇතැම් දූෂිත සභාපතිවරු නැ මේ ක්ෂේත්‍රයේ. ඉතා දක්ෂ ලෙස තමන්ගේ සමුපකාර කටයුතු කරගෙන යනවා. හැමෝම එක මට්ටමක හිතන්න බැහැ. හැබැයි දූෂිතයෙක් දෙන්නෙක් ඉන්නවා නම් ඔවුන්ට අවශ්‍ය නීත්‍යානුකූල පියවර කිසිම ගැටළුවක් නැහැනැ. ඒ සම්බන්ධයෙන් ඒ දෙන්න පුළුවන් උපරිම සහයෝගය දක්වනවා. ඒ ප්‍රඥප්තිය ගැන නෙවෙයි මම මේ කතා කරන්නෙ. මේ මම කතා කරන්නෙ දකුණු පළාත් සමුපකාර සංවධර්න කොමසාරිස්තුමා විසින් අපිට එවපු ලිපිය හා සම්බන්ධවයි මම මේ කරුණ ඉදිරිපත් කරන්නේ. මේ කොමසාරිස්තුමා අපිට ලියුම විතරක් එවලා නවතින්නෙ නැහැ. මෙයා ප්‍රාදේශීය ලේකම් කායර්ාල ගානෙ ගිහිල්ලා රැස්වීම් කරනවා. මේ ප්‍රාදේශීය ලේකම් කායර්ාලවල තියෙන කෘෂිකමර් කමිටුවල මෙයා ගිහිල්ලා සමුපකාර ගැන දේශණයක් දෙනවා. මෙයා දෙන්නෙ මොකක්ද? මෙයා කියන්නෙ මොකක්ද? සමුපකාර සමිතිවල මුදල් ආයෝජනය කරන්න එපා කියලා. මෙයා සංවධර්න කොමසාරිස්ද? නැත්නම් මෙයා සමුපකාර බංකොලොත් කරන කොමසාරිස්වරයෙක්ද කියලා අහන්න ඕන. මොකද දැඩි පීඩනයක් තියෙන්නෙ. විශේෂයෙන් මම නියෝජනය කරන දෙවිනුවර ආසනයේ දෙවුන්දර සමුපකාර සමිතිය ඉතිහාසයේ යම් ගැටුම්කාරී තත්ත්වයක් තිබුණා. හැබැයි පහුගිය කාලෙ ඒ තියෙන ණය පියවලා හොඳ ව්‍යාපාරයක් බවට පත්කරලා තියෙනවා. විශේෂයෙන්ම උම්බලකඩ ව්‍යාපෘතියක් ගෙනල්ලා ඒ උම්බලකඩ ව්‍යාපෘතිය තමයි සියළුම ණය පියවලා හොඳට කරගෙන යනවා. හැබැයි කොමසාරිස්තුමා ලියුම් යවනවා උම්බලකඩ ව්‍යාපෘතිය නවත්වන්න. ඒ විතරක් නෙවෙයි එයා කියනවා දික්වැල්ල සමුපකාර සමිතියේ මේක ගන්න කියලා. ඉතින් එහෙම එයාට ඕන ඕන තීන්දු තීරණ ගන්න බැහැ. කොමසාරිස්තුමා වුණත්. ඉතින් කාරණය තියෙන්නෙ මේ වගේ, එහෙම කරලා ඉන්නවා නම් තව කමක් නැහැ. මෙයා ප්‍රාදේශීය ලේකම් කායර්ාලවල ගිහිල්ලා රැස්වීම් තියනවා මේ සමෘද්ධි නිලධාරීන්, කෘෂිකමර් පයෙර්ෂණ නිලධාරීන් මේ සියළුදෙනාම දැනුවත් කරනවා මේ සමුපකාර සමිතිවල ආයෝජනය කරන්න එපා, බැංකුවලින් ගණුදෙණු කරන්න එපා කියලා. ඉතින් මේ තුළ දැඩි අබර්ුදයක් තියෙනවා. අර දඩුවම් කියන මනුස්සයෙක් හිටියා. ඒ දඩුවම් කියන මනුස්සයා කළා වගේ දෙයක් තමයි මේ කරන්නෙ. ඉතින් ඒ නිසා මේ කොමසාරිස්තුමා ඇත්තටම මම නම් දකින විදියට ඇත්තටම මොලේ පරීක්ෂා කරන්න වෙනවා. මොකද නැත්නම් සංවධර්න කොමසාරිස්වරු, සමුපකාර සංවධර්න කොමසාරිස්වරයෙක් කරන්නෙ නැති වැඩක් මේ කරන්නෙ. නමුත් මම කියන්නෙ මෙච්චරයි. එදා අපිට එවපු ලියුම සහ ප්‍රාදේශීය ලේකම් කායර්ාලවල මෙතුමා දේශණ පවත්වන එක ගැන නම් මම පිළිකුලෙන් සඳහන් කරනවා. මොකද

එතුමාට කියන්න බැහැ යම් සමුපකාර සමිතියක් බංකොලොත් තත්ත්වයට පත්වෙනවා නම් යම් කාරණා කැඩෙනවා නම් කවුරුහරි ඉදිරිපත් කරනවා නම් දෙයියනේ සමුපකාර සාමාජිකයෙක් ගිහිල්ලා තමුන් දාපු මුදල් ටික ගන්න බැහැ කියලා කවුරුහරි චෝදනා කරලා තියෙනවා නම් ඒ සම්බන්ධයෙන් කරුණු තියෙනවා නම් කාරණා ඉදිරිපත් කරන්න. නැත්නම් සමුපකාර කොමසාරිස්ට එහෙයි වෙච්ච නොවෙච්ච එයා කියන දේවල් නොකරපු සභාපතිවරුන්ට ඉලක්ක කරගෙන ඒ සමිතිය අපි සභාපතිතුමාලත් එක්ක ඒගොල්ලො ඕන ගණුදෙණුවක් කරගන්න ප්‍රශ්නයක් නැහැ. හැබැයි සමිතිය මේ සමුපකාර විෂය ඇමතිතුමාගේත් අපේත් සියළු දෙනාගේත් නෙවෙයි. ඒ ජනතාවගේ ඒ සමුපකාර සාමාජිකයින්ගේ. ඉතින් ඒ නිසා කරුණාකරලා මේ සමුපකාර කොමසාරිස් පිළිබඳව, මොකද අපි මේ සම්බන්ධව පැහැදිලිව දැඩි තීන්දුවක ඉන්න වෙනවා. මොකද කොමසාරිස්තුමාගේ ක්‍රියාකලාපය, මොකද එතුමා එතුමාගේ බලතලත් ඉක්මවා ගිහිල්ලා කටයුතු කරමින් යනවා. ඉතින් ඒ නිසා මම විශේෂයෙන්ම මේ කාරණාව සඳහන් කරන්න ඕන. ඒ අනුව මම ගිය සභාවේදී මේ සම්බන්ධව නිත්‍යානුකූලභාවය එතුමා එවපු ඒ ලියුමේ නීත්‍යානුකූලභාවය පිළිබඳව මම අදහස් දැක්වුවා. ආයතන සංග්‍රහය යටතේ කොහොමද එතුමා එහෙම කියන්නෙ මහජන පැමිණිලි මහජන ගැටළු ඇතිවෙන්න තියෙන ලියුමක් එතුමාට යොමු කරන්න හැකියාවක් තියෙනවද කියන එක නීත්‍යානුකූභාවය පිළිබඳව පැහැදිලි කරලා දුන්නා. ඉතින් ඒකෙදි මම විශේෂයෙන් ඉල්ලීමක් කළා, ඒක ඔප්පු කරගන්න විශේෂයෙන් කොමසාරිස්තුමාගේ ඒ ආයතන සංග්‍රහයේ 27 වෙනි පරිච්ඡේදයේ 24(2) ට අනුකූලව ඒ ලිපි ලෙස දකුණු පළාත් කොමසාරිස් දකුණු පළාත් අමාත්‍යාංශයේ ලේකම් වෙත යොමුකළ සටහන හෝ දකුණු පළාත් සමුපකාර කොමසාරිස් යවන ලිපි පොතේ සහ දකුණු පළාත් සමුපකාර අමාත්‍යාංශ ලේකම්ගේ ලැබෙන ලිපි පොතේ සහතික කළ ඡායා පිටපතක් එදා දවසේ ඉල්ලුවා. හැබැයි මම එදා දවසේ ලේකම්තුමාත් කවුරුහරි නැති නිසා අඩුම ගානෙ ඇමතිතුමත් හිටියෙ නැති නිසා මම කිව්වා හරි. එහෙම නැත්නම් බදාදා හරි. බදාදා කියන්නෙ අමාත්‍යාංශ ලේකම්ලා ඉන්න දවස. ඒ නිසා තමයි මම සභාලේකම්තුමාට ලිඛිතව ඉල්ලීමක් කළේ ඊට පහුවෙනි දින හෝ මේක දෙන්න කියලා. පසුව ඒ නැතිවුණත් කමක් නැහැ කියලා හිතුවා. නමුත් මට මේ වෙනකම් ලැබුණෙ නැහැ. ඒ නිසා ගරු සභාපතිතුමනි, විශේෂයෙන්ම මම කියන්න ඕන මොකද ප්‍රඥප්තිය ගැන කිසිම දැණුමක් නැහැ. ප්‍රඥප්තිය ගේන්න. එදාට අපි සාකච්ඡා කරමු. හැබැයි මම මෙහෙම දෙයක් කියන්න ඕන. මේ ප්‍රඥප්තියේ ලැබුණා මට පිටපතක්. මේ ප්‍රඥප්තියේ පළමුවෙනි පිටුව කියනකොටම මට දැනිච්ච දේ නම් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව උල්ලංඝණය කරලා තියෙනවා.

සභාපතිතුමා:- ප්‍රඥප්තිය ගැසට් නිවේදනය කරපු නැති නිසා ප්‍රඥප්තිය එළියේ කතා වෙන්නෙ මේක පිළිබඳ අපට කියන්න බැහැ. ප්‍රඥප්තිය නියම විදියට ගැසට් පත්‍රයක් ආවම තමයි පළාත් සභාවේ අපට කතා කරන්න පුළුවන් වෙන්නෙ.

චතුර ගලප්පත්ති මහතා:- ගරු සභාපතිතුමනි, ප්‍රඥප්තිය නියාමනය කළ යුතුයි. මොකද යම් යම් දූෂණ වංචාත් තියෙනවා. ඒ ගැන කිසිදු, තරුණ මන්ත්‍රීවරයෙක් විදියට ඒ වගේ දෙයකට අත උස්සන්නෙ නැතුව ඉන්නෙ නැහැ. ප්‍රඥප්තියකට අනිවාර්යෙන් අත උස්සනවා. කිසිම ගැටළුවක් නැහැ. හැබැයි කාරණාව තියෙන්නෙ කොමසාරිස්තුමාට හිතු හිතු වෙලාවට මට මෙතන කියනවා නම් කියන්න පුළුවන් දෙපාතර්මේන්තුවේ කරපු දූෂණ වංචා පිළිබඳව රජයේ විගණකාධිපති කරපු කාරණා තියෙනවා. මේකෙ මට එකින් එක ඉදිරිපත් කරන්න පුළුවන්. දෙපාතර්මේන්තුවේ තියෙන දූෂණ, වංචා. ඉතින් ඒක අපි කරන්න ඕන, ඒවා බලන්න ඕන.සභාපතිවරුන්ගේ නියාමනය අනුව මේ නිලධාරීන් ඉන්නවා. මේ දෙපාතර්මේන්තුවේ නිලධාරීන් කරපු කාරණා සම්බන්ධව මට ඉදිරිපත් කරන්න පුළුවන්. අවසාන මම මේ දේ ඉල්ලන්නෙ ගරු සභාපතිතුමනි, මා විසින් රීති:28 යටතේ 2019.02.12 ට ඉදිරිපත් කරන කරුණු අනුව පිළිතුරක් ලබා නොදුන් බව විශේෂයෙන් සභා වාතර්ාවේ සඳහන් කළා. මොකද මෙවැනි කොමසාරිස්වරයෙක් වෙනුවෙන් ගතයුතු තින්දුව ගන්නවා. එයාට ඕන විදියට කරන්න බැහැ. ඒ නිසා දැඩි ලෙස මගේ ආසනය තුළ, මම දන්නෙ නැහැ අනිත් ආසනවල. දැඩි ලෙස ජනතාව මේ සම්බන්ධයෙන් විමතියෙන් ඉන්නවා. එක පාරටම කියනවා උඩින් ඇවිල්ලා මේ දෙපාතර්මේන්තුව, සමිතිය බංකොලොත්. ඒ නිසා සල්ලි ගන්න. ඉතින් මේ මිනිස්සු සල්ලි ගන්නවා. එහෙම දෙන්න පුළුවන්ද? ඕනම දෙයක තියෙනවා ආයෝජනයක් සහ ඒ ණයකරන බැංකුවක් මේක. ඒ නිසා මම ඉල්ලන්නෙ ගරු සභාපතිතුමනි, මා විසින් රීති:28

යටතේ 2019.02.12 ට ඉදිරිපත් කරන කරුණු අනුව පිළිතුරක් ලබා නොදුන් බව සහා වාතර්ාවේ සටහන් කරන්න. ඒ වගේම මගේ මන්ත්‍රී වරප්‍රසාද බරපතල ලෙස කඩවී ඇත බව සඳහන් කරමින් මම මේ වෙලාවේ මගේ කතාව අවසන් කරනවා.

සභාපතිතුමා:- මේ පිළිබඳව මම හිතන්නෙ අපේ අදාළ අමාත්‍යාංශයට දැනුම් දෙන්නම්. පිළිතුරකුත් ලැබිලා තියෙනවා. ඒක ඔබතුමාට පිටපතක් එවලා තියෙනවා මම හිතන්නෙ. තවදුරටත් මේ පිළිබඳව කරුණු දැන ගැනීමට තිබෙනවා නම් ඇමතිතුමා ආපු දවසක ඇමතිතුමාගේ අවධානය යොමු කරන්නම් මේකට පිළිතුරක් ලබාදෙන්න කියලා. වාචික පිළිතුරු අපේක්ෂාවෙන් ඉදිරිපත් කර ඇති ප්‍රශ්න. ප්‍ර/07/05/19/01 නලින් හේවගේ මැතිතුමා, ගරු ප්‍රධාන අමාත්‍යතුමාගෙන් ඇසීමට.

**06.වාචික පිළිතුරු අපේක්ෂාවෙන් ඉදිරිපත් කර ඇති ප්‍රශ්න.**

ප්‍රධාන අමාත්‍යතුමා:- ගරු සභාපතිතුමනි, වාචික පිළිතුරු අපේක්ෂාවෙන් ඉදිරිපත් කර ඇති ප්‍රශ්න.ප්‍ර/07/05/19/01 - ගරු නලින් හේවගේ මන්ත්‍රීතුමා.

01.ප්‍ර/07/05/19/01 නලින් හේවගේ මැතිතුමා: ප්‍රධාන අමාත්‍ය, මුදල් හා ක්‍රම සම්පාදන, නීතිය හා සාමය, පළාත්පාලන, ප්‍රවාහන, සෞඛ්‍ය හා දේශීය වෛද්‍ය, සංචාරක සහ ඉංජිනේරු සේවා ගරු අමාත්‍යතුමාගෙන් ඇසීමට, (කල්ගන්නා ලද ප්‍රශ්නය).

(අ) දකුණු පළාත් සංවර්ධන අධිකාරිය මඟින් 2014 සිට 2019 දක්වා "පොත් වසන්තය" පොත් සල්පිල අවස්ථා කිනම් ප්‍රමණයක් පැවැත්වූයේද?

අවස්ථා දෙකයි.

(ආ) එම පැවැත්වූ අවස්ථාවලට අදාළව වෙන් වෙන්ව, වියදම්කල සම්පූණර් මුදල කොපමණද? ඒ යටතේ ප්‍රචාරක වියදම්, ආහාර වියදම් වෙන් වෙන්ව සඳහන් කරන්නේද?

ඔව්. ඒ යටතේදී 2017 වසරේදී වියදම්කල සම්පූණර් මුදල රුපියල් 31,06,495.12 යි. එයින් ඒ තුළ තියෙනවා ආහාර වියදම රුපියල් 96,700.00 යි. ප්‍රචාරක වියදම රුපියල් 5,16,250.00 යි. ඒ ආහාර වියදම සහ ප්‍රචාරක වියදම දෙකම අර සම්පූණර් වියදමට ඇතුලත්වයි ගරු සභාපතිතුමනි, තියෙන්නෙ. 2018 වෂර්යේදී වියදම් වූ සම්පූණර් මුදල 41,46,753.00 යි. එය තුළ තිබෙනවා ආහාර වියදම රුපියල් 1,19,216.00 යි. ප්‍රචාරක වියදම රුපියල් 6,96,600.00 යි.

(ඇ) එම පැවැත්වූ අවස්ථාවලට අදාළව ලැබූ ආදායම වෙන් වෙන්ව සඳහන් කරන්නේද?

ආදායම ගරු සභාපතිතුමනි, 2017 වසරේ රුපියල් ලක්ෂ 35 යි. 2018 වසරේ රුපියල් 86,8,975.00 යි.

(ඈ) වියදම අභිබවා ආදායමක් ලැබුවේ නම් එම මුදලින් කරනු ලැබූ කායර්යන් සඳහන් කරන්නේද?

ගරු සභාපතිතුමනි, 2017 වසරේ එම පොත් ප්‍රදශර්නය පවත්වන අවස්ථාවේදී දකුණු පළාතේ ඉතාම දරුණු ගංවතුර ඇතිවෙලා තිබුණා. මේ ගංවතුර ඛේදවාචකය නිසා ප්‍රදශර්න කුටි වෙන්කර ගත් පොත් ප්‍රකාශකයන් පවා ගරු සභාපතිතුමනි, අවසාන මොහොතේ අවලංගු කළා. පසුව මමත් පෞද්ගලිකව මැදිහත් වෙලා ආයතන ගණනාවකට කතාකරලා තමයි ඒ වැඩ කටයුත්ත කළේ. ඒ නිසා 2017 වසරේදී ලැබුණු ආදායම ලක්ෂ 35 ක් වුණා. හැබැයි 2018 දී එය 86,8,975.00 ක් දක්වා වැඩිකර ගන්න පුළුවන්කම ලැබුණා. ඒ වෙනකොට පොත් ප්‍රකාශකයන් කීවේ කොළඹ බණ්ඩාරණායක ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාවේ පැවති පොත් ප්‍රදශර්ණයෙන් පසුව අගනුවරක තිබුණු සාථර්කම පොත් ප්‍රදශර්නය මේකයි. ඒ නිසා මේ වැඩපිළිවෙල අඛණ්ඩව කරගෙන යන්න කියන ඉල්ලීම තමයි ඇතිවෙලා තියෙන්නෙ. ඒ නිසා අපට 2017 වසරේදී ලැබුණු ලාභය රුපියල් 3,93,504.88 යි. හැබැයි 2018 දී එය රුපියල් 44,62,222.00 ක් බවට වැඩිකර ගන්න පුළුවන්කම ලැබුණා. මේ සියළුම ලාභය දකුණු පළාත් සංවර්ධන අධිකාරියේ ආදායම් ශීෂර්යට බැරකරලා තියෙනවා. සියල්ල බැංකු ගතකරලා තියෙනවා.

(ඉ) නොඑසේ නම් මන්ද? අදාළ නොවේ.

සභාපතිතුමා:- නලින් මන්ත්‍රීතුමා, කල් තබන අවස්ථාවේ ඇසූ ප්‍රශ්නයට මම සභාගත කරනවා. ප්‍රධාන අමාත්‍යතුමා එවල තියෙන පිළිතුර සහ ඔබතුමාගේ එකට පිළිතුරු ලැබිලා නැහැ. ඒක න්‍යාය පත්‍රයට ඇතුලත් කරලා දාන්නම්, ඊළඟ සභාවේදී. පිළිතුරක් එවලා නැහැ තවම. ඊළඟට

යෝජනා. යෝ/07/5/19/03 අතුල වෙළඳගොඩ මැතිතුමා.

## 07.යෝජනාව

අතුල වෙළඳගොඩ මහතා:- ගරු සභාපතිතුමනි, අද දින මා විසින් දකුණු පළාත් සභාවේ න්‍යාය පත්‍රයට ඉදිරිපත් කර ඇති යෝජනාව "ලාංකීය ජන සමාජය වතර්මානය වනවිට ඉතා සංකීණර් අබර්ුද රාශියක පැටලි ඉන් ගොඩ ඒමට නොහැකි තත්ත්වයක ගිලෙමින් සියළු පුරවැසියන් පීඩාවට පත් වෙමින් එහි ගොදුරු බවටද පත්වෙමින් සිටී. මත්ද්‍රව්‍ය, පාතාල මිනිස් ඝාතන ඇතුළු සමාජ අපරාධ දිනෙන් දින වැඩිවෙමින් දකුණු පළාත තුලද වාතර්ාවන ප්‍රවෘත්ති අතර, තරුණ පරපුර විනාශ වෙමින් සිදුවන සිදුවීම් මෙම තත්ත්වය ඛෙදවාචකයක් වි අවසාන ළමා පරපුරද එම ඛෙදවාචකයේ ගොදුරු බවට පත්වෙමින් පවති. තත්ත්වය එසේ වුවත් මානව සමාජය මීට වඩා යහපත් පරිවතර්නයක් කරා පියවර තැබීමට නම් සංස්කෘතික මිනිසා තුළින් කලාව හා ක්‍රීඩාව තුළින් එම ගමන සඳහා ලබාගත හැකි දායකත්වය සුවිශාල කාය්ර් භාරයක් ඉටු කරන බව අපි දනිමු. ඒ සඳහා දකුණු පළාත් සභා සංස්කෘතික කලා ක්‍රීඩා අමාත්‍යාංශය මධ්‍යම ආණ්ඩුවේ එම වගකිව යුතු අමාත්‍යාංශ සමග එක්ව් ඒ සඳහා වැඩපිළිවෙලක් නිමර්ාණය කර එය ක්‍රියාවට කඩිනමින් නැගීමට කටයුතු කළ යුතු බව මෙම සභාවට යෝජනා කර සිටින්නීය." මෙම යෝජනාව අද දවසේ මම ඉදිරිපත් කරමින් අද දවසේ මේ යෝජනාව වෙනුවෙන් සුදානම් වන වෙලාවේ අපේ සංස්කෘතික, ක්‍රීඩා කටයුතු ගරු ඇමතිතුමා සඳහනක් කළා මෙම යෝජනාව මීට කලින් ඉදිරිපත් වුණානම් හොඳයි කියලා අදහසක්. අද දවස වනවිට අපට පළාත් සභා නිල කාලය සම්බන්ධයෙන් අදහසක් තියෙනවා. නිල කාලය සභාවක් විදියට අවසන් වුණාට අපි දන්නවා ගරු සභාපතිතුමනි, මම ඉදිරිපත් කල අදහස සහිත අපි ජිවත්වන වටපිටාව කියන එක අප්‍රේල් මාසයෙන් නතර වෙන්නේ නැහැ. මේක තවත් සංකීණර්ව අපට පේනවා මේ අබර්ුදයන් තුල ගොඩ ඒමට නොහැකිව තවත් ඛෙදවාචකයන් සිදු වෙමින් පවතින වටපිටාවක ඉතා සංකිණර්ව අපි දකිනවා තව ඉස්සරහට ගලාගෙන යනවා. අපි දකිනවා පළාත් සභාවේ නිල කාලය අවසන් වෙන්නෙ නැහැ. සභාවේ නිල කාලය අවසන් වෙන්නේ. ඒ නිසා මම කලිනුත් මතු කළා මේ සභාවේදි වැඩපිළිවෙලක් නැති රටකට වැඩපිළිවෙලක් නැතිව අපි සැහෙන්න කාලයක් පුරා අත්විදිමින් ආපු මේ ගමනේදි මේක පළාත් සභාව කියන අපේ නිල කාලයට අයත් වන එකක් නොවෙයි. ඒ අමාත්‍යාංශයේ ක්‍රියාකාරීත්වය ඒක විශ්වාස කරනවා ඉදිරියේදි පත්වන පළාත් සභාවක වැඩපිළිවෙලක අපි සුදානම් කරනවා. යෝජනාවක් විසින් අපි මතුකර දෙන්නේ ඇත්තටම අපි කාටත් මේ වන කොට ඒ නිසා වෙන කිසිවක් කතා නොකළත් ගරු සභාපතිතුමනි, කතා කරන්න වෙලා තියෙන අපේ රටේ ඇත්ත සමාජ ආථර්ීකය සංස්කෘතික ඛෙදවාචකය දිනෙන් දින අපි කාටත් ජිවත් වෙන්න වටපිටාවක් ජිවත් වෙන්න සඳහා සුදුසු පරිසරයක් නොවෙයි අත්විදින්නේ. බරපතල සුදුසු වටපිටාවක් නොවන බවට ජිවත්වීම සඳහා සුදුසු පරිසරයක් නොවෙයි මේ අපි අත්විදිමින් තියෙන්නේ. ඒ නිසා මේ මානව සමාජයේ බරපතල ඛෙදවාචකයක් යන ගමනකදි අඩුම තරමින් සංස්කෘතික හා කලා කටයුතු අමාත්‍යාංශයත් ක්‍රීඩා කටයුතු අමාත්‍යාංශයෙන් ජාතික වශයෙන් තියෙන මම යෝජනා කරලා තියෙන විදියට අමාත්‍යාංශ සහ සියලු සංස්ථා මේ හැම දෙයක්ම පොදු එක ගුණාත්මක නිශ්චිත වැඩපිළිවෙලකට රැගෙන ඒමේ මූලික පියවරක් විදියට අපි විශ්වාස කරන ඒ සමාජ පරිවතර්නය වෙනුවෙන් අපි විශ්වාස කරනවා වෙනසක් ඕන. ඒ වෙනස මොන වගේ වෙනසක්ද කියලා කතා කිරිමේදි අපි විශ්වාස කරනවා ඒ සඳහා නිශ්චිත වගකීම් සහිත කාය්ර් භාරයක් මේ අමාත්‍යාංශ හරහා සිදුකරන්න පුළුවන්. ඒ නිසා තමයි මේ යෝජනාව වෙනුවෙන් අරමුණ විදියට මේ සභාවට ඉදිරිපත් කළේ. අපි දන්නවා 21 වන ශතවෂර්යේ මේ වනවිට ලාංකීය සමාජව අපි ඇවිත් නතර වි තියෙන තැන. ඒ නිසාම ගරු සභාපතිතුමනි, අපි කතා කල අබර්ුදයෙන් ගොඩ එන්න අපට මොකක්ද තියෙන සැලැස්ම මොකක්ද. ඒ සඳහා තියෙන ප්‍රතිපත්තිය මොකක්ද. ඒ වැඩපිළිවෙල ප්‍රතිපත්තිය මත අපි යෝජනා කරන අපි බලාපොරොත්තුවන විසඳුම මොකක්ද. ඒ නිසාම තමයි අපට සිද්ධ වෙලා තියෙන්නේ මෙවැනි යෝජනාවක් අරගෙන සංස්කෘතික මධ්‍යස්ථානයකට එහෙම නැත්නම් කොහේ හරි තියෙන ක්‍රීඩා සමාජයකට භාණ්ඩ ටිකක් ඛෙදන, නැත්නම් අපි මේ ටික කළා කියන මොකක් හරි එවැනි සටහනකට ඔබ්බට ගිහිල්ලා මේ වෙනුවෙන් රට සමාජය අපි විශ්වාස කරනවා දැවැන්ත කාය්ර් භාරයක් පවර ගන්න ඕන. ඒ නිසා දැවැන්ත සංස්කෘතික පරිහානියක අපේ රට ගිලිලා තියෙන වෙලාවක අපි කියන්නේ සංස්කෘතිය කියලා කියන්නේ ඒ සංස්කෘතියට බැදිලා අපි මානව සමාජගත දේවල් වලින් ගරු සභාපතිතුමනි,

සංස්කෘතිය කියන  එක අද ඊයේ ඇතිවුණ එකක් නොවේ. මුළු මහත් සමාජය පුරාම ශික්ෂණය හරහා ලබාගත්ත සියළු දේවල් වලට එකතුවක්. ඒ එකතුවේ තිබෙන ඒ සියළු දේවල් අපි දන්නවා මේ සංවර්ධන සමාජ සේවය කරන්න ඕන අංග ඒ සමාජ සේවය කිරීමෙන් දැන් බැහැර වෙමින් අපි දන්නවා ඒවායින් අත්මිදිමින් දැන් වෙනත්, වෙනත් අරමුණු ඔස්සේ ක්‍රියාවෙමින් පවතිනවා. වෙළඳපොල ආර්ථිකයක් ඇතුළේ තමයි ගණන් බැලීමක් ඇතුළේ තමයි ඒ හැම දෙයකටම දැන් මිලක් සහිතව තමයි මේ හැම දෙයක්ම සිදුවෙමින් පවතින්නේ. ඒ නිසා එක වෙලාවකට කියනවා මේ සංස්කෘතිය කන්නද. ඉතිහාස විෂය මොකටද කියලා අහපු ප්‍රශ්න කරපු ඉතිහාසයට අයින් කරපු ඉතිහාසයකුත් අපට හමු වෙනවා. දැන් ගත්තොත් එහෙම ඉතිහාසය දැන් ඊට වඩා වැඩියෙන් කතා බහට ලක් වෙනවා. ඒ කතා බහට ලක්වීම හරහාම දැන් සංස්කෘතිය සම්බන්ධයෙන් දැවැන්ත ඉතිහාසයක් ගැන කතා කරනවා. අවුරුදු 2500 ක සභ්‍යත්වයක් ඒ මහා දැවැන්ත ශිෂ්ඨාචාරයේ උරුමය ගැන පරපුරක් ගැන කතා කරනවා. ඒ පරපුර මත අපි සියළු දෙනාම දැන් ඒ අභිමානය සහිත පුරවැසියෝ වෙනවා. ඒ වෙනුවෙන් අපට පේනවා නොයෙක් වේදිකාවල නොයෙක් නොයෙක් කාලයන් තුළදි අඩුවැඩි වශයෙන් ඒ සංස්කෘතියත්, ඉතිහාසයත් නැවත නැවත පරම්බාමින් මේක ඇතුළේ අපි දෙන නොයෙක් අරමුණු ජයග්‍රහණය කර ගන්න අපි දන්නවා විවිධ අවස්ථාවල සමාජ පද්ධති, කණ්ඩායම් සමත් වෙනවා. ඒ සමත්වුණාට පස්සේ ඒ ජයග්‍රහණය අපි බලාපොරොත්තු වන තැනට අපේ රටේ ආර්ථිකය සංස්කෘතික, සාමාජීය වශයෙන් සියළු ජනතාව මුහුණ දෙන අභියෝග සාර්ථකව ඉස්සරහට යන්න අන්න ඒ අතිතයෙන් අපි කතා කරන පාරම්බාන වතර්මාන මිනිසා ශ්‍රී ලාකීය මිනිසා අපි ගත්තොත් එහෙම නැවත අපි ඉදිරිපිට අපට හමුවෙනවා. ඒනිසා ඒ වතර්මාන මිනිසා අපි සොයාගන්න ගියාම අපට තියෙන්නේ වතර්මාන මිනිසාගේ අද ශ්‍රී ලංකීය මිනිසාගේ ඉරණම මොකක්ද. ඒ නිසා අපි සවස ප්‍රවෘත්ති බැලුවොත් එහෙම පැය භාගයක් ඇත්තටම ගරු සභාපතිතුමනි, ජනතාව වෙනුවෙන් දෙකොටියක් වන මේ රටේ ජනතාව වෙනුවෙන් එකම ප්‍රවෘත්තියක්වත් ප්‍රවෘත්ති ලෙස ජනමාධ්‍ය වාතර්‍ා කරන්නේ නැහැ. ජනමාධ්‍ය වාතර්‍ා කරනවා තමයි සිදුවන ක්‍රියාදාමය. නමුත් ජනතාවට එයින් ඇතිවන ප්‍රතිඵලයක් අපට පේන්නේ නැහැ. හැබැයි ඒ හැම ප්‍රවෘත්තියක් අවසානයේම අපට පේන්නේ හැම ප්‍රවෘත්තියක්ම අවමඟුලක්, ඛෙදවාචකයක්. මට ලැයිස්තුව අනුව කියා ගෙන යන්න පුළුවන්. ප්‍රවෘත්ති යනු අවමගුල් දැන්වීම් යටතේ අපට විග්‍රහ කරගෙන යන්න පුළුවන් දිගටම. ප්‍රවෘත්ති විතරයි අපට නැත්තේ. අනෙක් සියලු ඛෙදවාචකයන්වල එකතුව අපට තියෙනවා. ඒ නිසා ගෙදරින් එළියට බහින අට දෙනෙක් ආපසු ගෙදර එන්නේ නැහැ. අසූ එක් දෙනෙක් ස්පිරිතාලේ. යුද්ධයෙන් අපට අහිමි වෙච්ච සංඛ්‍යාව 05 යි. රිය අනතුරු වලින් අපට අහිමි වෙච්ච ජීවිත අටක් අහිමි වෙනවා. එතැන් සිට ගත්තොත් අනෙකුත් සියළුම ඛෙදවාචක පිටුපස්සේ තියෙන්නේ ලාභය මුල්කර ගත්ත සමාජයක් තුල ඉතා වේගයෙන් පිරිහෙන මිනිස්සුන්ට මනුෂ්‍යාත්වයෙන්, ලෙන්ගතුකමින් සිනාවෙන් හෘදයාංගවම අනෙකාගේ සිතුම් පැතුම් තේරුම් අරගෙන එවැනි මානව සමාජයක ගරුත්වය සහිත මානව සමාජයක ජීවත් වෙන්න අහිමි කරමින් යද්දි ඒ මත නිමර්‍ාණය වන ඛෙදවාචක අපි ප්‍රවෘත්ති විදියට කියවනවා. අපි විශ්වාස කරනවා මෙතනින් එහාට ගමනක් ශ්‍රී ලාංකීය ජන සමාජය අපි බලාපොරොත්තු වෙන්නේ කවදද, කොහොමද කියන එක. අපි අනෙක් පැත්තෙන් ගත්තොත් ඊට අමතරව ගත්තොත් එහෙම අපට ඉලක්ක, අභියෝග අපි ඉතා විශාල වශයෙන් අරගෙන තියෙනවා කෙටියෙන් ගත්තොත් ගරු සභාපතිතුමනි, අපට ණය ගෙවන්න තියෙනවා. රටක් විදියට. කොච්චරද ඇහැව්වොත් ඔබතුමාත් දන්නවා අපි මොනවා කතා කළත්,කොහෙන් හරි ඇවිල්ලා කතා කලත් අවසානයේ මොන වැඩපිළිවෙල කතා කළත් කොහෙන් ඇවිල්ලා කතා කරලා ගණන් බැලුවත් ඔබතුමා දන්නවා දැන් ඩොලර් එක 180 යි. 1948 ට කලින් අපි ලෝකය ගත්තම ගණන් හැදුවේ අපේ රටේ විදේශිය ගණුදෙනු කළේ පවුම් වලින්. ඊට පස්සේ තමයි ඩොලර් එක කියන එක අපට ඇවිල්ලා ඩොලර් වලින් ගණන් හදන්න පටන් ගත්තේ. ඩොලර් එක පටන් ගත්ත එක දැන් ගත්තොත් එහෙම අපි දැන් ඉන්නේ රු: 180/- වේ. අපට මොකද මේ වුණේ. ආර්ථිකමය වශයෙන් තිබුණ සමාජ ගරුත්වය හාමුදුරුවනේ එතනින් එහාට වෙන කිසි දෙයක් ගැන කතා කරන්න බැහැ. හදනවා ආර්ථිකය. ආර්ථිකයේ තියෙන මූලයන් සියල්ලම ගසාගෙන ගිහිල්ලා අපි මහා දැවැන්ත ණය කන්දක එතනින් මතුවෙන්නාවූ සියළු ප්‍රශ්න සංස්කෘතික ප්‍රශ්න සමාජීයීය ප්‍රශ්න මේ සියල්ලක්ම මේක යට සැඟවිලා තියෙන්නේ. ඒ නිසා තමයි අපි විශ්වාස කරන්නේ ආර්ථිකය ශක්තිමත් පදනමක් සහිතව ඒ ජයග්‍රහණ ලබා ගත්ත ඕනෑම රටක් සංස්කෘතික

වශයෙනුත් ක්‍රීඩාව, කලාව මේ සියල්ලන්ගේම අනේකවිධ ජයග්‍රහණ අත්පත්කර ගනිමින් ලෝකය ඉදිරියට අපි යනවා. තමන්ගේ ප්‍රජාව, තමන්ගේ රට සුරක්ෂිත සමාජයක් විදියට ඉතා ඉහලට අරගෙන ගිහින් තියෙනවා. සැම දශර්කයක්ම ඉදිරියෙන් ඉන්නවා. ඒ නිසා දැන් අපි ඉන්නේ කුමන දශර්න වලින්ද ඉදිරියේ. ලෝකය ඉස්සරහ දැන් තියෙන තැන ගත්තොත් එහෙම ඉදිරියේ අපි දන්නවා අපට කතා කර ගන්න බැහැ. අපට කන්දෙකේ ඇඟිලි ගහ ගන්න වෙනවා. ඇස්දෙක වහ ගන්න වෙනවා. තේ, රබර්, පොල් කියන අපේ විදේශ විනිමය අපි ලියපු ලියවිල්ල මම ඉගෙන ගන්න කාලයේ ලියපු ලියවිල්ල දැන් වලංගුයි. ඊට ආදේශිත වෙච්ච කිසියම් වූ නිෂ්පාදනයක් අපේ රටේ තියෙනවද. ඊට අමතරව කමර්ාන්ත පද්ධතියක් තුළින් අපි ලබා ගත්ත කිසියම් ආථර්ික ශක්තියක් අපට තියෙනවද. එහෙම කිසිවක් නැහැ.අපි දන්නවා අපේ ගරු හාමුදුරුවනේ අපට තියෙන්නේ විදේශ විනිමය මැද පෙරදිග ශ්‍රම වෙළෙඳපොල. මැද පෙරදිගට අපේ අම්මලා, අක්කලා මෙතනට තල්ලු කරන සිස්ටම් එකක්නම් එවැනි තැනකට නම් පත්වෙලා තියෙන්නේ ඒක හරහා අපි ලබාගත්ත ජයග්‍රහණ පරාජයට අපට පේනවා දැවැන්ත සමාජ බෙදවාචකයක් ඒ හමුවේ නිමර්ාණය වෙමින් තියෙනවා. වෙන උත්තරයක් නැහැ අපට. ඒ නිසා ලෝකයට අපි දැන් ශ්‍රමිකයො නොවෙයි දෙන්නේ. වහල් වෙළෙඳාමක අපි ඉන්නේ. අපි ගෙදර හදාගත්ත සරුංගලය, වෙසක් කූඩුව, කැටපෝලය පවා ගේන්න විදේශීය රටකින් නම් ගෙවන්න වෙන්නේ ඩොලර් වලින් තමයි රුපියල බාල්දු වෙනවා. අවසානයේ ගත්තොත් 180 යි කියනනේ ගරු සභාපතිතුමනි, අවුරුදු 71 ක් අපි කවුරුත් දන්නවා අපි කවුරුත් මේකට සම්බන්ධ වෙලා මේ පාලනයට සම්බන්ධ වෙලා ආණ්ඩු හදලා මේ සියළු ප්‍රතිපත්ති හදලා අපි සම්බන්ධ මොකක්ද වෙලා තියෙන්නේ ඩොලර් එක වැඩිවෙලා තියෙනවා. රුපියල අඩුවෙලා තියෙනවා. ලංකාව කියන රට අපි වත්කමකින් බැලුවොත් එහෙම රුපියල කඩා වැටිම කියන්නේ රුපියල අවප්‍රමාණයවීම කියලා කියන්නෙ අපේ සංචිත අඩුවෙලා. මේ සියල්ලක්ම අපේ නිෂ්පාදන වලින් තොර නිෂ්පාදනය සම්බන්ධයෙන් අපට අදහසක් නැති ලෝකයෙන් ණය අරගෙන මොනවා හරි දෙයක් විකුණලා සේවයක් සම්පාදනය කරලා ඔහේ ඉබාගාතේ ආථර්ිකය යනවා. අපට තියෙන්නේ අතපතගාන්න අඳුරේ. අපි අඳුරේ අතපතගාමින් ඉදිමින් තමයි ටික දෙනෙක් විශ්වාස කරනවා මෙයින් අපට දිනන්න පුළුවන්. මේක ජයග්‍රහණ ගන්න පුළුවන් අපි කාටහරි මොනව හරි දෙයක් ලබා ගන්න පුළුවන්. සිතුවිල්ලෙන් අපි සියල්ලක්ම වැඩ කරනවා. ඒ නිසා අධ්‍යාපනය, සෞඛ්‍ය ඇතුළු මේ සියලු දේම ඉලක්කයට සම්බන්ධ වෙලා තියෙනවා. ජාතික දැක්මක් මේක දිහා බලාගෙන මොකක්ද කරන්න ඕන. මේක පක්ෂයක ප්‍රශ්නයක් නොවෙයි. නැත්නම් දේශපාලන ප්‍රශ්නයක්ද මේ. අපි විශ්වාස කරනවා අපට ඕන ජාතික පළල් වැඩපිළිවෙලකට මේ සියළු දත්තයන් එක්ක එක තැනකට අපි එන්න ඕන. අපි විශ්වාස කරනවා ඒ සදහා ඉතිහාසයේ කතාවක් මතක් වෙනවා. ගරු සභාපතිතුමනි, සුර අසුර යුද්ධය. සුරඅසුර කියලා යුද්ධයක් තිබුණා පරණ දේව කතාවල තමයි ඒක එන්නේ. සුරයන් සහ අසුරයන් අතර යුද්ධයක් තියෙනවා. මේ යුද්ධයේදි දෙපාශර්වයටම ඕන ජයග්‍රහණය කරන්න. අවසානයේදි වෙනදේ තමයි සුරයන් කියන්නේ දෙවිවරු. අසුරයන් කියන්නේ දෙවිවරු නොවන අය. සුරයන්ට උවමනා වෙනවා යුද්ධයේ නොමැරි ඉන්න. යුද්ධයේදි නොමැරි ඉන්න නම් අනිවායර්යෙන්ම ඔවුන්ට අමෘතය සොයා ගන්න වෙනවා. අමෘතය පානය කළෝතින් නොමේරු ඉන්න පුළුවන් කියන තත්ත්වයට ඔවුන් පත්වෙනවා. ඊට පස්සේ කොහේද අමෘතය කියලා සොයනවා. අමෘතය තියෙන්නේ මහ මුහුදේ. කිරි මුහුදේ තමයි මේ අමෘතය තියෙන්නේ. අමෘතය සොයා ගෙන දෙපාශර්වයේම සුරයන් සහ අසුරයන් දෙපාශර්වයම එකතු වෙලා ඒ වෙනුවෙන් වැඩපිළිවෙලක් හදනවා. මේක සොයා ගන්න නම් කිරි මුහුද කළම්බන්න ඕන. ඊට පස්සේ අපි අහලා තියෙන කතාවල තියෙන්නේ මහාමේරු පවර්තයේ අනන්තනම් නාගරාජයා ගැට ගහලා නාගයා දෙපැත්තෙන් අල්ලලා කිරි මුහුදට දාලා කැළම්බුවා කියලා. කැළම්බුවාම මේකේ ගොඩක් දේවල් මතුවෙලා තියෙනවා. හොද දේවල් මතුවුණා නරක දේවල් මතුවුණා. නොයෙක් නොයෙක් දේවල් එළියට ආවා. ඒ අතරේ පොඩි භාජනයකුත් ආවා. ඒ භාජනය අමෘතය කියලා හිතාගෙන ඉස්සෙල්ලාම පානය කල අයට ඒක පානය කළේ අසුරයෝ. ඒකේ තිබුණේ මත්පැන්. ඊට පස්සේ මොකද කළේ තව ටිකක් සොයාගෙන සොයාගෙන යද්දි අන්න අන්තිමට හමුවෙනවා අමෘතය. එතකොට සුරයන් මේ අමෘතය පානය කරලා ඔවුන් අමරණීය වුනා කියලා කියනවා. මේ කතාවේ අපට ගත්තොත් මොකක්ද තියෙන්නේ. දැන් අපි මේක කලම්බනවා. කලම්බලා, කලම්බලා අපට අන්තිමට හම්බ වෙලා තියෙන්නේ මොකක්ද.

අපට හම්බ වෙලා තියෙන්නේ ගරු සභාපතිතුමනි, ඔබතුමා දන්නවා මතින් පිරිච්ච රටක් තියෙන්නේ. එහෙමනම් අපි දැන් විශ්වාස කරනවා අසහනයට පත් ආර්ථිකය රටකට එවැනි මිනිස් ප්‍රජාවකට තව දුරටත් අපි විශ්වාස කරනවා ජීවිතය හැර ඔවුන්ට වෙන වටිනා දෙයක් නැත්නම් ඉලක්කයක් නැත්නම් අනිවාර්යයෙන්ම විශ්වාස කරනවා එවැනි සමාජයකට ගමනකුත් නැහැ. හෙටකුත් නැහැ. අද විතරයි මේ මොහොතේ විතරයි. එහෙමනම් දැන් එදා වේලට විතරක් ජීවත් වෙන මිනිස්සු එදා වැඩ කටයුතු කරන මිනිස්සුන්ට රස වින්දනය, මේ ජීවිතයේ තියෙන වටිනාකම ඊලග සමාජයක් වෙනුවෙන් මොකක්ද කරන්නේ කියන දැක්ම දැන් ක්‍රමානුකූලව ගිලිහිමින් පවතිනවා. ඒ අබර්ුදය තුළින් කුමක් හෝ එවැනි ආර්ථික බිද වැටීමක් පමණයි. ඒ නිසා අපි දන්නවා පසුගිය දවස්වල දකුණු පළාත විදියට ගත්තත් බේරුවල අපට වාතර්‍ා වෙනවා මුහුදේ කුඩු කිලෝ 231 ක් රු: කෝටි 280 ක කුඩු ප්‍රමාණයක් අපට වාතර්‍ා වෙනවා. ඊට කලින් 2016 ඔබ තුමාට මතකයි වැඩිම කුඩු ප්‍රමාණය කොළඹදි කුඩු කිලෝ 261 කක් රුපියල් කෝටි 1850 ක කුඩු. ඊට පස්සේ අපට කන්ටේනර් පිටින් හම්බ වුණා ඔරුගොඩවත්තේ. රුපියල් කෝටි 250 ක කුඩු. අපේ රටේ වාතර්‍ා වෙච්ච ප්‍රධාන මෙහෙයුම් වලදි කුඩු කිලෝ 760 ක් වාතර්‍ා වෙනවා. මේ කුඩු කිලෝ 760 ක් ප්‍රසිද්ධ ජනමාධ්‍ය වල අපි දැක්කා අපට වාතර්‍ා වෙනවා ප්‍රවෘත්ති වලින්. අපි දැන් සංගනයක් කරලා බැලුවට පස්සේ මෙච්චර ප්‍රමාණයක් ගේන්නේ මොකටද කියලා ප්‍රශ්නයක්නේ. අපේ රටේ හෙරොයින් පාවිච්චි කරන කුඩු කියන මේ නූතන මත්ද්‍රව්‍ය අවුරුදු 40 ක් වගේ ඉතිහාසයක් තියෙන්නේ මේකට. හතළිස් පන්දාහක් ඉන්නවා අපේ රටේ කුඩු වලට ඇබ්බැහිවෙච්ච පුද්ගලයෝ. සාමාන්‍යයෙන් ඔවුන්ට අවශ්‍ය දෛනික කුඩු ප්‍රමාණය කිලෝ 4 ක්. අපි අවුරුද්දකට බැලුවොත් එහෙම කුඩු කිලෝ එකදහස් හාරසිය හැටක් විතර ප්‍රමාණයක් අවුරුද්දකට අවශ්‍ය වෙනවා මේ හතළිස්පන්දාහට කුඩු බොන අයට කුඩු විදියට මොනව හරි එන්න ඕන. එතකොට කොහෙන්ද මේවා එන්නේ. ස්වභාවිකව ගත්තොත් එහෙම අපේ රට මහ මුහුදෙන් වටවු භූමියක්. එක්කො ගුවනින් එන්න ඕන. එක්කෝ මුහුදෙන් එන්න ඕන. දැන් කියනවා බලපිටිය. අද හම්බන්තොට. දැන් ගාල්ල, මිරිස්ස. අපි දන්නවා දැන් මුහුදට යන්නේ මාළු විතරක් ගේන්න නොවෙයි. ජාවාරම් කාරයින්ගේ තිප්පොලක් බවටත් පත්වෙමින් තියෙනවා. මේවා සේවා සැපයුම් මධ්‍යස්ථාන බවට පත්වෙලා තියෙනවා. ලංකාව හුවමාරු මධ්‍යස්ථානයක් බවට පත්වෙලා තියෙනවා. අපට තියෙන නම. මුතු මැණික්, රන්රිදී , තේ, රබර්, පොල් මොනවද අපට තියෙන්නේ. දැන් අපි ලෝකයට ඉදිරිපත් කරමින් තියෙන්නේ ඕනෑම එකකට ලංකාව එකේ, දෙකේ, තුනේ සිටින්නේ. සියදිවි හානිකර ගන්නවා. එකේ ඉන්නේ.අපි ගත්තොත් එහෙම පල්ලේහාට ආවොත් එහෙම බෞද්ධ දශර්නය හදා ගත්තේ අමාරුවෙන්.දැවැන්ත සමාජමය බෙදවාචකය හමුවේ අපි හදා ගත්තානම් මොකක් හරි දෙයක් කුඩු පට්ටම් වෙමින් පටන් අරගෙන තියෙනවා වෙන වෙන විදියෙ නම් ටිකක්.ඒ නම් ටික අපට කියන්න බැහැ. මැද පෙරදිග ලක්ෂ 11 ක් වගේ අපේ අම්මලා, අක්කලා ඉන්න පුළුවන්. අපි අහනවා රටේ නිෂ්පාදන ආර්ථිකයක් සඳහා වැඩපිළිවෙලක් තිබුණා වෙසක් කූඩුවක්, සරුංගලයක්, කැටපෝලය චීනයෙන් නම් එන්නේ පුංචි දෙයක් හදා ගන්න බට පතුරු ටිකක් දාලා ඉරටුවක් දාලා මොකක් හරි ටියුබ් එකක් දාලා හදා ගන්න බැරිනම් වෙන නිෂ්පාදන කවර කතාද. අන්න ඒ දෛනික මිනිහාට අවශ්‍ය කරන කුඩු ප්‍රමාණය ගේන කොට මේක තව තවත් අබර්ුදයක් කරා දිග්ගැස්සෙනවා. ඒ නිසා තමයි මගේ යෝජනාව මම කියන්නේ ඒ නිසා මිනිස් සමාජය මීට වඩා යහපත් තැනක් බවට පත් කරනවානම් එවැනි තෙතමනය දැනෙන කදුළු සිනාව තියෙන මිනිස්සුන්ට ආදරය සෙනෙහස දැනෙන අනෙක් කෙනාගේ සංවේදිතාව තවත් කෙනෙකුට දැනෙන එවැනි සමාජයක් කරා මිනිසා රැගෙන යනවානම් මේක කරන්න අපි විශ්වාස කරනවා සංස්කෘතික හා ක්‍රීඩාව කියන මූලික වශයෙන් මම විශ්වාස කළා ඕනෑම මිනිසෙක් නම් ඒ සංවේදිකම හරහා අනිවාර්යයෙන් කලාවෙන් කුමන හෝ අංශයකට කැමැත්තක් තියෙනවා. එහෙම නැත්නම් බෙහෙත් ගන්න ඕන. කාටහරි පෙන්වන්න ඕන. ඒකටත් වැඩපිළිවෙලක් තියෙන්න ඕන. ක්‍රීඩාවත් එහෙමයි. සංස්කෘතික හා කලා කටයුතු ක්‍රීඩා අමාත්‍යාංශය කියන එක අපි දන්නවා අපේ පළාත් සභාවේ ගරු ඇමතිතුමනි, ඉතිහාසය පුරාම අපි කතා කළාට අපේ මධ්‍යම ආණ්ඩුවෙන් පවා පැත්තකට කරලා තිබුණේ. මේ අමාත්‍යාංශය දෙන්නේ පැත්තකින් තියලා අරමුණු ගත්තොත් අපි විශ්වාස කරනවා අනෙක් සියලුම අමාත්‍යාංශ වලට වඩා මුදුනේ තියෙන්නේ සංස්කෘතික හා කලා කටයුතු ක්‍රීඩා කටයුතු අමාත්‍යාංශය කියන එක තමයි මගේ පුද්ගලික අදහස. මෙතනට එන්න අපි විශ්වාස කරනවා මිනිසා

මේ මානව සමාජය ගමන් කරන ගමන දිහා බැලුවොත් ලේසි පහසු ගමනක් නොවෙයි අපි ඇවිල්ලා ඉන්නේ. තාක්ෂණිකව දියුණු කර ගත්ත මෙවලම් අපේ උපකරණත් එක්ක අපට අපේ දේවත්වයෙන් හැගීම් ඉදිරිපත් කරන්න ඕනෑ තරම් මේ තාක්ෂණ ලෝකයේ අවස්ථා තියෙනවා. අපට කරන්න තියෙනවානම් මොකෙන්ද කරන්න ඕන. ගරු සභාපතිතුමනි, මම විශ්වාස කරනවා ඕනෑම හැගිමක් අපට එළියට දාන්න තියෙන්නේ අනිවායර්යෙන්ම කලාවෙන් නැත්නම් ක්‍රීඩාවෙන්. මේ දෙකෙන් තොරව අපට කිසිම හැගීමක් වෙනත් මාවතක් වෙනත් හැගීමක් අපට නැහැ. හැබැයි ඔබතුමා දන්නවා ප්‍රවෘත්ති ඇතුළේ අපි එළියට දාන දේවල් මොනවද කියලා හවස අපි ප්‍රවෘත්ති කියෙව්වොත් තේරේනවා අපි මොනවද එළියට දාන්නේ කියලා.අපි අනුමත කරනවද. ඒ කලාවෙන්ද ඒ ජයග්‍රහණ ලැබෙන්නෙ ක්‍රීඩාවෙන්ද නැහැ. ඛේදවාචක වලින්. අපි දන්නවා තරුණ පෙම්වතෙක් තම පෙම්වතිය ගිල සිර කරලා මරන කොට ඒක බලාගෙන වීඩියෝ කරනවානම් අපි කවියකින්, ගීතයකින්, නාට්‍යකින් චිත්‍රපටියකින් තමන්ගේ හැකියාවක් ඒ වෙනුවට තමන්ගේ කලා කුසලතාවයට අමතරව ක්‍රීඩාවෙන් තියෙන තමන්ගේ දක්ෂතා හැකියා අරගෙන ලෝකයට යන්න පුළුවන්නම් මේ දිවයිනේ ඉපදිච්ච විශිෂ්ඨ මිනිස්සු. අපේ හිටපු සංස්කෘතික ඇමතිතුමා, වීරසුමන විරසිංහ ගරු මන්ත්‍රීතුමා පුද්ගලයො වශයෙන් ගත්තත් අපි දන්නවා එවැනි හැගීම් තියෙන හොද මහජන නියෝජිතයෝ ඉන්නවා. තනි, තනි මිනිස්සු ඉන්නවා. හැබැයි වැඩපිළිවෙලක් තුල සමස්ථ රටක් විදියට අපිට නැහැ. තමන්ට විතරක් වෙච්ච හැගීම් අපට දිනන්න බැහැ. ඒ නිසා අපි කියන්නේ ජාතික ප්‍රතිපත්තියක් තුල මට හම්බ වුණා ඉකෝ කියා ජපානයේ කටයුතු කරලා මේ වෝල්බෝල් ක්‍රීඩාවට දායකත්වය දක්වන ගුරුවරියක් දෙනියාය ප්‍රදේශයේ ඉන්නේ. හුංගම ප්‍රදේශයට ආවා. හුංගම ඉස්කෝළයට. සිංහල පුළුවන් කතා කරන්න. බොහෝම අනුකම්පාවෙන් ඒ වැඩය කරනවා. මම කතා කළාම ඇය කිව්වේ ජපානයේ පොතේ ගරු ඇමතිතුමනි. ලෝකයේ හොදම පරාජිතයො ඉන්නේ ලංකාවේ කියලා. ක්‍රීඩාවේ හොදම පරාජිතයා ඉන්නේ ලංකාවේ. හැබැයි ලංකාවේ මිනිස්සු දන්නවද? දන්නේ නැහැ. ජපානයේ පොතේ තියෙනවා හොදම පරාජිතයා ගැන. ඒ පරාජිතයා ඉන්නේ ලංකාවේ. කරුණාරත්න කියන 1964 ලෝකයේ ඔලිම්පික් උළෙලේ මීටර් දාහ දාහේ හොදම පරාජිතයා. ඔහු හොදම පරාජිතයා වුණේ කොහොමද කියන්න. ඇයි ජයග්‍රහණයක් ලැබෙන්නේ පළවෙනියා වීමෙන් පමණද. නැහැ. අපට හදලා තියෙන්නේ හැම එකකින්ම පළවෙනියා වුණොත් තමයි ජයග්‍රහකයා වෙන්නේ. එහෙම නැත්නම් ජයග්‍රහකයෙක් නොවෙයි. හැබැයි ටොකියෝ ඔලිම්පික් උළේලේ කරුණාරත්න කියන අපේ රටේ පුද්ගලයා ඒ මීටර් දාහදාහේ අන්තිමයා. ලෝකයේ හොදම පරාජිතයා ජපානයේ පොතේ ඔහුගේ නම තියෙනවා. රුව තියෙනවා. ඔහු සම්බන්ධ ලොකු සාකච්ජාවක් අදහසක් ජපානයට තියෙනවා.

වීරසුමන විරසිංහ මහතා:- ඔහු ගැන 6 වන ශ්‍රේණියේ පොතේ වෙනම පරිච්ජේදයක් තියෙනවා.

අතුල වෙළඳගොඩ මහතා:- අපේ රටේ කරුණාරත්න කියලා කිව්වට දන්නවද.වෙනම හදාරන්න ඕන. ඔහු ගියේ රට වෙනුවෙන්. ඔහු ඒ කායර් කළේ. දැන් රට වෙනුවෙන් ගියොතින් විශ්වාස කරනවා ජපානයේ හරි තිව්වොත් එහෙම යනවා කොරියාවේ ගියොත් එහෙම තරගයකට පනිනවා. ප්‍රශ්නය ආථර්කය. පදනම ආථර්කය. එහෙමනම් අපි හිතනවා අපි කඩාගෙන වැටිලා සාමාජීයි, සංස්කෘතික වශයෙන් පිරිහිලා ගරු ඇමතිතුමනි, පිරිහිලා තියෙන වෙලාවක ඇමතිතුමනි, අපට උඩුගම බලා යන්න වෙනවා. ඒ නිසා මේක පුංචි ආරම්භයක් තමයි. හැබැයි පහුවෙලා හරි මේ යෝජනාව ගේන කොට අපට ක්‍රීඩාව සම්බන්ධයෙන් මීට අවුරුදු 4 කට කලින් මම යෝජනාවක් දකුණු පළාත් සභාවට ඉදිරිපත් කරලා යම් පැහැදිළි කිරීමක් කරන කොට ඔබතුමා කිව්වා ඒවැඩපිළිවෙලේ අවශ්‍යතාවය කතා කළා. ඔබතුමාත් දන්නවා දිගින් දිගටම වෙනදේ තමයි අවාසනාවට වගේ අපට එවැනි පුංචි හෝ ආරම්භයක් ගන්න ලැබෙන අවස්ථා තිබුණා වුණත්,ක්‍රියාත්මකවන බවක් අපේ පළාත් සභාව තුල එහෙම සංස්කෘතියක් නැහැ. පළාතට එහෙම මහජන නියෝජිතයින් වශයෙන් ඉදිරිපත් කල යෝජනා සම්බන්ධයෙන් පසු විපරමක් නැහැ. එහෙම තියෙනවානම් මේ අමාත්‍යාංශයට වෙන්නට ඕන. මුදල් වෙන් වෙන්නේ කොහොමද. පාවිච්චි කරන්නේ කොහොමද. කුමක් සදහාද. ඒ නිසා ජයග්‍රහණ කියන්නේ ඕනඔය ආකාර. දැන් නතරවීමක් වෙලා තියෙනවා. ඒ නිසා සමාජය එකතැන හිරවෙලා තියෙනවා. ඒ නිසා මේක වෙනස් කරන්නනම් මොකක්ද අපි කරන්න ඕන කියන සාකච්ජාව මේ තියෙන අමාත්‍යාංශ වල හරි ඊට වඩා

වැඩි බලයක් ජවයක් සහිතව වැඩ කරන්න පුළුවන් විදියේ ධාරිතාවයක් දීලා පනක් දීලා අපි විශ්වාස කරනවා මේවා උඩට ගන්න තරමට තමයි අපි විශ්වාස කරනවා. ඒ නිසා ඊළග පරම්පරාව වෙනුවෙන් අපි යමක් කළා වෙන්නේ අපි ණය නැති මිනිස්සු බවට පත්වෙන්නේ අපේ යුගයේ කායර් භාරය කළා වෙන්නේ අපි විශ්වාස කරනවා අපි කරන කිසිම දෙයක් ගරු සභාපතිතුමනි, ප්‍රතිඵල රහිත මොකකට හරි සීමා වෙච්ච වචන හිස් බවට පත්වෙලා තියෙනවා. සුළගේ ගසාගෙන යනවා. බර දේවල් රැඳේන්නේ නැහැ. මේවට බරක් සහිත නම් මේවා ක්‍රියාත්මක වෙන්න ඕන. ඒ තත්ත්වයට පත්වෙන්න අපි විශ්වාස කරනවා අපට කාලය ඕනවටත් වඩා වැඩියි දැන්. අපට රිද්දලා ඇති තරම් ප්‍රවෘත්ති වලින් අපට කියලා තියෙනවා. වහාම වහාම වෙනස්කම් යුතු රටක් මේක. වහාම වහාම වෙනස්කම් වලට ලක්කලයුතු සමාජයකට මේකට වග කියන්න ඕන. ඒ නිසා මොකක්ද කරන්න ඕන ප්‍රශ්නය අපේන් අහනවා. ඒ නිසා අද යෝජනාවේදි මම විශ්වාස කරනවා ගරු සභාපතිතුමනි ඕනකම තිබුණේ කවුරුත් නොවෙයි අපි මේ ඉන්න ආකල්පය අපි පත්වෙලා තියෙන තැන සම්බන්ධයෙන් නැවත හැරි බැලීමක් අපි කර ගන්නට ඕන. ඒ නිසා තමයි ක්‍රීඩාව කිව්වම අපේ දිස්ත්‍රික්කයේත් ගමේ පොල් කොටන් දෙකක් බැදගෙන දෙපැත්තේ බෝලයක් තියාගෙන ජාතික ක්‍රීඩාව හැම ගමකම සවසට අපි එතනට අනිවායර්යෙන් යන්න ඕන. නොගිහින් ඉන්න බැහැ.මේක සුලභ දසුනක්. ගරු සභාපතිතුමනි, මම ඔබතුමාගෙන් අහනවා ඔබතුමා දිස්ත්‍රික්කයේ කොතතරම් යනවද, දකිනවද. ඒහෙම ක්‍රීඩා රිසි පරපුරක් අපට ඉන්නවද. ක්‍රීඩාව කියන එක මොකක් හරි නීතිගත වෙච්ච ආයතනයක හෝ තරග වලට ඇති. මම කියන්නේ ඒක නොවෙයි. ක්‍රීඩාශීලී පරපුරක් ඇත්තටම හිටපු ඇමතිතුමනි, දාම් අදින වැඩිහිටියෝ අඩුම තරමේ කඩයක් ලග නැහැ. ක්‍රමානුකූලව අපි දැන් කවුරුත් කාලය මේ සිස්ටම් එක ඇතුළේ මුදල් සොයන්න. ඒතරම් බරයි ජීවිතේ. ණයයි. අපි කියනවා ආථරීක නිදහස නැතිව ආථරීක සමෘද්ධිමත් භාවය නැතිව මේ එකකටවත් කාලය ඉඩකඩ වෙන්කර ගන්න බැහැ. ඒ අසහනයට පත්වෙච්ච මිනිස්සුන්ට යන්න තියෙන්නේ තැබැරුමට. එහෙම නැත්නම් යන්න තියෙන්නේ අර තිප්පලවල් වලට. ඒ පවුල් වලට අවසන් බෙදවාචකය මැද පෙරදිගට මේක එකිනෙකට සම්බන්ධයි. රටක් විදියට අපි සැලසුමක් හදලා ජාතික ප්‍රතිපත්තියක් හදපු ඒ සියල්ලක්ම භෞතික පාශර්වයත්, අධ්‍යාත්මික පාශර්වයත් දෙකක් තියෙනවා. භෞතික පාශර්වය ඔබතුමා දන්නවා අතින් අල්ලන්න පුළුවන් දේවල්. අපි ඕනතරම් දැන් වැඩිකර ගෙන තියෙන්නේ. අධිවේගී මාගර්, වයිෆයි කලාප, ගුවන් තොටුපල් වරාය වැඩිද, අඩුද සැහෙන්න තියෙනවා අපට. භෞතික පැත්ත අපි සැහෙන්න ඉස්සරහට ගෙනල්ලා තියෙනවා. ගොඩක් පැති වලින්. ඒ හා සමානව අධ්‍යාත්මික පැත්ත ආදරය, කරුණාව, මෛත්‍රිය, සෙනෙහස, දයාව, ලෙන්ගතුකම මේවා අතින් අල්ලන්න බැහැ. හැගීම් පාශර්වය අර අධ්‍යාත්මික පාශර්වයේ දේවල් භෞතික පාශර්වයත් එක්ක ගලපාගෙන මේ දෙක සමබර කර ගෙන යන්න ඕන. ඒ නිසා ආගම දහම කියන එක අපි වෙනදාට වඩා බණ ඇහැව්වට වැඩි පිංකම් කළාට දකින තරමක් දකින්නේ බණ. දකින තරමක් අපි දකින්නේ පිංකම්. හැම තැනම එහෙමමයි. හරයෙන් ගත්තොත් එහෙම පෙනුමෙන් තියෙන තරම් දේවල් දශමයක්වත් අපට පේන්නේ නැහැ මේ සමාජයෙන් ප්‍රගමනය වෙනුවෙන් යමක් සිදුවන බව. සංදශර්ක සංදශර්න මායාවක් යටතේ සගවලා තියෙන්නේ. මේ සියල්ල සංදශර්නයක ගිල්වලා තියෙන්නේ. ඒ නිසා අධ්‍යාත්මික පාශර්වයෙන් ලබා ගන්න ඕන ජයග්‍රහණ රහිතව භෞතික වශයෙන් ලබා ගත්ත දේවල් ටිකක් තියෙනවා. ඒ ඔක්කෝම තියෙන්නේ ණය මත. දැවැන්ත ණයක් මට තියෙනවා. ඒ නිසා කඩා වැටෙන එක දිනෙන් දින සමාජ පරිහානිය කරා තල්ලුවෙන කොට මේක දැන් සමාජ ඛෙදවාචකයක් මත තියෙනවා. ඒ නිසා අපි කියනවා ඕනෑම දෙයක් මුලින් ඇති වෙන්නේ පොඩි ගැටළුවක්. ගැටළුවක් විදියට අපට උත්තරය සොයන්න බැරි වුණොත් ඒක ප්‍රශ්නයක් බවට පත්වෙනවා. ප්‍රශ්නය දැන් ගැටළුවට වඩා පොඩ්ඩක් බරපතලයි. ප්‍රශ්නයට අපට උත්තර සොයා ගන්න බැරිවුණොත් ඒක අබර්ුදයක් දක්වා දික්ගැස්සෙනවා. අබර්ුදය කියන්නේ ටිකක් අමාරු තත්ත්වයක්. අපේ රටත් දැන් අබර්ුදයක තියෙන්නේ. අබර්ුදයේදීත් අපේ හිටපු සංස්කෘතික ඇමතිතුමනි, උත්තරය සොයා ගන්න බැරිවුණොත් අනිවායර් යෙන්ම ඒක කෙලවර වෙන්නේ ඛෙදවාචකයකින්. ඒ නිසා ඒ ඛෙදවාචකයේ කොටස් අපි නරඹමින් තියෙනවා. අත්විදිමින් ඉන්නවා. ඒක වෙනස් කිරිම සදහා අපි විශ්වාස කරනවා දැන් පාට පක්ෂ බේද නොවේ. වෙන පුද්ගල අභිමතාථර් නොවේ. බල අරගලවලදි එහෙම කැලි වලට නොවෙයි. ඒ නිසා අපි ශ්‍රී ලංකා ජාතිය ඇතුළේ අපි විශ්වාස කරනවා ජයග්‍රහණ සොයන්න ඕන ලෝකයට මේ අනාගත පරපුර ගෙනයන්න ක්‍රමයක් අපි සොයන්න ඕන. ඒ

දෙක තියෙන්නේ විද්‍යා තාක්ෂණ ජයග්‍රහණ තියෙනවා. කලාවෙන් තියෙනවා. ක්‍රීඩාවෙන් තියෙනවා. මම විශ්වාස කරනවා මේ හැර මම දන්නේ නැහැ වෙන මොකක්ද. අපි ලොකු රටක් නොවන බව ඇත්ත. ලෝකයේ ජනගහනය ගත්තොත් 70 වෙනි රට. දෙකෝටියකට එහා ජනගහනය ඉන්නවා. මේ පුංචි රටේ අලි 3000 ක් ඉන්නවා.ලෝකයේ විශාලතම සත්වයා. විවිධ හැකියාවන් දක්ෂතාවයන් වගේම විවිධ සම්පත් වලින් අනූනවෙච්ච සුන්දර දිවයින මේ දූපත අපි විශ්වාස කරනවා එවැනි ඛෙදවාචකයකට ලක්වීමෙන් මහා පාප කමර්ය ඉස්සරහ අපි නිහඬව බලාගෙන අපේම දෙයක් අපි තියාගෙන සිටියොත් ගරු සභාපතිතුමනි, අපි කවුරුත් අත්දෙක බැඳගෙන නිහඬව බලාගෙන අපේම දෙයක් වෙනුවෙන් අපි බලාගෙන හිටියොත් අපි කාටත් අර කොටියාට වෙච්චදේ වෙන්නේ. එහෙම වෙමින් තියෙන්නේ. ඒ නිසා මෙතනට ඇවිත් අපි අවංක ප්‍රකාශනයක් අවංක අදහසක් අපට හදා ගන්න පුළුවන්නම් සංවාදයක්. අන්න ඒ සංවාදය මම විශ්වාස කරනවා ඒ සංවේදී මිනිස්සුන්ට පමණයි. අන්න ඒ සංවේදී මිනිස්සුන්ට හැර අන්න ඒ සංවේදී හදවත්, සංවේදී මිනිස්සු තමයි දැන් අපට අඩුවෙමින් තියෙන්නේ. ඒ නිසා දැන් අපට අවසානයේ මේක වෙනස් කිරීම සඳහා තැනකට ඇවිත් තියෙනවා. මෙතනදීත් ඒ අබර්ුදය බේර ගන්න බැරිනම් අපි විශ්වාස කරනවා අපි කාටත් තියෙන්නේ හැමෝම කියනවා වගේ වැඩක් නැහැ මමත් යනවා. යන්න. ඉන්න කෙනා ඉන්නේ හැඟීමකින් නොවෙයි. මේකට වග කියන්නේ නැහැ. අනෙක් අය ඉන්නවා. කරන්න දෙයක් නැහැ. උගතුන් නිසා ඉන්නවා. එහෙම ජීවත් වුන රටක්ද මේක. ඒ නිසා සංස්කෘතික කලා අමාත්‍යාංශය මුල් තැනකට ගෙනල්ලා ජාතික වශයෙන් මම මේක ඉදිරිපත් කළේ. නිශ්චිත වැඩපිළිවෙලක් ඒවට හදලා මොකක්ද යෝජනාව තියෙන්නේ මොකක්ද තරුණ පරම්පරාව වෙනුවෙන් ඊලග පරපුරට තියෙන්නෙ. පළාත් වශයෙන් ඊලග පරපුරට තියෙන්නේ. දිස්ත්‍රික්කය විදියට මොකක්ද තියෙන්නේ. ගරු සංස්කෘතික කටයුතු ඇමතිතුමනි, තවමත් තියෙන්නේ හම්බන්තොට දිස්ත්‍රික්කයට සංස්කෘතික මධ්‍යස්ථාන තුනයි. කටුවන, තංගල්ල එකක් තියෙනවා රන්නෙ අනෙක් එක ලුණුගම්වෙහෙර තියෙනවා. තත්ත්වය ගත්තොත් එහෙම එතන තියෙන සම්පත් ප්‍රමාණය මත කරගෙන එනවා හැරෙන්නට මේ පුළුල්වන වෙනස්වන මේ කතා කරන වටපිටාවට අනුව අපි කතා කරන සංස්කෘතික මිනිසා ක්‍රීඩාශීලී පරපුරට අවශ්‍ය මිනිසා නිමර්ාණය වන මධ්‍යස්ථාන අපට පෙන්නේ නැහැ ඉදි වෙනවා. ඒ වෙනුවෙන් එන්න, එන්න අපචාර. ගරු සභාපතිතුමනි, මම ඉන්න හුංගම නගරයේ බාර් එක තියෙනවා. පෝලිම ගත්තොත් එහෙම ඔබතුමන් දන්නවා. කොළකැඳ කඩයක් ගත්තොත් කොළ කැඳ වීදුරුවක් රු: 30/- යි. වේලි වේලි ඉන්නවා. කවුරුත් නැහැ.1500/- යි 2000/- යි ඒ කවර වගර්යේ මිනිසුන්ද. ඔබතුමන් දන්නවා. ඉතින් මතට තිත නොවේ. වැටලීම් ගැන කතා කරනවා. ආකල්ප. මිනිස්සුන්ට කතා කළොත් එහෙම ඔයා අහන සිංදුව මොකක්ද, චිත්‍රපටිය මොකක්ද. ගමන මොකක්ද. පොත මොකක්ද නම මොකක්ද. ඒවා මොකුත් දන්නේ නැහැ. වැඩ කරනවා, වැඩ කරනවා. කොළ කැඳ කඩය පැත්තක. හොඳ දේට මිනිස්සු නැහැ. මෙවැනි සමාජයක්. අපි විශ්වාස කරනවා ආකල්ප වශයෙන් මේ ගන්න වෙනස මේ පරිවතර්න යුගය නිසා හැම පැත්තෙන්ම අපට බල කරනවා. කතා කරන්න පුළුවන්නම් මේ මාතෘ භූමියට කතා කරන්න පුළුවන්නම් ඇයි මෙච්චර ණය කරන්නේ. ඇයි මෙච්චර මිනිස්සු මරන්නේ. මේ වගේ ඛෙදවාචක ඉස්සරහ මිනිස්සු කීතු කීතු කරලා සමාජ අපරාධ වලින් පුරවන්නේ ඇයි. ඒ නිසා අපි කාටත් සතුටින් ජීවත් වෙන්න පුළුවන් සමාජයක එවැනි ජනතාවක් මේ ජාති ආගම් සියල්ල තියෙනවා තමයි ඒ සංස්කෘතික විවිධත්වය පිළිගනිමින් ගරු කරමින් අපට ජීවත් වෙන්න පුළුවන් සමාජයක් අපට හදා ගන්නට අවකාශය තියෙනවා. අපි විශ්වාස කරනවා මේක වෙනස් කර ගැනීම සඳහා හෙට දවසේදී ඉලක්ක වලට යන්න අපි විශ්වාස කරනවා එවැනි කැප කිරීමක් සහිත, එවැනි දැක්මක් සහිත වැඩපිළිවෙලක් ඕන. ජාතික නායකත්වයක් ඕන. ඒ සඳහා මේ යෝජනාව මතින් බොහෝම කරුණු කාරණා බොහෝමයක් ඉදිරිපත් කරලා තිබුණා වුණත්. එකිනෙකට කියන්න ඕන නැහැ. මේක අපි දන්නවා. මේක අපි අමතක කරලා යන්නේ. ඒ නිසා මෙන්න මේ මායාවේ තත්ත්වය අපි වෙනස් කරලා ඇත්ත ඇති සැටියෙන් කතා කරලා ඉඩක් දෙනවානම් ගරු සභාපතිතුමනි, ක්‍රීඩාව සහ සංස්කෘතික කලා හැකියාව සහිත පරපුරක් වෙනුවෙන් අපි ගමින් බිමින් මට්ටමින් වැඩපිළිවෙලක් අරගෙන යන්න ඕන. ඒ නිසා චිත්‍රපටියක්, නාට්‍යයක් බලන්න යන්නේ නැහැ. රූපවාහිනිය ඉස්සරහ බලාගෙන ඉන්නේ අන්න අර අතිත කාලය ඇතුළේ තියෙන ඔය මොකක් හරි රජ කෙනෙකුගේ එකක් තමයි. එහෙම නැත්නම් මොකක් හරි සාරියක් ඇඳගෙන මාල ටිකක් දාගෙන

හඩ කවපු මොනවහරි මායාවක්, කලාව නොවෙයි. මේවට මොනව හරි මැදහත් වෙලා මේවට එකතු වෙලා කතා කරන්න ඕන අය අපි විශ්වාස කරනවා මේ ඉස්සරහට එන්න බුද්ධිමතුන් අතට ගන්න ඕන. ඒකට අවශ්‍ය කරන වටපිටාව අපි විශ්වාස කරනවා හැදෙමින් පවතිනවා.අපි විශ්වාස කරනවා පරම්පරාව වෙනුවෙන්.අපි කෙටි කාලයයි ඉන්නේ මේ ලෝකයට ඇවිදින් ජිවත් වෙන්නේ. ඒ ජිවත් වෙන කාලය සතුටින් ඉදලා ඊලග පරම්පරාවට ඉතිරි කරලා යන්න ඕන මොන වගේ රටක් ද කියලා ඇහැව්වොත් එහෙම අපි විශ්වාස කරනවා කිසිම උත්තරයක් නැහැ එතන. කිසි කෙනෙකුට දැක්මක් නැහැ. ඒ නිසා අපි කැමති දේ නොවෙයි කරන්න ඕන. රටට ගැලපෙනදේ. අපි විශ්වාස කරනදේ. අපට හොඳයි කියනදේ නොවෙයි. කාටත් හොඳයි කියලා හිතෙනදේ. එකඟ වෙලා මේක තමයි කරන්න ඕනදේ වැඩපිළිවෙලකට ඇවිල්ලා. ප්‍රතිපත්තියකට ඇවිල්ලා. ඒ වෙනුවෙන් අපට කරන්න කොටස කරන්න පුළුවන්නම් දකුණු එවැනි හැගීම් තියෙන හොද මහජන නියෝජිතයෝ ඉන්නවා. පුරවැසියෝ ඉන්නවා ඒ අයගේ අඩුව ඒ අයගේ සොයා ගැනීම ඉදිරිපත් වීමේ ප්‍රශ්නය තියෙන්නේ ඒ නිසා යම්කිසි මුදල්මය හැකියාවක් තියෙන බලයක් තියෙන නෛතික වශයෙන් පවරා ගත් යම් වැඩකොටසක් කරන්න පුළුවන් පළාත් සභාව කියන ආයතනයේදි ගරු වතර්මාන සංස්කෘතික කටයුතු, ක්‍රීඩා ඇමතිතුමනි, මේ සියළු දේ අරගෙන අපි මෙතනින් එහාට පියවරක් තියන්න මෙතනින් එහාට අපි එක අඩියක් තියලා එවැනි දක්ෂ හැකියාවක් සහිත ඉපදීලා ඉන්න, ඉපදෙන්න ඉන්න ඔවුන්ට තැනක් නැතිව ඉන්න දරුවන් වෙනුවෙන් ඉක්මන් වැඩපිළිවෙලක් අපට අවශ්‍යයි. ඒ නිසා මගේ යෝජනාව කෙටියෙන් මගේ කතාව අවසන් කරනවා. මගේ ඉදිරිපත් කිරීම. ශීෂ්‍යත්ව විභාගය පාස් වෙච්ච ළමයින්ගේ මුහුණු ටික දාලා විදුහල්පති එක්ක දානවා. ලකුණු ප්‍රමාණයත් එක්ක. අනෙක් කිසිම ළමයෙකුගේ මුහුණක් නැහැ. ඔවුන් දක්ෂයෝ නොවෙයි. ඕනෑම පන්තියක අපි කවුරුත් ගත්තොත් දන්නවා විෂයයක් උගන්වන කොට ඒ විෂය ධාරනය කර ගන්න විශිෂ්ඨයෝ, දක්ෂයෝ, අතිදක්ෂයෝ යම් මධ්‍යම සහ දුබල, දුවර්ල කියන කොටසට වෙන් වෙනවා. නැත්නම් අපි සියළු දෙනාටම එක තැනට යන්න ඕන. හැබැයි ඒ උගන්වන දෙයින් පමණයි මනින්න පුළුවන්. ඒ උගන්වන විෂයෙන් පමණයි මනින්නේ. දුවර්ලයි කියලා පිංතුර නැති ළමයි ටිකගේ හැකියාව මොන පැත්තෙන් තියෙනවද. ක්‍රීඩාව පැත්තෙන් ගත්තොත් ඔලිම්පික් ක්‍රීඩකයෙක්ද නැත්නම් මොකක් හරි පොතක් ලියන ගීතයක් හදන රස විදින දැවැන්ත නිමර්ණ කායර් කරන කෙනෙක්ද කියලා අපි දන්නේ නැහැ ඒ නිසා මේ අධ්‍යාපනයේ තියෙන්නේ එක්තරා පාරකට ගිහිල්ලා ඒ පාරේ දක්ෂයෝ විතරයි. ඒ නිසා මේ සියල්ලක්ම වෙනස් කිරීමේදි අධ්‍යාපනයට මූලික වගකීමක් තියෙනවා ඒ නිසා අනිකුත් සියලු දෙයක්ම අපි විශ්වාස කරනවා මේ තැනට ගේන්න පුළුවන් ජාතික ප්‍රතිපත්තිමය වැඩපිළිවෙල යන්න ඕන. ඒ සදහා දකුණු පළාත සංස්කෘතික කලා කටයුතු ක්‍රීඩා අමාත්‍යාංශයේ කායර් භාරය පුළුල් කරලා මේ විෂය පථයට යම්කිසි හැකියාවක් කරලා මීට සොයා බැලිමකින් දිස්ත්‍රික්ක තුනටම අදාලව අපි කියනවා කරන්න පුළුවන්දේ වෙනුවෙන් වැඩි මැදිහත්වීමක් කරන්න දායකත්වය වෙනුවෙන් අපි විශ්වාස කරනවා ඒ අදහස් යෝජනා ඔක්කෝම අරගෙන කතා කරලා අළුත් වැඩපිළිවෙලකට යමුයි කියන අදහසින් මගේ යෝජනා ඉදිරිපත් කළේ. මගේ යෝජනා ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබාදිම සම්බන්ධයෙන් ඔබතුමාට ස්තුතිය පුද කරමින් මගේ යෝජනාව ඉදිරිපත් කිරිම නිමා කරනවා. බොහෝම ස්තුතියි.

සභාපතිතුමා:- මීලගට නලින් හේවගේ ගරු මන්ත්‍රීතුමා. යෝජනාව ස්ථිර කරමින් කතා කරන්න.

නලින් හේවගේ මහතා:- ගරු සභාපතිතුමනි, ගරු අතුල වෙළඳගොඩ මන්ත්‍රීතුමා විසින් ගෙනඑන ලද යෝජනාව ස්ථිර කරමින් මම අදහස් කිපයක් ප්‍රකාශ කරන්න බලාපොරොත්තු වෙනවා. මේ යෝජනාවේ සාරාංශය ගත්තොත් ජිවත්වෙන මනුෂ්‍යයෙක් හදන්න කියන එක තමයි මේකේ ප්‍රධාන පරමාථර්ය බවට පත්වෙන්නේ. අපි මේ හැමදේම කරන්නේ ළමයින්ට ඉගෙන ගන්න, මහන්සි වෙන්නේ අපි මන්ත්‍රීකම් කරන්නේ රජයේ නිලධාරින් වැඩ කරන්නේ හැම දෙනාටම ජිවත් වෙන්න පුළුවන් සමාජයක් හදන්න. මිනිහෙක් හදා ගන්න. ප්‍රශ්නයක් තියෙනවා මා ගියා අවුකන බුදුන්ටත් දැස්දුන් මිනිසා සොයා ගියා කියලා සිංදුවක් තියෙනවා ඒ වගේ අපි ගියොත් ජිවත්වෙන මිනිහෙක් සොයාගෙන. මේ දෙකොටියක් වෙච්ච ජනගහනය ඇතුළේ කවුරුහරි ජිවත් වෙන මිනිහෙක් සොයා ගෙන ගියොත් මම හිතන්නේ අර නොමළ ගෙයකින් අබ ඇටයක් සොයා ගත්තත් මේ සමාජයේ ජිවත්වෙන මිනිහෙක්නම් සොයා ගන්න බැරිවෙයි. හැමදෙනාම ජිවත් වෙන්න උත්සාහ ගන්න මිනිස්සු අපට පේනවා. දගලන, මහන්සි වෙන පොර බදින එහෙම මිනිස්සු

පේනවා. හැබැයි ජීවත් වෙන මිනිස්සු එහෙම සොයා ගන්න බැහැ. එහෙම ඉඩකඩක් නැහැ. ප්‍රශ්නය තියෙන්නේ මිනිස්සු හදන තත්ත්වයකට නොවෙයි. මේ සමාජ ආර්ථික ක්‍රමය හදලා තියෙන්නේ ජීවත් වෙන මිනිස්සුන්ට නොවෙයි. සමාජ ආර්ථික ක්‍රමය ගෙනයන්න තවත් සමාජ ඇණමුරිච්චියක් සමාජයෙන් නිමර්ාණය කර ගන්න සහ ඒකට අවශ්‍ය පරිසරය හදා ගන්න තමයි මේ මිනිස්සු හදලා තියෙන්නේ. ඒ නිසා ජීවත් වෙන මිනිස්සු නැහැ. දවසේ පැය 24 න් පැය 8 ක් වැඩ කරන්න . පැය 8 ක් වැඩ කරන අතරේ ගෙවී යන සෙල වධර්නය වන්නට වේගයක් අවශ්‍යයි. ඉතිරි පැය 8 තමයි ජීවත් වෙනවා කියන්නේ. වැඩ කරන්නේ නැතිව ලෝකයක් පවතින්නේ නැහැ. දැන් ප්‍රශ්නය තියෙන්නේ ඒ 8 අපට ඉතිරිවෙලා තියෙනවා. 1989 චිකාගෝ වලට එකතු වෙච්ච කම්කරුවෝ කිව්වා අපට පැය 10,12 වැඩ කරන්න බැහැ. අපට පැය 8 ක් දීපල්ලා. අද උද්ඝෝෂණය කරන්නේ අපට පැය 8 මදියි. පැය10,12,16 වැඩ ගනිල්ලා. හරි විදියට නම් කියන්න ඕන පැය 8 ක වැඩ දිනයක් දීපල්ලා, ජීවත් වෙන්න සරිලන වැටුපක් දීපල්ලා. ඒකට නොවෙයි කෑගහන්නේ. එදා සුද්දා සමත් වුණා පැය 16,18 වැඩ කරද්දි චිකාගෝ වලට එකතු වෙලා මරාගෙන මැරිලා කොහොම හරි පැය 8 ක් දිනා ගත්තා. හැබැයි අද කියනවා ඒ සේවකයෝ කියනවා අපට පැය 8 න් යන්න බැහැ. ඕ.ටී. ඕන. අපට ජීවිතය ඕන නැහැ. එහෙම කියන තත්ත්වයට සමාජ ආර්ථික ක්‍රමය ගෙනල්ලා. ඒක ඇතුළේ කවුරුවත් ජීවත් වෙන්නේ නැහැ. අතුල වෙළඳගොඩ මන්ත්‍රීතුමා කිව්වා වගේ ජීවත් වෙනවා කියන්නේ සමාජ සම්බන්ධතා ඇතුළේ ඉන්න එක. අපි අම්මලා, තාත්තලා ලග ඉන්න ඕන. දුක සැප බලන්න ඕන. දරුවෝත් එක්ක ඉන්න ඕන. දරුවෝ දවසකට එක සැරයක් හෝ ස්පශර් කරන්න ඕන. එතකොට තමයි ලෙන්ගතු බැදීම එන්නේ. ඒක මාර ජීව විද්‍යාත්මක සාධකයක්. දරුවෝත් එක්ක විහිළු කරලා දරුවෝත් එක්ක සෙල්ලම් කරලා දරුවෝ බදාගෙන, වඩාගෙන එහෙම ඉන්න කොට තමයි ඉන්ද්‍රීය සම්බන්ධතා වධර්නය වෙන්නේ. ඊට අමතරව පොත්පත් කියවන්න ඕන. චිත්‍රපටියක් බලන්න ඕන. ලෝකය අධ්‍යයනය කරන්න ඕන. සංගීතය රස විදින්න ඕන. එහෙම මිනිස්සු අපට පේන්න නැහැ. අපේ පළාත් සභා මන්ත්‍රීවරුන්ගෙන් ඇහැව්වොත් එහෙම මෑත කාලයේ බලපු පොතක් මොකක්ද කියලා මම හිතන්නේ නැහැ එහෙම පොතක් ඇත්තේ නැහැ. මේ මෑත කාලයේ මහින්ද ප්‍රසාද් මත්සිගොඩ මහත්මයාගේ මාණික්කා වතගොත කියෙව්වා. සෙංකොට්ටම් පොත කියෙව්වා කියෙව්වට පස්සේ සතියක් විතර දැවැන්ත කම්පනයක් අපට තියෙනවා පොත කියෙව්වට පස්සේ. සෙංකොට්ටම් වගේ පොතක් ගත්තායින් පස්සේ ඉතිහාස කතාව නිමර්ාණය කරපු සතියක් විතර යනකම් දැවැන්ත කම්පනයක්. මාණික්කා වතගොත කිව්වට පස්සේ ධනේෂ්වර ක්‍රමය ඇවිල්ලා ඒ ධනේෂ්වර ක්‍රමය ඇතුළේ ජීවිත නැතිවෙච්ච හැටි ඉතා හොඳින් එහෙම පොතක් පතක් කියවන්න මිනිසුන්ට පොතක් පතක් කියවන්න, සංගීතයක් රස විදින්න ඉඩක් නැහැ. ඒ හින්දා තමයි නැතිවී යන ජීවිතය කොයි පැත්තෙන් හරි අල්ලගන්න තමයි මත්ද්‍රව්‍ය වලට එහෙම නැත්නම් විවිධ අපචාර ක්‍රියා වලට යොමු වන්නේ. මම දැක්කා මීට සතියකට කලින් බේරුවල ප්‍රදේශයේ ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ මන්ත්‍රීතුමියක් බූරුවා ගස්සනව. එයාත් එක්කම දාගෙන ගියා. ඊයේ පත්තරේ තියෙනවා පොහොට්ටුවේ මන්ත්‍රීවරු දෙන්නෙක් බූරුවා පිටියක ඉදලා අහුවෙනවා. ඒ මිනිස්සුනට දොස් කියලා වැඩක් නැහැ.ඒ මිනිස්සුන්ට ජීවිතය නැති වෙලා තියෙන්නේ. වධකාර ජීවිතයක්. කොතනින් හරි ත්‍රිල් එකක් ගන්න බලනවා. ඇයි මේ මත්ද්‍රව්‍ය වලට විශාල ප්‍රමාණයක් ඇබ්බැහි වෙන්නේ. මේ තුල වැඩිම ප්‍රමාණයක් ඉන්නේ පාසැල් දරුවෝ. ඒ දරුවන්ට අධික පීඩනයක් දීලා තියෙන්නේ. පෙර පාසැලේ ඉදලම පන්ති යන්න ඕන. ශිෂ්‍යත්ව විභාගයට එක විෂයයට පන්ති 4 යි. දැවැන්ත පීඩනයක ඉන්නේ. අධ්‍යාපනය ඇතුළේ තියෙන අසමානතාවය නිසා ඔය ආණ්ඩුවෙන් දෙන රු: 500/- ගන්න නොවෙයි ශිෂ්‍යත්වයට මහන්සි වෙන්නේ. කොහොම හරි දරුවා හොද ඉස්කෝලයකට දාගන්න. මම දැක්කා පත්තරේ තියෙනවා ලංකාවේ පාසැල් 361 කට එක දරුවෙක්වත් නැහැ. මේක තමයි අධ්‍යාපනයේ තත්ත්වය. ඒක ඇතුළේ දෙමව්පියෝ කොහොම හරි උත්සාහයක් ගන්නවා අධික පීඩනයක් දාලා මේ දරුවන් කොහොම හරි ශිෂ්‍යත්වය සමත් කරවන්න. දරුවෝ ඉන්නේ දැවැන්ත පීඩනයක. දරුවාට වෙන පොතක් පතක් අල්ලන්න දෙන්නේ නැහැ. දරුවාට ටී.වී. එක බලන්න දෙන්නේ නැහැ. ළමයින්ට උගන්වන්න ඕන කියලා ටී.වී. එක ගලවලා. පොතක් පතක් බලන්නේ නැහැ. ළමයි එක්ක ආශ්‍රයක් කරන්න දෙන්නේ නැහැ. හා හා පුතේ ආශ්‍රය කරන්න එපා. ක්‍රීඩා පිටියකට යවන්නේ නැහැ.අපට හොදට මතකයි ඕපාත ප්‍රජා මණ්ඩලය ලග හැමදාම බෝල් ගහනවා. ගමේ පිට්ටනියේ කුඹුරේ ගොයම් ටික කැපුවට

පස්සේ එල්ලේ ගහනවා. ක්‍රීඩා පිට්ටනි තිබුණේ නැහැනේ. ප්‍රජා මණ්ඩලය ලග හැමදාම වෝල්බෝල් ගහනවා. මම තමයි ක්‍රීඩා කණ්ඩායමේ නායකයා. මට මතකයි ඉස්සේල්ලාම බානගලදි බෝලය ගත්තේ රු: 280/- යි. 300/- කට ගත්තා කොන්ත්‍රාත් එක 17 දෙනෙක් ගිහිල්ලා නෙලලා තමයි පලවෙනි බෝලය ගත්තේ. හවස 2.00 ට වැඩ ඉවර කළාට පස්සේ රු: 300/- ක් දුන්නා. ඒ කාලයේ බෝලයක් රු: 280/- යි. එහෙම උනන්දුවක් තිබුණා. ගගට බැස්සට පස්සේ පැය 3-4 ක් ගොඩ එනවා. අපි කවදාවත් අපචාරයට ලක්වුණේ නැහැ. අපේ අම්මලා තාත්තලා වගේම ලග ඉන්න මාමාලා,නැන්දලා හැම කෙනාම අපි ගැන බැලුවා. එහෙම සමාජයක් තිබුණේ. ඒ සමාජයෙන් අද වෙනත් තැනකට ඇවිල්ලා තියෙනවා. මේ සමාජය ඇතුළේ තමයි මේ අලකලංචිය වෙලා තියෙන්නේ. දරුවෝ ඉන්නේ අතිපීඩනයකින්. ක්‍රීඩාවක් නැහැ, සාහිත්‍යයක් නැහැ, පොත පතක් නැහැ, ළමයෙක් ඇසුරු කරන්නේ නැහැ. මොකක්වත් නැහැ. සිලබස් එක ඇතුළේ එහාට මෙහාට ඇදගෙන ගිහිල්ලා උදේ 4.00 ට පන්ති පටන් ගන්නේ. මම ලගදි ගියා නෙළුවේ මළ ගෙදරක. රාත්‍රී 11 යි නෙළුවට යන කොට. ඒ වෙලාවේ තමයි විද්‍යා පන්තිය ඇරෙන්නේ. මළ ගෙදර ගියේ වාරුකන්දෙනියේ රාත්‍රී 2.00 යි. රාත්‍රී 2.00 ට එනකොට හෙල්මට් එක උස්සලා. මේක තමයි තත්ත්වය මේ රටේ. කොළඹ පන්ති තියෙනවා. මැද ශාලාවේ ඉන්නවා ටියුෂන් ගුරුවරයා. උඩ ශාලාවේ තිරය. යට ශාලාවේ තිරය ශක්‍යා එකේ. මැද තමයි බණ්ඩාර සර් කියලා ඉන්නේ. ඔහොම තමයි උගන්වන්නේ. මේ සැරේ හොඳම ව්‍යවසයකයා කවුද. ආණ්ඩුවෙන් දීපු හොඳම ව්‍යවසයකයා ටියුෂන් මාස්ටර් කෙනෙක්. මේ ප්‍රෝමෝට් කරන්නේ මොකක්ද මේ. මේ හැම තැනම අන්තර් සම්බන්ධයක් තියෙනවා. මේ ළමයින්ගේ ජීවිත විනාශ වෙලා තියෙන්නේ. ක්‍රීඩාවක් නැහැ, ළමයෙක් ඇසුරු කරන්නේ නැහැ. පොතක් පතක් නැහැ. දැවැන්ත පීඩනයක්. ඒ හින්දා ඒ පීඩනයෙන් මිදෙන්න තෘප්තියක් ඕන. කෙටි තෘප්තියක් ඕන. බොනවා මත්ද්‍රව්‍යයක්. ඔවුන්ට දොස් කියලා බැහැ. දරුවන් මේකට ගලවා ගන්න නම් දරුවන්ට ජීවිතය දෙන තැනක තියන්න ඕන. ක්‍රීඩාවකට යොමු කරන්න ඕන. සාහිත්‍ය කලාවකට යොමු කරන්න ඕන. ඒ නිසා මේකේ ඒ සියල්ලම විනාශ වෙලා තියෙන්නේ. මෑත කාලයේ සිද්ධි දෙක, තුනක් ගත්තා. මේකේ විනාශයේ තරම තේරුම් ගන්න පුළුවන්. ඔබතුමාට මතකයි මොණරාගල කෙල්ලෙක් බෙල්ල මිරිකලා මරනවා. තමන්ගේ පෙම්වතා ද කොහේද. ඒ කෙල්ල මරන වෙලාවේ පිටින් ඉඳගෙන දෙතුන් දෙනෙක් වීඩියෝ කරනවා. බල්ලොත් බුරනවා. බල්ලට මොනව හරි දැනුණා. බල්ලට දැනිලා බල්ලා කෑ ගහනවා. කොල්ලා වීඩියෝ කරනවා. බල්ලා බුරනවා. අර දරුවා බේර ගන්න බැරිද. බලන්න සමාජය කොතරම් බිඳ වැටිලද කියලා. කෙල්ලගේ බෙල්ල මිරිකනවා විනාඩි ගණනක් ඇතුලත. ඕන හැටියට බේර ගන්න තිබුණා. හැබැයි එහෙම බේර ගන්නේ නැහැ. මේකේ අවසාන ප්‍රතිඵලය ඒක තමයි. මාතර තව ළමයි දෙන්නෙක් ගහගෙන පිහි ඇණ ගන්නවා. ළමයි රණ්ඩු වෙනවා තමයි පොඩි පොඩි දේවල් වෙනවා. එතනින් ඕන තරම් වැඩිහිටියෝ යනවා. කවුරුවත් ගණන් ගන්නේ නැහැ. හැබැයි තමන්ගේ දරුවට වෙන දවසට. තමන්ගේ දරුවෙක් කියලා හිතන්න ඕන නැද්ද අතන. බේරන්න මැදිහත් වෙන්න ඕන නැද්ද. හැම දෙනාම වංගු දාලා එතනින් මාරු වෙලා යන්නේ ඇයි. ඒ නිසා සමාජය බිඳ වැටිලා තියෙන්නේ. අපි සුද්දන්නට බණිනවා. සුද්දෝ නරකයි කියලා. මම දැක්කා ඊයේ පෙරේදා ගම්පහ ස්ටේෂන් එක ලග බල්ලෙකුගේ කකුලක් කැඩිලා සුද්දෙකුයි, සුද්දියකුයි පැය 7 ක් ඉන්නවා එතනට වෙලා. බල්ලා රෝහලට ගෙන යනකම් පැය 7 ක් ඉන්නවා. අපි සුද්දන්ට කියන්නේ නරක සුද්දෝ කියලා. එහෙමනෙ අපි හදලා තියෙන්නේ. බල්ලෙකුගේ කකුලක පොඩි ආබාධයක් වෙලා පැය 7 ක් ඒ බල්ලා ගෙනයනකම් එතනට වෙලා ඉන්නවා. ඒ බල්ලාට තියෙන කරුණාව අපේ මිනිස්සුන්ට නැති වෙනා තියෙනවා. ඒ නිසා මේක මහා විනාශයකට පත්වෙලා තියෙනවා. ඔබතුමන්ලා දන්නවා ගූගල් එකට ගිහිල්ලා සෙක්ස් කියන වචනය ගහලා බලන ලෝකයේ තියෙන පළමු රට ලංකාව. අවුරුදු 4 ක් ගූගල් එකට ගිහිල්ලා සෙක්ස් කියන වචනය ගහලා වැඩියෙන්ම බලන්නේ ලංකාව. මේ පාර දෙක. හැබැයි වැඩිම නගරය හෝමාගම. හෝමාගම කියන්නේ බෞද්ධ නගරය කියලා කියන්නේ. ලෝකයේ වැඩියෙන්ම ඒවා බලන රට ලංකාව. බලන්නේ මොන කාලයටද. නිවාඩු කාලයට. එහෙමනම් මොකක්ද මේකේ තියෙන්නේ. ළමයි තමයි බලන්නේ. ඒ නිසා මේක පිරිහෙන්න ඕන තරමට පිරිහිලා තියෙන්නේ. වෙබ් සයිඩ් එකේ ගොඩක් යනවා පිරිහිච්ච තරම. ඒ නිසා මේක තවදුරටත් හදන්න බැහැ. මේක දැනුවත් භාවයෙන් ඇතිවන වැඩ. විසඳන්න බැරි ප්‍රශ්න නොවේ. මොකද මේ සමාජ ආර්ථික ක්‍රමය ඇතුළේ හිතන

මිනිස්සු අවශ්‍ය නැහැ. දියුණු චින්තනයක් සහිත මිනිස්සු අවශ්‍ය නැහැ. මොනව හරි අවබෝධයක් සහිත මිනිස්සු හදන්න උවමනාවක් නැහැ. දැන් බලන්න උසාවිය ගත්තොත් ඔතන දවසකට කී දාහක් එනවද. පැය 5 ක් නඩු ඇහැව්වොත් පැය 4 ½ ක් අරගෙන තියෙන්නේ මොකටද. කල් දාන්න. රෙජිස්ට්‍රාර් මහත්මයාට තේරෙන්නේ නැද්ද අද අහන්න පුළුවන් නඩු 10 යි. ඒ නඩු 10 ගෙන්ව ගනිමු. අනිත් 500 ගෙවල්වල ඉන්න කියමු. අපි නැතිව මොකක්මත් නඩුවක් අහන්න බැහැ. ඒ මිනිස්සුන්ට ගෙදර මොකක් හරි වැඩක් කරගෙන නිදහසේ පොතක් බලාගෙන ඉන්න බැරිද. පැය 4 ½ ක් නඩු ඇහැව්වොත් අපිත් යනවනේ. නඩු වලට පැටලිලා. පැය 5 ක් ඇහැව්වොත් 4 ½ ක් තියෙන්නේ කල්දාන ඒවා. අහන ඒවා තියෙන්නේ පැය ½ යි. ඕස්ට්‍රේලියාවේ එහෙම නැහැ. ඕස්ට්‍රේලියාවේ ඉස්සරහින් තිරයක් දාලා තියෙනවා. නඩු අංකය වැටෙනවා. අංකය වැටෙන වෙලාවට යන්න පුළුවන්. එයාගේ වෙලාව කියලා තියෙන්නේ. රස්තියාදුවක් නැහැ. අවුරුදු 70 ක් රට පාලනය කරනවා.අධිකරණ ඇමතිවරු ඕන තරම් ඉන්නවා. ඇයි මේ මිනිස්සු රස්තියාදු කරනවා. ඊයේ අනුර සහෝදරයා කිව්වා කොට්ඨාවේ ඉදලා කොළඹට හැමදාම දවසට පැය දෙකක් රස්තියාදුව. අවුරුදු 10 ක් ඉදලා තියෙන්නේ බස් එක ඇතුළේ. සතියේ දවස් පහක් වැඩට යනවනේ. දවසට පැය දෙකක් විතර රාස්තියාදුවේ. මොකක්ද මේ ජීවිතය. මේක හදා ගන්න බැරිද. ඒක වෙනස් කරන්න පුළුවන්. සමාජ ආර්ථික ක්‍රමයෙන් මේක වෙනස් වෙන්නේ නැහැ. මේක වෙනස් කර ගන්න උවමනාවක් නැහැ. හයිවේ එක හදන්න ඕන. පහසුවෙන්න. දැන් අපේ අම්මලා තාත්තලා ඔබතුමන්ලට මතකයි ජීවිතය මෙච්චර පහසු නැහැනේ. දර කඩාගෙන ආවා. වී කොටා ගත්තා ගෙදර. මිරිස් ගලේ දාලා අඹරගත්තා. පහල ළිදට ගිහිල්ලා වතුර කළය ගෙනාවා. වැඩ ගොඩක් තියෙනවා. දැන් මේවා පහසු වෙලා තියෙනවනෙ. දැන් වතුර ගේන්න ඕන නැහැ. ටැප් එක ඇරපු ගමන් වතුර. ලිපට පිඹින්න ඕන නැහැ. රයිස් කුකර් එකට දාලා ස්විච් එක ඔන් කළාම බත පැහෙනවා. බත පැහුණට පස්සෙ ඔෆ් වෙනවා. සැහෙන තාක්ෂණයක් ඇවිල්ලා තියෙනවා. තාක්ෂණය එන්න එන්න මොකක්ද වෙන්න ඕන. අපේ නිදහස වැඩි වෙන්න ඕන. දැන් ටැප් එකෙන් වතුර එනවා. වොෂින් මැෂින් එකෙන් රෙදි ටික සේදෙනවා. ඔක්කෝම දැන් වෙනවා තාක්ෂණයෙන්. තාක්ෂණය එන්න එන්න ලෝකයට නිදහස වැඩි වෙන්න එපාය. අපේ අම්මලා තාත්තලා නිදහස භුක්ති විදපු එක අපේ ළමයින්ට නැහැ. මොකද වෙලා තියෙන්නේ අර පන්තියට ඇදගෙන යනවා, මේ පන්තියට ඇදගෙන යනවා. අරහෙට දුවනවා, මෙහාට දුවනවා. කිසිම නිදහසක් නැති මිනිස්සු. ඒ නිසා තමයි බොන්න ඇබ්බැහි වෙන්නේ. බුදුදහමට තැන දෙන්න ඕන කියලා කෑගහනවනේ මර ලතෝනි දෙනවනේ ව්‍යවස්ථාවට දාන්න ඕන කියලා. බලයට උත්තර සොයලා හරි යන්නේ නැහැ. බුදුදහම කිව්වේ හේතුවට උත්තර සොයන්න ඕන. මේ සෙව්වේ ඵලයට. බුදු දහමට මූලිකත්වයක් දෙනවානම් මොකක්ද සොයා ගන්න ඕන මත්ද්‍රව්‍ය බොන හේතුව මොකක්ද. මම දැක්කා හිරඹුර හන්දියේ ගොඩක් බොනවනේ. එතනින් ගන්නකෝ පවර්ස් 10 ක ඉඩමක්. මම දවසක් මොරවක යන කොට උදේ 8.00 යි. කන්න නැවැත්තුවා කඩයක් ලග. ඉස්සරහ කඩේ තියෙන්නෙ තැබෑරුමක්. මනුෂ්‍ය යෙක් ආවා ¼ කුප්පියක් ගත්තා. කටේ දාගත්තා. විසි කරලා ගියා. අර මොන බීමක්ද. උදේ පාන්දර 8 ට මොන බොන බීමක්ද. මොන එක මෙහෙම කරන්න බැරිද. හිරඹුර හන්දියෙන් පවර්ස් 10 ක් අරගෙන පොඩි බෙන්චස් ටිකක් ගහලා කාඩ් පැක් එකක්, දාම් බෝඩ් එකක් දාලා සංගීතයක් දාලා ඔන්න මෙතන ඇවිල්ලා බීපල්ලා. මේ කට්ටියක් එක්ක කතා කරලා දැන් අරකහලා ගත්තට පස්සේ වෙරි වුණා. සරම උස්ස ගත්තා. කාට හරි බැන්නා ඇලකට වැටුණා මම කියන්නේ මේවා වෙනස් කරන්න. ඊට පස්සේ මොකක්ද වෙන්නේ. බෙන්චස් එකක වාඩි වෙලා දෙන්නා එක්ක පොඩි වැට් එකක් දාගෙන පැය දෙක, තුනක් බොනවා. දාම් අදිනවා, කැරම් අතක් ගහනව. චිත්‍රපටියක් අරගෙන බලනවා. එහෙම ටික කලක් යන කොට මොකක්ද වෙන්නෙ මිනිස්සුන්ට. මිනිස්සු අදුන ගන්නවා. වැට් කරන්න සෙට් වෙනවා. සිංදුවක් රස විදිනවා. ඊට පස්සේ අවශ්‍ය වෙන්නේ නැහැ. වෙන ජීවිතයක් හැදෙනවා. ජීවිතයක් නැති හින්දා තමයි කටට හලාගෙන ගුටි කාලා ගෙදර යන්නේ. රා බී තුට්ටුවක- වෙරිව් පනම් හතරක - අහෝ! ගුටිකති පවුම් සියයක. ඔකනේ වෙන්නේ. බොන්නේ තුට්ටුවක. කෑගහන්නේ රුපියලකට. ගුටි කනවා කෝටියක. මිනිස්සු බොන්නේ වෙන මොකුත් නැති හන්දා. අවුරුදු ගණනකට පස්සේ මම ගියා විජේවීර සහෝදරයාගේ චිත්‍රපටයක් බලන්න. ප්‍රින්ස් හෝල් එකට. අපි බොන්නේ නැහැනේ හැබැයි අපට ආතල් නැද්ද. හොද පොත් ටික කියවනවා. සංගීතය රස විදිනවා. ඊයේ පෙරේදා කේමදාස මාස්ටර් ඇවිල්ලා විද්වතුන්ගේ වැඩයේදි සිංදුවක්

කිව්වා. මම ඒක දහපාරක් විතර ඇහැව්වා. හරිම රසයක් තියෙන්නේ. සිංදුවක් රස විදිනකොට, පොතක් කියවන කොට බෝතල් ¼ න් නොවේ බෝතල් 100 ක් බිව්වත් ගන්න බැහැ කියවීමෙන් ලබන තෘප්තිය. එහෙම යොමු කර ගන්න ඕන. ඒ නිසා මිනිස්සුන්ට ජීවිතයක් දෙන්න ඕන. ඒ නිසා දිගට කතා කරන්න ඕන වෙන්නේ නැහැ. මේ සමාජ ක්‍රමය ඇතුළේ එහෙම නිදහසක් තියෙන එක නොවේ . මේක දැවැන්ත පරිවතර්නයට ලක්වෙන්න ඕන. සංස්කෘතික අමාත්‍යාංශය වැදගත් එකක් නිසා තමයි අපි 2004 ලබාගත්තේ. ඒ ඇතුළේ සංස්කෘතික මධ්‍යස්ථාන විශාල ප්‍රමාණයක් ලංකාවේ ආරම්භ කළා චිත්‍රපට සංස්ථාව තියෙන්නේ ගම්වල ගිහින් නිකන් ඉන්න නොවේ. චිත්‍රපට පෙන්වන්න. චිත්‍රපට සංස්ථාවට බැරිද හැම ගමකටම ගිහින් සවසට චිත්‍රපටයක් පෙන්වන්න. කිව්වේ ගම්වල නිකන් ඉන්න නොවේ. ගම්වලට ගිහින් සවසට චිත්‍රපට පෙන්වන්න. චිත්‍රපට සංස්ථාවට බැරිද හැම ගමකටම ගිහින් සවසට චිත්‍රපටයක් පෙන්වන්න.මේ දවස්වල පරාක්‍රම නිරිඇල්ල මහත්මයා හදලා තියෙනවා මහා දැවැන්ත ටෙන්ට් එකක්. එයා ගම්වලට යනවා සතියක් දෙකක් ගම්වල ඉන්නවා. රු:100/- යි. පුදුම සෙනගක් එන්නේ. දංගෙදර ගෙනත් දැම්මා. ඉතින් ඇයි ආණ්ඩුවට බැරි පරාක්‍රම නිරිඇල්ල මහත්මයාට කියලා ඔයා ඔයා හැමදාම ඔය ටෙන්ට් එක ගලවන කොට තව තැනක ගහන්න. අපි උදව් කරන්නම්. පොඩි ගණනක් යන්නේ ආණ්ඩුවට. මේක ලංකාව පුරා ගෙනයන්න බැරි ඇයි. දංගෙදර තියේද්දි මිනිස්සු පොර කාකා බැලුවා. පස්සේ එන කොට ටිකට් ගන්න ඉඩ නැහැ. ඇයි පරාක්‍රම නිරිඇල්ල මහත්මයාට නිකන් ඉන්න දෙන්නේ. ඒ කලාකාරයන්ට දවසක් හරි නිකන් ඉන්න දෙන එක අපරාධයක්නේ. එයාල ලංකාවට ගෙනයන්න සූදානම් නැද්ද ඒ නාට්‍ය ටිකත් අරගෙන. පොඩි උදව්වක් ඕන. ඇයි ඒ උදව්ව දෙන්නේ නැත්තේ. ආණ්ඩුවෙන් අනවශ්‍ය වියදම් ඕනතරම් කරනවා. එහෙම කරද්දි අරවා කරන්නේ නැහැ. කරන්නේ නැත්තේ දැනුවත්ව. ඉහළින් හදාගත්ත දැනුවත් සිස්ටම් එකක් තියෙනවා. ඒකේ සාහිත්‍ය වේදින් ඕන නැහැ. ඒකේ කලා කරුවන් ඕන නැහැ. වෙන එකක්.ඒක පරිවතර්නයක් කර ගන්න. අද දවසේ මේ ගෙන ආ යෝජනාව නැවතත් ස්ථිර කරමින් මෙවන් කටයුතු කරන්න අපේ සංස්කෘතික ඇමතිතුමාට ධෛර්ය, වාසනාව ලැබේවා! කියා ප්‍රාථර්නා කරමින් මම නිහඩ වෙනවා බොහෝම ස්තුතියි.

සභාපතිතුමා:- ගරු මනෝජ් සිරිසේන අමාත්‍යතුමා.

මනෝජ් සිරිසේන මහතා(අමාත්‍ය):- බොහෝම ස්තුතියි ගරු සභාපතිතුමනි. අද දිනයේ විශේෂයෙන්ම අතුල වෙළඳගොඩ ගරු මන්ත්‍රීතුමා විසින් සභාවට ඉදිරිපත් කරන ලද යෝජනාව ගරු නලින් හේවගේ මන්ත්‍රීතුමා වැදගත් කරුණු රාශියක් ප්‍රකාශ කරමින් ස්ථිර කරන්න යෙදුණා. අපි දකුණු පළාතේ ක්‍රීඩා,යෞවන කටයුතු ග්‍රාම සංවධර්න, සංස්කෘතික අමාත්‍යාංශය විදියට විශේෂයෙන්ම මේ අමාත්‍යාංශය ක්‍රීඩා සංස්කෘතික කියන විෂයයන් දෙක යටතේ වතර්මානයේ රට තුල සමාජය තුල සිදුවෙලා තියෙන මේ මානුෂීය බෙදවාවකය කඩා වැටීම ගොඩ ගෙන පෙරට යන්න අවශ්‍ය කරන වැඩසටහන් විශාල ප්‍රමාණයක් හිටපු ගරු අමාත්‍යතුමන්ලා වගේම වතර්මානයේ විශේෂයෙන්ම මම මේ අමාත්‍යාංශයට පත්වෙලා වසරකුත්, මාසයකුත් දින කිහිපයක් ඇතුළත හිටපු ගරු අමාත්‍යතුමන්ලා කරගෙන ගිය වැඩ සටහන් වගේම අළුත් අදහස් කිහිපයක් එකතු කරලා මේ සම්බන්ධයෙන් වතර්මානයේ කටයුතු කරගෙන යනවා කියන කරනවා ප්‍රථමයෙන් මතක් කරනවා. අපි ආපහු හැරිලා බැලුවහම වතර්මානයේ තියෙන මේ බරපතල මානුෂීය ආථර්ක බෙදවාවකය නිමර්ාණය වෙන්නේ මීට වසර 71 කට පෙර අපි බ්‍රිතාන්‍යයෙන් නිදහස ලැබුවාට පස්සේ ගරු සභාපතිතුමනි, දිගින් දිගටම අපේ රටේ ශ්‍රී ලාංකිය දේශපාලන පක්ෂ නායකත්වයට පත්වෙලා තිබ්බිව කරුණු කාරණා සම්බන්ධයෙන් පළවෙනිදේ විදියට මම දකින්නේ අපට ජාතික ප්‍රතිපත්තියක් තිබුණේ නැහැ. ඊලගට ගත්තම පැන නගිමින් තියෙන ගැටළු දිහා බලලා ඒ ගැටළු වලට අවශ්‍ය කරන ප්‍රායෝගික විසදුම් ගෙන එන්නට කිසිදු පාලන තන්ත්‍රයක් පසුගිය වකවානුව තුල සමත්වෙලා නැහැ. දැන් අපට තියෙන අභියෝගය වෙලා තියෙන්නේ මධ්‍යම රජයත් රේඛිය අමාත්‍යාංශයත් තියාගෙන රට පුරාම කළයුතු වැඩ සටහන් පළාතක් විදියට අපට ලැබෙන මූල්‍යමය තත්ත්වයේ බරපතල අඩුපාඩුකම් තියේද්දි ක්‍රියාත්මක කිරිමේ වගකීම තියෙනවා. මේ ක්‍රියාත්මක කිරිමේදිත් මම හිතන්නේ අද දවසේ මේ ගෙන එන අතිශයින්ම වැදගත් යෝජනාව මම විශ්වාස කරන්නේ ඇත්තටම මේ යෝජනාව අපි සම්මත කරනවා වාගේම මේ යෝජනාව අතුල වෙළඳගොඩ ගරු මන්ත්‍රීතුමා කිව්වා වගේම මේ සභා ගහර්ය තුල සිදු කරපු යෝජනා බොහෝමයක් වැදගත් යෝජනා සක්‍රීයත්වයට, ක්‍රියාත්මක්භාවයට පත්වීමේ බරපතල ගැටළුවකට පත්වෙලා තියෙනවා.

ඒ නිසා අපට තියෙන අභියෝගය වෙන්නේ අප්‍රේල් 10 වෙනිදා වෙන කොට මේ පළාත් සභාවේ ගරු මන්ත්‍රීතුමන්ලා මේ සභා වාරය අවසන් කරලා එළියට බහින කොට ඉදිරි මාසයකුත් දින කිහිපය තුල මම විශේෂයෙන්ම ආරාධනා කරනවා අතුල වෙළඳගොඩ මන්ත්‍රීතුමාට අපි අවස්ථාවක් ලබාගෙන අපේ අමාත්‍යාංශ වල අදාල සියලුම විෂයන් නිලධාරින් සියලු දෙනා සමග සාකච්ඡා කරලා දැනට කරගෙන යන වැඩ සටහන් මොනවාද කියලා පැහැදිළි කරලා මේ අළුතින් අදහස් කරන සමාජයේ නැවතත් යථා තත්ත්වයට පත් කරන්න නම් අළුත් පරපුර රටට ආදරය කරන විශේෂයෙන්ම අපේ අමාත්‍යාංශයේ තේමාව විදියට කයින්, මනසින් පිරිපුන් පුරවැසියකු සැබෑ ලෙසම නිමර්ාණය කරන්න මම හිතන්නේ මේ වැඩ සටහන ක්‍රියාත්මක වෙන්නට ඕන. ඉතිහාසය දිහා බැලුවහම විශේෂයෙන්ම ඔබතුමා නියෝජනය කරන පක්ෂය විදියට ජනතා විමුක්ති පෙරමුණේ හිටපු ශ්‍රේෂ්ඨ නායකයෙක් විදියට අපි දකිනවා රෝහණ විජේවීර සහෝදරයා. අපට ජාතියට අහිමි වෙලා ගියපු තරුණ පරපුර වාගේම රටේ නව සංකල්ප බිහි කරලා නිමර්ාණය කරලා ක්‍රියාත්මක කරන්නට හිටපු ජාතික වශයෙන් වැදගත් වූ නායකයෙක් අකාලයේ අපට අහිමි වෙලා ගියා. නිදහසෙන් පස්සේ අපි දිගින් දිගටම අද රාත්‍රි 9. ට තියෙනවා වාද පිටිය, 360, සටනට ගිහිල්ලා පසුගිය දවසක මම දැක්කා නලින් හේවගේ ගරු මන්ත්‍රීතුමා බලු කුණක් ගැන කිව්වා. සම්පූණර් ඇත්ත කතාව. මම ඒක දැක්කේ නැහැ ටී.වී එකේ. අන්තජර්ාලය හරහා මම ඒක දුටුවා. සම්පූණර් ඇත්ත කතාව. අද අපට තියෙනවා වගකීමක්. අපි ජාතික වශයෙන් කළයුතු වැඩ සටහන් වලදි හෝ අපි පාශර්වයන් සියල්ල එක්සත් ජාතික පක්ෂය, ශ්‍රි ලංකා නිදහස් පක්ෂය ජනතා විමුක්ති පෙරමුණ කියන සියලු දේශපාලන බලවේගයන් එකට එකතු වෙලා පළාත් ප්‍රතිපත්ති, ජාතික ප්‍රතිපත්ති රටට හඳුන්වාදීමේ බරපතල වගකීමක් අපට තියෙනවා. ගරු සියළු දේශපාලන ප්‍රවාහයන් කෙරෙහි දැඩි කලකිරිමකින් ඉන්නවා. තව අවුරුදු තුන හතරක් යන කොට නැවතත් රට තුල බරපතල ආකාරයේ පිපිරිමක් නිමර්ාණය වෙමින් තියෙනවා. මේක නතර කර ගන්නනම් මම හිතන්නේ අපි ක්‍රියාත්මක කරනවා දැනටත් වැඩ සටහන්. අපි තරුණයන්ට ආකල්ප, අධ්‍යාත්මික වැඩ සටහන් වෙනුවෙන් කරන වැඩ සටහන් තියෙනවා. කායර්ාලයට කැඳවලා. සමහර වැඩ සටහන් වලට අපි වියදම් කරලා කටයුතු කරන කාලය වියදමත් දිහා බැලුවහම සහ ඒවායේ සහභාගිත්වය තියෙන්නෙ බරපතල පල්ලෙහා මට්ටමක.කරන වැඩසටහන්වලට ඒවායේ වටිනාකම තේරුම් අරගෙන සහභාගි වීමේ බරපතල ප්‍රශ්නයක් තියෙනවා.මම නම් විශ්වාස කරන්නේ ගරු සභාපතිතුමනි, අපි රටේ විශාල ආකල්ප විප්ලවයක් හදන්න ඕන. ඒ ආකල්ප විප්ලවය නිමර්ාණය වෙන්න ඕන අපේ මට්ටමෙන් පළාත් සභාව තුල තරුණයාට නොවෙයි ආරම්භ වෙන්න ඕන. මම විශ්වාස කරන්නේ බාලාංශ පන්තියේ දරුවාගේ දෛනික ක්‍රියාදාමයට මේ ආකල්ප වෙනස ඇතුල් කරලා ක්‍රියාත්මක වුණොත් අද කුණු ටික දාන්න දන්නේ නැති පාරක යන්න දන්නේ නැති සමාජයක් රට තුල නිමර්ාණය වෙලා තියෙනවා. ඒ නිසා බරපතල බෙදවාචකයක්. යටත් විජිතයක් බවට පත්වෙලා බ්‍රිතාන්‍ය යේ යටත් විජිතයක් බවට පත්වෙලා අවසානයේ නිදහස ලබපු රට තමයි මගේ මතකයේ හැටියට 1997 වසරේ බ්‍රිස්බැටන් කියන ආණ්ඩුකාරවරයා රැජිනගේ නියෝජිතයා වශයෙන් හිටියේ හොංගොං දේශයේ. වතර්මානයේ ආථර්ික වශයෙන් ලෝකයේ 1 වෙනි ස්ථානය වඩාත් වැඩියෙන් බිලියන පතියන් ඉන්න රට බවට පත්වෙලා ඉන්නේ නගරය බවටපත් වෙලා ඉන්නේ හොංගොංදේශය. මේ වසරේ නිව්යෝකර් නගරය පරදවලා ඔවුන් අපි කියන්නේ අපිට බිලියන් පතියන් අවශ්‍යයි කියන කාරණය නෙමෙයි. අපට ආවේණික, අපට සාම්ප්‍රදායික වූ අපේම වූ ක්‍රියාදාමයක් තිබුණා. අපට අන්න ඒවා ආරක්ෂා කර ගන්නට නිදහසෙන් පස්සේ බරපතල ලෙස නොහැකි වෙලා තියෙනවා. මේ තත්ත්වය වෙනස් කරලා අපේ සමාජය නිවැරදි තැනකට ගෙනඒමේදි මම හිතන්නේ ඔබතුමා ඉදිරිපත් කරපු කරුණු කාරණා විශාල වශයෙන් වැදගත් වෙනවා කියන කාරණාව අපි පිළිගන්නවා. ඒ වගේම අමාත්‍යාංශයක් විදියට හිටපු ඇමතිතුමා ආරම්භ කළා දක්ෂිණ දීප සාධුනද කියලා වීරසුමන වීරසිංහ ඇමතිතුමා ආරම්භ කළේ. අපි ඒ වැඩ සටහනට අළුත් ආකල්ප එකතු කරලා තියෙනවා අද. වැඩිහිටි සමිතිය එකතු වෙන කොට තරුණයා එතනට එන්නේ නැහැ. මේ වනකොට අද දවසේත් ගරු සභාපතිතුමනි, වැලිගම ආසනයේ පාසැල් දෙකක ධම්මසේන ස්වාමීන් වහන්සේ කැඳවලා මාපිය වන්දනා වැඩ සටහන කියලා වැඩ සටහනක් අපේ අමාත්‍යාංශයේ අනුග්‍රහයෙන්. අපි බලාපොරොත්තු වන්නේ අම්මට, තාත්තට ගරු කරන්නේ නැති වයසක අම්මා, තාත්තා පාරේ දාල යන දරුවාගේ හිතට ලබා දෙන්න යම්කිසි මානුෂිකත්වයක්. ආකල්පමය වශයෙන් වෙනස්

කිරීමක් කරලා සැබෑ ශ්‍රීලාංකීය මානුෂියවාදී පුරවැසියා නිමර්ාණය කරන්න අවශ්‍ය වෙන්නෙ වැඩ සටහන් රාශියක් මේ වනවිට අපේ අමාත්‍යාංශය විදියට ක්‍රියාත්මක කරමින් පවතිනවා. ඒ නිසා ස්තුතිවන්ත වෙනවා අද දවසේ ඉතාමත් වැදගත් යෝජනාවක් අපේ ධුර කාල සීමාව අවසන් වන වකවානුවක ගෙනාපු නිසා මේ යෝජනාව අද දවසේ ස්ථිර වෙලා මේ සභාව තුල අපට පුළුවන් අවස්ථාවක් ලබා දෙන්න ගරු අතුළ වෙළඳගොඩ මන්ත්‍රීතුමා, ඒ වගේම ස්ථිර කරපු නලින් හේවගේ මන්ත්‍රීතුමා අපි සාකච්ජා කරලා පළාත වශයෙන් අළුත් පළාත සභාව මේ සභාව තුල රැස්වෙන කොට පළාත් සභාව තුල ක්‍රියාත්මක කළයුතු වන්නාවූ වැඩ සටහනක් විදියට ක්‍රියාත්මක කරන්නට අවශ්‍ය කරන වැඩ සටහනක් නිමර්ාණය කරන්නට අපි සාකච්ජා කරන්නට එකතු වෙමුයි කියන කාරණාව විශේෂයෙන් මතක් කරමින් අද දවසේ මෙම වැදගත් යෝජනාව සභාවට ගේනජ්ම සම්බන්ධයෙන් ඒ වගේම මේ වැදගත් යෝජනාවේ අඩංගු කරුණු ක්‍රියාත්මක කරන්නට අපි එකතු වෙමුයි කියන කාරණාව මතක් කරමින් ගරු අතුල වෙළඳගොඩ මන්ත්‍රීතුමාට අමාත්‍යාංශය වශයෙන් අපි ස්තුතිය පුද කරමින් මම නිහඬ වෙනවා. බොහෝම ස්තුතියි.

සභාපතිතුමා:- අතුල වෙළඳගොඩ මන්ත්‍රීතුමා. පිළිතුරු කතාව.

අතුල වෙළඳගොඩ මහතා:- ගරු සභාපතිතුමනි, මා විසින් අද ඉදිරිපත් කල යෝජනාව ගරු නලින් හේවගේ මන්ත්‍රීතුමා ස්ථිර කළා. විෂය භාර ගරු අමාත්‍යතුමා මා හිතුවාට වඩා මා හිතපු අදහස හරියට පෝෂණය කළා විතරක් නොවෙයි මම සතුටු වෙනවා එවැනි අමාත්‍යවරයෙක් මෙම අමාත්‍යාංශයතුල වැඩ කටයුතු කරමින් ඒ කල කතාවට. හේතුව අපි මේ කතා කළේ සංස්කෘතික කටයුතු අමාත්‍යාංශයේ කාර්‍ය භාරය ගැන නොවේ. මේ කෙටි කාලයට කරන්න තියෙන වැඩ කටයුත්තක් ගැනත් නෙවෙයි. සභාවේ සණපුරනය නැහැ. ප්‍රශ්නයක් තියෙනවා ගරු අමාත්‍යතුමා කතා කරද්දි අහන් හිටියේත් නැහැ.අපි වැටුප් නොගත්තත් වැටුප් ලබන සෑම වරප්‍රසාද ප්‍රමාණයක් එකතු කරලා තියෙන පළාත් සභාවේ මහජනතාවගේ ලක්ෂ 26 ක පමණ යම්කිසි ආපේක්ෂාවන් අරගෙන ඇවිල්ලා අවුරුදු 5කට මේ මේ දේවල් කළාය කියලා පරමාධිපත්‍ය නියෝජනය කරන සභාවක්. සාම්ප්‍රදායි වැඩපිළිවෙලක් තියෙනවා. ඒවා තමයි හිටපු අමාත්‍ය වීරසුමන වීරසිංහ ගරු මන්ත්‍රීතුමා සිටියදි නතර්න කණ්ඩායමක්, සංගීත කණ්ඩායම් හම්බන්තොටදි දැක්කා. ප්‍රගතිය මොකක්ද. එතනින් එහාට තත්ත්වය දැන් පවතින තත්ත්වය අපි දන්නේ නැහැ. එළියේ දේවල් එක්ක නොවෙයි. අපට දැන් ප්‍රශ්නයක් තියෙනවා මොකක්ද මේ පළාත් සභාව කියන ආයතනය නිශ්චිත වැඩපිළිවෙලක් යටතේ මේ කරන ටිකවත් අපට ප්‍රතිඵල ලැබෙන විදියේ තැනකට එකතු කරන්නට මේ ලැබෙන සහයෝගය ප්‍රමාණවත් නැහැ. ගරු අමාත්‍යතුමාගේ පැත්තෙනුත් ඉදිරිපත් වුණේ අපි ඉදිරිපත් කරන යෝජනා සම්බන්ධයෙන් කණගාටුවක් කියලා. ඒ නිසා මගේ ස්තුති කිරීම හමුවේ බලාපොරොත්තු වෙන්නේ මෙතෙක් කල සාරාංශය තමයි අපට ජාතික වැඩපිළිවෙලක් ඕන. ඒ ජාතික වැඩපිළිවෙලට අපි කවුරු කවුරුත් පොඩි පොඩි ජනෙල් කවුළු වලින් ඉවත් වෙලා ඇවිල්ලා ලොකු තිරයක් මේ ඔක්කෝම දේවල් දකිනවා. මේ සඳහා අපි විශ්වාස කරනවා පරිවතර්නිය වෙනසක් සඳහා මේ සියලුම අදහස් යෝජනා මතින් එවැනි කාර්‍ය භාරයක් වෙනුවෙන් හෙට දවසදි යම්කිසි ගුණාත්මක වැඩපිළිවෙලක් මේක තල්ලු වෙන්න අවශ්‍ය සහයෝගය තමයි සියලුම මහජන නියෝජිතයින්ගෙන් අපි ඉල්ලා සිටින්නේ. කන්න බැහැ කියයි, බත්ගුලි ලොකු වැඩියි කියයි, නින්ද නැහැ කියයි මගේ කවි තාලේ නැහැ කියයි. කවුද මේ කියන්නේ. තමන්ගේ බිරිද. මගේ කතාව ආරම්භ කරද්දි මම කිව්වේ ලක්ෂ 11 ක් ඉන්නේ මැද පෙරදිග. සින්න වෙන ඉඩම මට ගොඩගන්න බැහැ ඉතින්. යන්න නුඹ ගියා දරු සෙනෙ අරන්. ආර්ථික ප්‍රශ්න. මේ වේදනාවට පත්වූ පවුල් ජීවත් වෙන්නේ කොහොමද කියලා දන්නවා. දරුවෝ අඩනවා. තාත්තාගේ කවි වලට බත් කවන්න බැහැ. අම්මාගේ සෙනෙහස නැතිව ඒ කුඩා පවුල කැඩිලා ගිහිල්ලා. මේක තමයි උවමනාව. අන්තිමට මොකක්ද කියන්නේ. කන්න බැහැ කියයි, බත් ගුලි ලොකු වැඩියි කියයි, නින්ද නැහැ කියයි මගේ කවි තාලේ නැහැ කියයි. දරුවාට නිදා ගන්න බැහැ තාත්තාගේ උණුසුම ඇතුළේ. තාත්තා කොහොමද කියන්නේ. මටත් එහෙමමයි මගේ සිත ගැනලා තතු කියයි. බිරිඳ නැහැ. මේ සමාජය පුරුෂ මූලික සමාජයක්. ඇත්ත. පවුල රක්ෂණය කරන්නේ බිරිඳ.මටත් එහෙමමයි මගේ සිත ගැනලා තතු කියයි. හඬන සිත නිවන මල් පැණි නැතිව බැරි හැඩයි. ගරු සංස්කෘතික ඇමතිතුමනි, .“ හඬන සිත නිවන මල් පැණි නැතිව බැරි හැඩයි.“ කොහාටද යන්නේ. කලාව කියන්නේ ප්‍රවෘත්ති වලට කියන්න බැරි මහා දැවැන්ත කාර්‍ය භාරයක් සංනිවේදනයේදි ඉතා සියුම් ලෙස

සොදුරුතම ආනන්දයෙන් පටන් අරගෙන ප්‍රඥාවට යන්න පුළුවන් කියන්නේ ඒකයි. ඒ නිසා කලාවට කරන්න පුළුවන් කායර් භාරයක් කිසිම මාධ්‍යයකට කරන්න බැහැ. "හඬන සිත නිවන මල් පැණි නැතිව බැරි හැඩයි." බාර් එක ඇරලා තියෙන්න ඕන. ඊට පස්සේ තාත්තාගෙන් දූෂණය වෙන දරුවෝ ගැන කතා කරලා වැඩක් තියෙනවද. ආර්ථිකයත් එක්ක ගැට ගැහිලා තියෙන දේහය අපි විශ්වාස කරනවා මේක අපි ප්‍රශ්න කර ගනිමින් අතීත ශ්‍රී ලංකාව ලෝකය ඉස්සරහ ඒ සන්නාමය අපට නැවත ගන්න පුළුවන් වන විදියේ තැනකට හැම ක්ෂේත්‍රයකින්ම ඉහලට ආපු පරම්පරාවක් වෙනුවෙන් අපි විශ්වාස කරනවා වතර්මානයේ ඒ ප්‍රතිපත්ති ගරුක දැක්ම වැඩපිළිවෙල අපි ස්ථානගත කරමු. ඒ ඉලක්කය වෙනුවෙන් අපි විශ්වාස කරමු තැනක් දෙමු. අපි අවංකවම අපේ කොටස ඉටු කරමු. අවංක නොවී අපි විශ්වාස කරන තැන්වල ඉඳගෙන කවදාවත් මේක හදන්න බැහැ කියන එක ඔප්පු වෙලා තියෙනවා. අවුරුදු 10 ක් යුද්ධය අවසානයේ.මමත් හිතුවේ ඔය විදියටමයි මේ ප්‍රශ්නය මේ රටේ කියලා. යුද්ධය නොවේ ප්‍රශ්නය. යුද්ධය එක කොටසක් විතරයි. ප්‍රශ්නය බෙදවාවකයක් දක්වා ගමන් කරන නිසා. අද දවසේ මේ යෝජනාව පෝෂණය කරමින් අදහස් දක්වමින් කතා කල ගරු ඇමතිතුමාට විශේෂ ස්තුතියක් කරනවා. දැක්මක් සහිතව අපට තිබුණට වැඩපිළිවෙලක් ජාතික වශයෙන් අපි විශ්වාස කරනවා නිශ්චිත බරක් සහිතව මේ සියල්ලක්ගෙන්ම පෝෂණය වෙලා අපට ලැබුණොත් විතරයි සැහැල්ලු දේවල් සුළඟේ යනවා. බර දේවල් රැඳෙනවා.ඒ නිස අද දවසේ ඉඩ ලබාදීම සම්බන්ධයෙන් ඔබතුමාට ස්තුතිවන්ත වෙමින් මෙම යෝජනාව පල දරන යෝජනාවක් වශයෙන් හැම තැනටම මේ පණිවුඩය මම විශ්වාස කරනවා මාධ්‍ය වේදීන්ට ලොකු යුතුකමක්, වගකීමක් තියෙනවා මේ විශ්වාස කරන ප්‍රවෘත්ති අතරට අඩුම ගණනේ සංස්කෘතික වශයෙන් මේක වෙනස් කර ගන්න කායර් භාරයක් ජාතික රූපවාහිනිය ගත්තොත් එහෙම අපි විශ්වාස කරනවා ඉරිදාට යනවා ජාතික රූපවාහිනියේ සිහිනයකි රෑ. මේ වගේ නොයෙක් වැඩ සටහන් ගියා. යථාරූපී වැඩ සටහන ගියා. ඒක නතර වුණා. මම දන්නේ නැහැ මොකක්ද කියලා. ප්‍රඥාව, දැනුම ගණනය අන්න ඒ සඳහා අභාග්‍ය සම්පන්න ඉරණමෙන් අපි ඉන්න පසුගාමී සමාජයෙන් අත්මුදවලා දියුණුතම සමාජයක් කරා අපේ රට ගෙන යන්න අවශ්‍ය කරන දැනුම අවශ්‍ය අයට ඉඩකඩ ලබාදිය යුතුයි. ඒ සඳහා දැනුම, ශක්තියක් ලැබෙන්න ප්‍රාථර්නා කරමින් මගේ යෝජනාවේ ස්තුතිය හමාර කරනවා. බොහෝම ස්තුතියි.

සභාපතිතුමා:- අතුල වෙළඳගොඩ ගරු මන්ත්‍රීතුමා ඉදිරිපත් කල යෝජනාව පිළිබඳව කරුණු සාකච්ජා කළා. අවසානයේ මෙම යෝජනාව සභා සම්මත කිරීම සඳහා අවස්ථාව. ඒ සඳහා යෝජනාවට පක්ෂව ඡන්දය පාවිච්චි කරන්න. සියළුම ගරු මන්ත්‍රීතුවරු කැමැත්ත ප්‍රකාශ කරන ලදී. ඒ අනුව එම යෝජනාව එකච්ඡන්දයෙන් සභා සම්මත වූ බව ප්‍රකාශයට පත්කරනවා. අද දින සභාවේ කටයුතු කරගෙන යාම සඳහා සභාය දැක්වූ සියළු දෙනාටම මගේ ගෞරවණිය ස්තුතිය මේ අවස්ථාවේදි පුද කරනවා. මීලග සභා රැස්වීම මාතර්‍ මස 12 වන දින පෙ.ව. 9.30 දක්වා සභාව කල් තබමින් සභාවේ කටයුතු අවසන් කරනවා බොහෝම ස්තුතියි.

..........

සැ.යු.:- ස්වකීය කතාවල නිවැරදි කළයුතු තැන් දන්වනු රිසි ගරු මන්ත්‍රීවරුන් ලිඛිතව හෝ මීන් පිටපතක් ගෙන හෝ පැහැදිළිව දන්වා සතියක් ඇතුළත දකුණු පළාත් සභාවේ ලේකම් වෙත ලැබෙන සේ එවිය යුතු බව කරුණාවෙන් සැළකුව මැනවි.